# කාර්ය සාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# PERFORMANCE REPORT
# 2018

SRI LANKA
IMMIGRATION AND EMIGRATION








ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
குடிவரவு குடியகல்வுத் திணைக்களம்
**Department of Immigration & Emigration**

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

# කාර්යසාධන වාර්තාව - 2018

ප්‍රකාශනය
ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ අංශය
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
''සුහුරුපාය'', ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.

CM 30016 - 120 (2019/05) Dept. of Govt. Printing, Sri Lanka.



## ආගමන හා විගමන පාලක ජනරාල්වරයාගේ පණිවුඩය

ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලිය උදෙසා දෙස් විදෙස් ආයෝජන ප්‍රවර්ධනය කිරීම තුළින් ශ්‍රී ලංකාව ආසියාවේ ආර්ථික හා මූල්‍ය කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමේ අපේක්ෂාව පෙරදැරි කර ගත් "දැක්ම-2025" යන තේමාවෙන් යුතු රජයේ ප්‍රතිපත්තිය සමග ඉදිරියටම ගමන් කිරීමට ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සැලසුම් කර තිබේ. අප විසින් හඳුනාගෙන ඇති පරිදි, රජයේ සාර්ව මට්ටමේ ප්‍රතිපත්තියට අනුගතව මනාව සැලසුම් කළා වූත් සුරක්ෂිතවූත් අනවරත ප්‍රත්‍යන්ත කළමනාකරණ පද්ධතියක් පවත්වා ගැනීම දෙපාර්තමේන්තුව සතු වගකීමක් වන අතර වඩාත් ප්‍රතිඵල සහගත ක්ෂේත්‍රයන් ලෙස ගමන් බලපත්‍රයක් නිකුත් කිරීම තුළින් ශ්‍රී ලාංකිකයන්ට විදෙස් සංචාරයන් සඳහා පහසුකම් සැලසීමත්, ශ්‍රී ලාංකික පුරවැසිභාවයට අදාළ කටයුතු පාලනය කිරීමත්, නූතන ලෝකය තුළ භාවිතයේ ඇති ප්‍රමිතීන්ට අනුකූලව වත්මන් වීසා ක්‍රමවේදය වැඩි දියුණු කිරීමත් පෙන්වා දිය හැකිය. ජාතික ආදායමට රුපියල් මිලියන 17259 ක දායකත්වයක් ලබා දීමට 2018 වර්ෂය තුළදී අප ගනු ලැබූ ප්‍රයත්නයන් හමුවේ සැලකිය යුතු වර්ධනයක් අත්කර ගැනීමට හැකි වූ බව මෙහිලා සතුටින් සඳහන් කරමි.

2018 වසරේදී දෙපාර්තමේන්තුව අත්කරගත් කාර්ය සාධනයන් මෙම වාර්තාව මගින් ඉදිරිපත් කර ඇත. තවද, නව ආගාමික හා විගාමික පනත කෙටුම්පත් කිරීමට අදාළව සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගැනීමටත්, වත්මන් අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි වීසා ගාස්තු සංශෝධනය ඇතුළු ස්ථිර වාස වීසා ක්‍රමවේදය, ආයෝජන වීසා වසර 05 සිට 10 දක්වා දීර්ඝ කිරීම, රැකියා පිළිබඳ නව රෙගුලාසි හඳුන්වා දීමට කටයුතු කිරීම තුළින් වත්මන් වීසා ක්‍රමවේදයට සුවිශේෂී වෙනස්කම් හඳුන්වා දීමට හැකි විය. එසේම, තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් නවීකරණය කිරීමත්, ඒකාබද්ධ ප්‍රත්‍යන්ත පාලන කළමනාකරණ පද්ධතියේ කටයුතු ඇරඹීමත් මෙම වසර තුළදී සාක්ෂාත් කර ගත් සුවිශේෂී ජයග්‍රහණ ලෙස සඳහන් කළ හැකිය.

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ මෙකී කාර්යය හා කර්තව්‍යය සාක්ෂාත් කර ගැනීමට මඟපෙන්වූ ගරු අමාත්‍යතුමා, රාජ්‍ය අමාත්‍යතුමා, අමාත්‍යාංශ ලේකම්තුමා මෙන්ම අමාත්‍යාංශ නිලධාරීන්ද අපගේ සේවා සැපයීමේදී නන් අයුරින් සහාය වූ අනෙකුත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන ඇතුළු සියලුම රජයේ ආයතනවලටද සංක්‍රමණිකයින් සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය ඇතුළු සියලුම ජාත්‍යන්තර සංවිධානවලටද, පෞද්ගලික නියෝජිතායතනවලටද, සේවා හා පහසුකම් සපයන ආයතනවලටද, සියලුම සේවාලාභීන්ටද මාගේ හෘදයාංගම ස්තුතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කොට ගනිමි. එසේම දෙපාර්තමේන්තුවේ සාර්ථකත්වය පිටුපස මා සමග උරෙන් උර ගැටී සහාය පළ කරන දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන්ගේ සේවය අගය කිරීමටද මෙය අවස්ථාවක් කොට ගනිමි.

**එම්. එන්. රණසිංහ**
පාලක ජනරාල්
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
සුහුරුපාය
බත්තරමුල්ල.

# පටුන


- හැඳින්වීම 01
- කාර්ය මණ්ඩල තොරතුරු 02
- ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය 03

| | | |
|---|---|---|
| 01. | පාලන අංශය | 04 |
| 01.1 | පාලන ශාඛාව | 04 |
| 01.2 | පුහුණු හා සංවර්ධන ශාඛාව | 07 |
| 01.3 | ප්‍රසම්පාදන ශාඛාව | 12 |
| 01.4 | ඵලදායිතා ප්‍රවර්ධන ඒකකය | 13 |
| 02. | ගමන් බලපත්‍ර අංශය | 18 |
| 02.1 | ගමන් බලපත්‍ර ශාඛාව | 18 |
| 02.2 | ගමන් බලපත්‍ර සැකසීමේ ශාඛාව | 22 |
| 02.3 | ගමන් බලපත්‍ර සංශෝධන ශාඛාව | 23 |
| 02.4 | විදේශ දූත මණ්ඩල ශාඛාව | 25 |
| 02.5 | තැපැල් ශාඛාව | 28 |
| 03. | ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ අංශය | 30 |
| 03.1 | ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ ශාඛාව | 30 |
| 03.2 | ඉන්දු ලංකා පුරවැසි ශාඛාව | 31 |
| 03.3 | නීති ශාඛාව | 33 |
| 04. | වීසා හා ප්‍රත්‍යන්ත පාලන අංශය | 36 |
| 04.1 | වීසා ශාඛාව | 36 |
| 04.2 | තොටුපල ශාඛාව | 41 |
| 04.3 | විමර්ශන ශාඛාව | 54 |
| 04.4 | තැනැත්තන් වෙළඳාම තුරන් කිරීමේ ජාතික සම්පත් මධ්‍යස්ථානය | 62 |
| 05. | පුරවැසි අංශය | 64 |
| 06. | තොරතුරු තාක්ෂණ අංශය | 69 |
| 07. | ගිණුම් අංශය | 78 |
| 08. | අභ්‍යන්තර විගණන අංශය | 82 |
| 09. | සුභසාධන කටයුතු | 84 |

# ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
# කාර්ය සාධන වාර්තාව - 2018

## හැඳින්වීම

1948 අංක 20 දරණ ආගාමික හා විගාමික පනතෙහි විධිවිධාන අනුව ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන් ශ්‍රී ලංකාවට ඇතුල්වීම පාලනය කිරීම හා පිටවීම විධිමත් කිරීම සඳහාත්, ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන නොමනා තැනැත්තන් රටින් ඉවත් කිරීම සඳහාත්, කටයුතු කිරීමේ බලය ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සතුවේ. ශ්‍රී ලංකාවේ පුරවැසියන් සඳහා විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීම, විදේශයන්හි උපත ලබන ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ දරුවන් සඳහා මෙරට පුරවැසිභාවය ලබාදීම මෙන්ම ශ්‍රී ලාංකික පුරවැසිභාවය ඉල්ලුම් කරන ශ්‍රී ලාංකික නොවන තැනැත්තන් සඳහා මෙරට පුරවැසිභාවය ලබා දීම ද මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.

## දැක්ම

- කලාපයේ ප්‍රමුඛතම ආගමන හා විගමන සේවාව බවට පත්වීම

## මෙහෙවර

- ජාතික ආරක්ෂාව හා සමාජ හර පද්ධතිය සුරක්ෂිත කිරීම සහ ආර්ථික සංවර්ධනයට ඉඩ ප්‍රස්තා සලසමින්, රටින් බැහැරවන්නන් හා රටට ඇතුළුවන්නන් නියාමනය කිරීම හා පුරවැසි සේවා සැපයීම

## කාර්යභාරය

- ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීම හා ඊට අනුශාංගික කාර්යයන්
- විදේශිකයින් සඳහා වීසා බලපත්‍ර නිකුත් කිරීම හා ඊට අනුශාංගික කාර්යයන්
- ශ්‍රී ලාංකික පුරවැසිභාවය ප්‍රදානය කිරීමට අදාළ කටයුතු
- ප්‍රත්‍යන්ත පාලනය

## නෛතික අධිකාරිය

- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
- 1948 අංක 18 දරණ පුරවැසි පනත සහ ඊට අදාළ සංශෝධන
- 1948 අංක 20 දරණ ආගාමික හා විගාමික පනත සහ ඊට අදාළ සංශෝධන
- 1949 අංක 03 දරණ ඉන්දියානු හා පකිස්ථානු පදිංචිකරුවන්ගේ පුරවැසිභාවය පිළිබඳ පනත
- 1956 ආගාමික හා විගාමික නියෝග සහ ඊට අදාළ සංශෝධන
- 1967 අංක 14 දරණ ඉන්දු ලංකා ගිවිසුම ක්‍රියාවට නැංවීමේ පනත හා ඊට අදාළ සංශෝධන
- 1988 අංක 39 දරණ අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත
- 2003 අංක 35 දරණ ඉන්දියානු සම්භවයක් සහිත තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත
- ඉහත පනත් වලට අදාළ සියලුම රෙගුලාසි හා නියෝග
- ආගමන විගමන පාලක ජනරාල් විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ හා උපදෙස්

## කාර්ය මණ්ඩල තොරතුරු

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන විධායක නිලධාරියා මෙන්ම ගණන් දීමේ නිලධාරියා වශයෙන් පාලක ජනරාල්වරයා වෙත වගකීම පැවරෙන අතර ඔහුගේ මෙහෙයවීම හා අධීක්ෂණය යටතේ අතිරේක පාලක ජනරාල්වරයෙකු, පාලකවරුන් 05 දෙනෙකු, ප්‍රධාන ගණකාධිකාරිවරයෙකු හා ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයකු වෙත ඒ ඒ අංශවල වගකීම් පැවරී ඇත. 2018 වසරේ සමස්ත කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත සඳහන් වේ.

**අනුමත කාර්ය මණ්ඩලය (2018.12.31 දිනට)**

| තනතුර | සේවය | සේවා මට්ටම | අනුමත තනතුරු සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| ආගමන හා විගමන පාලක ජනරාල් | ශ්‍රී.ලං.ප.සේ. | ජ්‍යෙෂ්ඨ | 01 | 01 | 0 |
| අති. ආගමන විගමන පාලක ජනරාල් | ශ්‍රී.ලං.ප.සේ. | ජ්‍යෙෂ්ඨ | 01 | 01 | 0 |
| ආගමන විගමන පාලක | ශ්‍රී.ලං.ප.සේ. | ජ්‍යෙෂ්ඨ | 05 | 05 | 0 |
| ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ. | ජ්‍යෙෂ්ඨ | 01 | 01 | 0 |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී.ලං.ග.සේ. | ජ්‍යෙෂ්ඨ | 01 | 01 | 0 |
| නියෝජ්‍ය/සහකාර ආ.වි.පාලක | ශ්‍රී.ලං.ප.සේ. | ජ්‍යෙෂ්ඨ | 40 | 39 | 01 |
| නියෝජ්‍ය/සහකාර ආ.වි.පාලක | දෙපා. | ජ්‍යෙෂ්ඨ | 10 | 06 | 04 |
| ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ. | ජ්‍යෙෂ්ඨ | 02 | 02 | 0 |
| පරිපාලන නිලධාරී | රා.ක.ස.සේ. | තෘතීයික | 02 | 02 | 0 |
| ජ්‍යෙ.බලයලත් නිල.(දෙපා) | දෙපා. | තෘතීයික | 36 | 32 | 04 |
| බලයලත් නිලධාරී (දෙපා) | දෙපා. | තෘතීයික | 458 | 403 | 55 |
| භාෂා පරිවර්තක | භාෂා පරි.සේවය | තෘතීයික | 02 | 02 | 0 |
| පුහුණු කළමනාකරු | ආශ්‍රිත සේවා | ද්විතීය | 01 | 01 | 0 |
| අයවැය සහකාර | ආශ්‍රිත සේවා | ද්විතීය | 01 | 01 | 0 |
| සංවර්ධන නිලධාරී | සං.නිල.සේවය | ද්විතීය | 20 | 20 | 0 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.ක.ස.සේ. | ද්විතීය | 378 | 367 | 11 |
| ගමන් බලපත්‍ර සහායක | දෙපා. | ද්විතීය | 35 | 31 | 04 |
| මෙහෙයුම් සහකාර | දෙපා. | ද්විතීය | 50 | 0 | 50 |
| පිළිගැනීමේ නිලධාරී (දෙපා.) | දෙපා. | ද්විතීය | 01 | 01 | 0 |
| නියාමක | දෙපා. | ද්විතීය | 03 | 02 | 01 |
| රියදුරු | රියදුරු සේවය | ප්‍රාථමික | 32 | 30 | 02 |
| විවේකාගාර සහායක | දෙපා. | ප්‍රාථමික | 06 | 0 | 06 |
| කාර්යාල කාර්ය සහායක | කා.සේ.සේ. | ප්‍රාථමික | 107 | 107 | 0 |
| කම්කරු පුහුණුවන | අනියම් | ප්‍රාථමික | 10 | 10 | 0 |
| එකතුව | | | 1203 | 1065 | 138 |

# ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය



# 01. පාලන අංශය

පාලක (පාලන) ගේ අධීක්ෂණය යටතේ දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය පරිපාලනය, මානව සම්පත් කළමනාකරණය, දෙපාර්තමේන්තුව සතු වාහන පරිහරණය කළමනාකරණය, නඩත්තු කටයුතු, පුහුණු හා සංවර්ධන කටයුතු සහ ප්‍රසම්පාදන කටයුතු මෙම අංශය යටතේ ක්‍රියාත්මක වේ.

## 01 : 1 පාලන ශාඛාව

**කාර්ය මණ්ඩලය - 2018**

| තනතුර / සේවාව | සංඛ්‍යාව |
|---|---|
| පාලක | 01 |
| සහකාර පාලක | 02 |
| පරිපාලන නිලධාරි | 01 |
| භාෂා පරිවර්තක | 02 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 26 |
| කාර්යාල කාර්ය සහායක | 06 |
| රියදුරු | 30 |
| කම්කරු (පුහුණු වන) | 02 |

### 1. ආයතනික කටයුතු

1.1 බඳවා ගැනීම

<u>බලයලත් නිලධාරීන් බඳවා ගැනීම</u>

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරීන් බඳවා ගැනීමේ සීමිත තරග විභාගයේ ප්‍රතිඵල අනුව 2018.05.21 දින සම්මුඛ පරීක්ෂණ පවත්වා 2018.08.20 දින සිට ක්‍රියාත්මක වන පරිදි බලයලත් නිලධාරී තනතුරු 21ක් සඳහා පත්වීම් ලබාදෙන ලදී. එමෙන්ම, විවෘත තරග විභාගයේ ප්‍රතිඵල අනුව 2018.07.16 හා 2018.07.18 දෙදින සම්මුඛ පරීක්ෂණ පවත්වා 2018.08.20 දින සිට ක්‍රියාත්මක වන පරිදි බලයලත් නිලධාරී තනතුරු 92ක් සඳහා පත්වීම් ලබාදෙන ලදී.

විවෘත පදනමින් පත්වීම්ලද පත්වීම්ලාභීන් 18 දෙනෙකු, පත්වීම් භාර නොගැනීම නිසා 2018.09.10 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔවුන්ගේ පත්වීම් අවලංගු කරන ලද අතර එසේ අවලංගු කරන ලද පත්වීම් 18 සඳහා ප්‍රතිඵල ලේඛනය හා සම්මුඛ පරීක්ෂණ ලේඛන පදනම් කරගෙන නැවත විවෘත පදනමින් පත්වීම් 18 ක් 2018.11.26 දින සිට ක්‍රියාත්මක වන පරිදි ලබා දෙන ලදී.





1.2 උසස් කිරීම්

| තනතුර | සංඛ්‍යාව | උසස්වීම ලද තනතුර |
|---|---|---|
| ශ්‍රී ලංකා පරිපාලන සේවය II පන්තිය | 03 | ශ්‍රී ලංකා පරිපාලන සේවය I පන්තිය |
| ශ්‍රී ලංකා පරිපාලන සේවය III පන්තිය | 03 | ශ්‍රී ලංකා පරිපාලන සේවය II පන්තිය |
| ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය III පන්තිය | 01 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය II පන්තිය |
| ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරී | 05 | සහකාර පාලක (දෙපාර්තමේන්තුමය) |
| බලයලත් නිලධාරී | 26 | ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරී |
| ගමන් බලපත් සහායක II පන්තිය | 28 | ගමන් බලපත් සහායක I පන්තිය |
| රාජ්‍ය කළමනාකරණ සහකාර II පන්තිය | 07 | රාජ්‍ය කළමනාකරණ සහකාර I පන්තිය |
| රාජ්‍ය කළමනාකරණ සහකාර III පන්තිය | 03 | රාජ්‍ය කළමනාකරණ සහකාර II පන්තිය |
| කාර්යාල සේවක සේවය III ශ්‍රේණිය | 05 | රාජ්‍ය කළමනාකරණ සහකාර III පන්තිය |
| කාර්යාල සේවක සේවය III ශ්‍රේණිය | 01 | කාර්යාල සේවක සේවය II ශ්‍රේණිය |
| රියදුරු II ශ්‍රේණිය | 02 | රියදුරු I ශ්‍රේණිය |

1.3 සේවයේ ස්ථිර කිරීම්

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| බලයලත් නිලධාරීන් | 28 |
| සංවර්ධන නිලධාරීන් | 03 |
| කළමනාකරණ සහකාර III ශ්‍රේණියේ නිලධාරීන් | 03 |

1.4 කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්ෂණ

- සහකාර පාලක (දෙපාර්තමේන්තුගත) නිලධාරීන් සඳහා වන කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්ෂණය 2018.09.29 හා 2018.09.30 දින වලදී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පැවැත් වූ අතර 2018.10.26 දින ප්‍රතිඵල නිකුත් කර ඇත.
- බලයලත් නිලධාරීන්ගේ 2017 වර්ෂය සඳහා වන කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණය 2018.08.18 දින පවත්වන ලද අතර එම පරීක්ෂණයේ ප්‍රතිඵල 2018.08.24 දින නිකුත් කර ඇත.
- බලයලත් නිලධාරීන්ගේ 2018 වර්ෂය සඳහා වන කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා 2018.11.29 දින සිට 2018.12.26 දින දක්වා අයදුම්පත් කැඳවා ඇත.
- රියදුරු සේවයේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2018.12.19 දින පැවති අතර, එම පරීක්ෂණයේ ප්‍රතිඵල නිකුත් කරන ලදී.
- කාර්යාල කාර්ය සේවයේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2018.11.28 දින පැවති අතර එම පරීක්ෂණයේ ප්‍රතිඵල එදිනම නිකුත් කරන ලදි.

1.5 ස්ථාන මාරු

| තනතුර | පැමිණි නිලධාරී සංඛ්‍යාව | ස්ථාන මාරුවී ගිය නිලධාරී සංඛ්‍යාව |
|---|---|---|
| ශ්‍රී ලංකා පරිපාලන සේවය | 06 | 04 |
| ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 04 | 04 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර අධි පන්තිය | 02 | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර I | 38 | 27 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර II | 18 | 08 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර III | 30 | 06 |
| ඒකාබද්ධ රියදුරු සේවය | 07 | 03 |
| කාර්යාල සේවක සේවය | 28 | 28 |

1.6 විනය කටයුතු

- ආරම්භ කර ඇති මූලික විමර්ශන සංඛ්‍යාව - 24
- මූලික විමර්ශන අවසන් කර ඉදිරි කටයුතු සිදුකරමින් පවතින ගොනු සංඛ්‍යාව - 17

1.7 විශ්‍රාම ගැන්වීම්

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 02 |
| සහකාර පාලක (දෙපාර්තමේන්තුමය) | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර I | 10 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර II | 05 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර III | 01 |
| ඒකාබද්ධ රියදුරු සේවය | 03 |
| කාර්යාල සේවක සේවය | 01 |

1.8 සේවය හැරයාම්

- ඒකාබද්ධ රියදුරු සේවය - 01

1.9 විශේෂිත කාර්යයන් - කාර්ය මණ්ඩල අභිප්‍රේරණය

දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය අභිප්‍රේරණය කිරීමේ පියවරක් ලෙස 2018 වසරේ කාර්ය සාධනය පදනම් කරගෙන විශිෂ්ට නිලධාරීන් සඳහා ප්‍රශංසා, සහතික සහ සම්මාන පිරිනමන ලදි. එක්එක් සේවා ඛණ්ඩ අනුව විශිෂ්ට නිලධාරීන් ලෙස තෝරා ගන්නා ලද නිලධාරී සංඛ්‍යාව පහත සඳහන් වේ.

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරී | 01 |
| බලයලත් නිලධාරී | 06 |
| ගමන් බලපත් සහායක | 01 |
| කළමණාකරන සහකාර | 10 |
| කාර්යාල කාර්ය සහායක | 03 |
| සංවර්ධන නිලධාරී | 01 |
| රියදුරු | 01 |





## 01 : 2 පුහුණු හා සංවර්ධන ශාඛාව

පාලක (පාලන) ගේ අධීක්ෂණය යටතේ මෙම ශාඛාව ක්‍රියාත්මක වේ.

දෙපාර්තමේන්තුවේ සමස්ත අරමුණු ඉටු කරගැනීම සඳහා දායකත්වය ලබා දෙන කාර්යමණ්ඩලයේ කාර්යසාධනය හා අභිප්‍රේරණය ඉහල නැංවීම සහ ප්‍රශස්ත මහජන සේවාවක් ලබා දීමේදී ඒ සඳහා වන විවිධ ක්‍රියාකාරකම් හඳුනාගැනීමට හා ක්‍රියාත්මක කිරීමට සහාය දැක්වීම, පුහුණු හා සංවර්ධන ශාඛාවේ අරමුණ වේ.

ඒ අනුව දෙපාර්තමේන්තුවේ සමස්ථ ක්‍රියාවලිය ගුණාත්මක හා ප්‍රමාණාත්මක වර්ධණීය ප්‍රවේශයක් වෙත මෙහෙයවීම පිණිස දෙපාර්තමේන්තුවට අනුයුක්ත සියලුම නිලධාරීන්ගේ දැණුම, කුසලතා හා ආකල්ප වර්ධනය කිරීම සඳහා පුහුණු අවශ්‍යතා හඳුනාගෙන ඊට ගැලපෙන පරිදි මානව සම්පත් සංවර්ධන වැඩසටහන්

- සැළසුම් කිරීම
- සංවිධානය කිරීම
- ක්‍රියාත්මක කිරීම
- අනෙකුත් ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම
- විදේශීය පුහුණුවීම් අවස්ථාවන් හඳුනාගනිමින් ඊට අදාළ ක්‍රියා මාර්ග ගැනීම
- පුහුණු හා සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා වාර්ෂික ප්‍රතිපාදනයන්ට අමතරව බාහිර ආයතන හා තානාපති කාර්යාල හා ජාත්‍යන්තර සංවිධාන හරහා කාර්ය මණ්ඩලයට පුහුණුවීම් අවස්ථාවන් හඳුනාගනිමින් ඒ අදාල කාර්යයන් ඉටු කිරීම පුහුණු හා සංවර්ධන ශාඛාව මඟින් සිදු කරනු ලබයි.

**කාර්ය මණ්ඩලය - 2018**

| තනතුර / සේවාව | සංඛ්‍යාව |
|---|---|
| පුහුණු කළමනාකරු | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 |
| කාර්යාල කාර්ය සහායක | 02 |

2018 වර්ෂය තුලදී ක්‍රියාත්මක කරන ලද පුහුණු වැඩ සටහන් වල සාරාංශයක් පහත සඳහන් වේ.

| අනු අංකය | පැවැත් වූ දින | වැඩ සටහන් විස්තරය | සහභාගී වූ නිලධාරීන් | ස්ථානය |
|---|---|---|---|---|
| 1 | 2018.01.05 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | කළමනාකරණ සහකාර නිලධාරීන් | දේශන ශාලාව 1 |
| 2 | 2018.01.09- 10 | මිනිස් ජාවාරම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | විධායක නිලධාරීන් | ශ්‍රවණාගාරය |
| 3 | 2018.01.11 | ලේඛන හඳුනා ගැනීම හා ප්‍රතිරූපක හඳුනා ගැනීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන (Awareness Programme on Document Identification and imposter Detection) | විධායක නිලධාරීන්/ බලයලත් නිලධාරීන් | ශ්‍රවණාගාරය |
| 4 | 2018.01.13 -14 | රියදුරු සේවා කුසලතා ප්‍රවර්ධන වැඩසටහන - 2018 | රියදුරු කාර්ය මණ්ඩලය | අතුරුගිරිය ජාතික වැවිලි කළමනාකරණ ආයතනය |

| අනු අංකය | පැවැත් වූ දින | වැඩ සටහන් විස්තරය | සහභාගී වූ නිලධාරීන් | ස්ථානය |
|---|---|---|---|---|
| 5 | 2018.01.25, 26,27 (3 days) | ඉහල වගකීම් සඳහා කාර්යාල කාර්ය සහයකයින්ගේ කාර්යභාරය හා වගකීම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | කාර්යාල කාර්ය සහායක නිලධාරීන් | ශ්‍රවණාගාරය |
| 6 | 2018.01.30 | විදේශ ගමන් බලපත්‍ර පිළිබඳ දැනුවත්කිරීමේ වැඩසටහන | නාවික නිලධාරීන් | ශ්‍රවණාගාරය |
| 7 | 2018.01.29-02.09 (10 Days) | පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන | කාර්ය මණ්ඩල නිලධාරීන් | පරිගණක විද්‍යාගාරය |
| 8 | 2018.02.21 | ආහාර විෂවීම / දියවැඩියාව , පිළිකා වැලදීමේ ප්‍රවනතාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | කාර්ය මණ්ඩල නිලධාරීන් | ශ්‍රවණාගාරය |
| 9 | 2018.03.05 -09 (5 Days) | සේවක අනුස්ථාපන වැඩසටහන | නවක කාර්ය මණ්ඩල නිලධාරීන් | ශ්‍රවණාගාරය |
| 10 | 2018.03.05-09 (5 Days) | මුහුණෙහි ඉරියව් හඳුනා ගැනීම පිළිබඳ වැඩසටහන (Advance Facial Image Recognition) | බලයලත් නිලධාරීන් | ගාලු මුවදොර හෝටලය |
| 11 | 2018.03.05-03.16 (10 Days) | ඉලක්ක කණ්ඩායම් හඳුනාගැනීම පිළිබඳ පුහුණුව (Training on Targeting) | සහකාර පාලක/ ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරීන්/ බලයලත් නිලධාරීන් | පරිගණක විද්‍යාගාරය |
| 12 | 2018.03.06 | ඉංග්‍රීසි භාෂා පාඨමාලාව | කාර්ය මණ්ඩල නිලධාරීන් විධායක නිලධාරීන් | දේශන ශාලාව 1 |
| 13 | 2018.03.12 | කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල ක්ෂේත්‍ර අධ්‍යන චාරිකාව | නවක කාර්ය මණ්ඩල නිලධාරීන් | කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල |
| 14 | 2018.03.22 | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ විභාග පංති | කළමනාකරණ සහකාර සේවා විභාග අයදුම්කරුවන් | දේශන ශාලාව 1 |
| 15 | 2018.04.04 | ගමන් බලපත්‍ර පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | ගමන් බලපත් අංශයට අනුයුක්ත මාණ්ඩලික නිලධාරීන් | ශ්‍රවණාගාරය |
| 16 | 2018.04.05 | ගුවන් විදුලි රසාස්වාදන වැඩසටහන | කාර්ය මණ්ඩලය | ශ්‍රවණාගාරය |
| 17 | 2018.04.18 | ජාත්‍යන්තර පොලීසිය - මිනිස් ජාවාරම් වලක්වාලීම පිළිබඳ පුහුණුව (Interpol Hammer Counter Imagining Project Relay Training) | සහකාර පාලක/ ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරීන්/ බලයලත් නිලධාරීන් | ගුවන් තොටුපල ශ්‍රවණාගාරය |
| 18 | 2018.05.09 | ජාතික හැඳුනුම්පත් නිවැරදිව හඳුනාගැනීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | විධායක නිලධාරීන් | ශ්‍රවණාගාරය |
| 19 | 2018.05.14 - 25 | විමර්ශන පුහුණු වැඩසටහන | බලයලත් නිලධාරීන් | පරිගණක විද්‍යාගාරය |
| 20 | 2018.05.16 | ආගමන විගමන කාර්යය භාරයෙන් ඔබ්බට ඇති කාර්යයන් (Beyond the duties of Department of Immigration & Emigration) | බලයලත් නිලධාරීන් | පරිගණක විද්‍යාගාරය |
| 21 | 2018.05.24 | ජන හා සංඛ්‍යා ලේඛන දත්ත හා තොරතුරු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | විධායක නිලධාරීන් / ප්‍රධාන කළමනාකරණ සහකාර | ශ්‍රවණාගාරය |

| අනු අංකය | පැවැත් වූ දින | වැඩ සටහන් විස්තරය | සහභාගී වූ නිලධාරීන් | ස්ථානය |
|---|---|---|---|---|
| **22** | 2018.05.30 | සේවක අනුස්ථාපන වැඩසටහන | නවක කාර්ය මණ්ඩල නිලධාරීන් | ශ්‍රවණාගාරය |
| **23** | 2018.05.31-06.01 | ප්‍රසම්පාදනය පිළිබඳ පුහුණුව | කළමනාකරණ සහකාර | නිපුණතා සංවර්ධන අරමුදල |
| **24** | 2018.06.01 | කොළඹ ජාත්‍යන්තර පාසලේ සහතිකපත් ප්‍රධානෝත්සවය | කාර්ය මණ්ඩලය | ශ්‍රවණාගාරය |
| **25** | 2018.06.01 | මූලික විමර්ශන පිළිබඳ එක් දින වැඩමුළුව | පරිපාලන නිලධාරි | ජාතික ශ්‍රම අධ්‍යන ආයතනය |
| **26** | 2018.06.07 | කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල ක්ෂේත්‍ර අධ්‍යන චාරිකාව | නවක කාර්ය මණ්ඩල නිලධාරීන් | කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල |
| **27** | 2018.06.12 | ගිණි ආරක්ෂණ පෙර පුහුණු වැඩසටහන | කාර්ය මණ්ඩලය | ශ්‍රවණාගාරය |
| **28** | 2018.06.19 | දෙමළ භාෂා කථන පුහුණු පාඨමාලාව | කාර්ය මණ්ඩලය | දේශන ශාලාව 1 |
| **29** | 2018.06.28-29 | රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණනය පිළිබඳ වැඩමුළුව | ආර්.ඩබ්.එස්.ආර්. විතාරණ එස්.ඒ.ජී.ජී.සුදසිංහ | ජාතික ශ්‍රම අධ්‍යන ආයතනය |
| **30** | 2018.7.11 | පැය 50 දෙමළ පාඨමාලාව | ප්‍රාථමික ශ්‍රේණියේ නිළධාරීන් | දේශන ශාලාව 1 |
| **31** | 2018.07.25 | සමාජීය සහජීවනය හා ආත්ම සංවර්ධනය අරමුණු කරගෙන විශේෂ දැනුවත් කිරීමේ කෙටි දේශනය | කාර්ය මණ්ඩලය | ශ්‍රවණාගාරය |
| **32** | 2018.7.25 | දෙමළ අවසාන පරීක්ෂණය | රියදුරන් | දේශන ශාලාව 1 |
| **33** | 2018.20-31 | සේවාරම්භක පුහුණුව (Induction Training) | නවක බලයලත් නිලධාරීන් | පොලිස් අභ්‍යාස විද්‍යාලය කළුතර |
| **34** | 2018.09.09 | රාජ්‍ය සේවයේ නව ප්‍රවනතා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | සියළු නිලධාරීන් සඳහා | ශ්‍රවණාගාරය |
| **35** | 2018.09.11 | සේවාලාභි සත්කාරය | සියළු නිලධාරීන් සඳහා | සුහුරුපාය ශ්‍රවණාගාරය |
| **36** | 2018.09.14-2018.09.15 | ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ ප්‍රගති සමාලෝචනය හා වැඩි දියුණු කිරීමේ වැඩසටහන - 2018 (Work shop on procurement Procedure progress review of the year 2018 Enhancement project) | විධායක නිලධාරීන් | සිට්‍රස් හෝටලය හික්කඩුව (Citrus Hotel) |
| **37** | 2018.09.20-2018.09.21 | වැටුප් පරිවර්තනය සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන | කළමණාකරන සහකාර | නිපුණතා සංවර්ධන අරමුදල |
| **38** | 2018.09.25 – 2018.10.05 | කැනේඩියානු පුහුණුකරුවන් විසින් පවත්වන ලද විමර්ශන වැඩසටහන (Investigation Programme – Conducted by Canadian Trainers) | බලයලත් නිලධාරීන් | දේශන ශාලාව 1 |
| **39** | 2018.10.02 2018.10.09 2018.10.16 | කළමණාකරණ කුසලතා පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | කළමණාකරන සහකාර | ජාතික ශ්‍රම අධ්‍යන ආයතනය |
| **40** | 2018.10.22-2018.10.23 | ආගමනය පිළිබඳ ජාත්‍යන්තර පොලීසියේ කාර්යභාරය (Role with Interpol Immigration ) | විධායක නිලධාරීන් | Cinnamon Grand හෝටලය |
| **41** | 2018.10.25-2018.10.26 | ආගමනය පිළිබඳ ජාත්‍යන්තර පොලීසියේ කාර්යභාරය (Role with Interpol Immigration ) | බලයලත් නිලධාරීන් | Cinnamon Grand හෝටලය |

| අනු අංකය | පැවැත් වූ දින | වැඩ සටහන් විස්තරය | සහභාගී වූ නිලධාරීන් | ස්ථානය |
|---|---|---|---|---|
| **42** | 2018.10.04/11/ 18/25 | පැය 50 දෙමළ පාඨමාලාව | රියදුරන් සඳහා | දේශන ශාලාව 1 |
| **43** | 2018.10.04/11/ 18/25 | පැය 50 දෙමළ පාඨමාලාව | ප්‍රාථමික ශ්‍රේණියේ නිළධාරී සඳහා | දේශන ශාලාව 1 |
| **44** | 2018.11.08 | ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන | බලයලත් නිලධාරීන් සඳහා | ශ්‍රවණාගාරය |
| **45** | 2018.11.01<br>2018.11.08<br>2018.11.15 | ප්‍රාථමික ශ්‍රේණියේ නිළධාරීන් සඳහා පැය 50 දෙමළ පාඨමාලාව- පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සහ සම්බන්ධව | ප්‍රාථමික ශ්‍රේණියේ නිළධාරීන් සඳහා | දේශන ශාලාව 1 |
| **46** | 2018.11.01<br>2018.11.08<br>2018.11.15<br>2018.11.29 | ප්‍රාථමික ශ්‍රේණියේ නිළධාරීන් සඳහා පැය 50 දෙමළ පාඨමාලාව (රියදුරන් සඳහා) | රියදුරන් සඳහා | දේශන ශාලාව 2 |
| **47** | 2018.11.12 | ගමන් බලපත්‍ර පිළිබඳ දැනුවත්කිරීමේ වැඩසටහන | සහකාර පාලකවරු | දේශන ශාලාව 1 |
| **48** | 2018.11.14 | කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල ක්ෂේත්‍ර අධ්‍යන චාරිකාව | දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය සඳහා | කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල |
| **49** | 2018.11.16 | ගිණි ආරක්ෂණ පුහුණු වැඩසටහන | 3 වන මහල කාර්ය මණ්ඩලය | ශ්‍රවණාගාරය |
| **50** | 2018.11.17 | Workshop on Investigation SOP | විධායක නිලධාරීන් | ගාලු මුවදොර හෝටලය |
| **51** | 2018.11.19-<br>2018.11.23 | දේශ සීමා පාලන පද්ධතියට සම්බන්ධ නව පද්ධති ක්‍රියාකාරකම් පිළිබඳ පුහුණු සැසිය (Training Sessions on New System Functions Incorporated in to the Border Control System | විධායක නිලධාරීන් / බලයලත් නිලධාරීන් | ශ්‍රවණාගාරය |
| **52** | 2018.11.26 -30 | නායකත්ව හා කළමනාකරණ සංවර්ධන වැඩසටහන | විධායක නිලධාරීන් | Moven Pick හෝටලය |
| **53** | 2018.11.26 –<br>2018.12.07 | සේවාරම්භක පුහුණුව | නවක බලයලත් නිලධාරීන් | දේශන ශාලාව 1 |
| **54** | 2018.12.05 | කැනේඩියානු පුහුණුකරුවන් විසින් පවත්වන ලද විශේෂ රැස්වීම | විධායක නිලධාරීන් | ශ්‍රවණාගාරය |
| **55** | 2018.12.10 | ගිණි ආරක්ෂණ පුහුණු වැඩසටහන | 5 වන සහ 6 වන මහල් කාර්ය මණ්ඩලය | ශ්‍රවණාගාරය |
| **56** | 2018.12.12<br>2018.12.19<br>2018.12.26 | චීන භාෂා පාඨමාලාව | බලයලත් නිලධාරීන් | දේශන ශාලාව 1 |
| **57** | 2018.12.18 | කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල ක්ෂේත්‍ර අධ්‍යන චාරිකාව | දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය සඳහා | කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල |
| **58** | 2018.12.28 | දෙමළ භාෂා සහතිකපත් ප්‍රධානෝත්සවය | ප්‍රාථමික ශ්‍රේණියේ නිළධාරීන් | ශ්‍රවණාගාරය |

ඉහත පුහුණු වැඩසටහන් වලට අමතරව නාවික හමුදා නිලධාරීන්,පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් හා බාහිර ආයතන වලින් ලද ඉල්ලීම් වලට අනුව මෙම දෙපාර්තමේන්තුවේ ක්‍රියාවලිය හා ආශ්‍රිත විෂයන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් කිහිපයක්ම මෙම වසර තුළ සාර්ථකව නිම කිරීමට හැකිවිය.





කැනේඩියානු පුහුණුකරුවන් විසින් පවත්වන ලද නායකත්ව හා කළමණාකරන සංවර්ධන වැඩසටහන - 2018.11.26 -30



ගුණාත්මක රාජ්‍ය සේවයක් සඳහා සේවාලාභි සත්කාරය - 2018.09.11





නවක බලයලත් නිලධාරීන් සඳහා පැවති සේවාරම්භක පුහුණුව - පොලිස් අභ්‍යාස විද්‍යාලය, කළුතර -2018.08.20 – 2018.08.31

## 01 : 3 ප්‍රසම්පාදන ශාඛාව

දෙපාර්තමේන්තුවට අදාල සියළුම ප්‍රසම්පාදන කටයුතු ඉටුකරනු ලබන්නේ මෙම ශාඛාව විසිනි. මෙම දෙපාර්තමේන්තුවට වාර්ෂිකව අවශ්‍ය කරන භාණ්ඩ හා සේවාවන් නිවැරදිව හා විනිවිදභාවයෙන් යුතුව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය හා ඊට අදාල නීති රීති අනුගමනය කරමින් ප්‍රසම්පාදනය කිරීම මෙම ශාඛාවේ අරමුණ වේ.

මෙම ශාඛාවේ කාර්යභාරය පහත සඳහන් පරිදි වේ.

- සෑම වර්ෂයක් ආරම්භයේදීම එම වර්ෂයට අදාලව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.
- ඉහත ප්‍රසම්පාදන සැලැස්මට අනුව මිලදී ගත යුතු භාණ්ඩ, යන්ත්‍රෝපකරණ හා සේවාවන් ප්‍රසම්පාදනය කිරීමට අදාල කටයුතු ඉටුකිරීම.
- සියළුම සේවා ගිවිසුම් යාවත්කාලීන කිරීම (ආරක්‍ෂක සේවා,පවිත්‍රතා සේවා,යන්ත්‍රෝපකරණ නඩත්තු සේවා වැනි)
- හිස් ගමන් බලපත්‍ර ආනයනය කිරීමට ආදාල ප්‍රසම්පාදන කටයුතු ඉටු කිරීම.
- දෙපාර්තමේන්තුවේ පරිගණකගත තොරතුරු පද්ධතිය යාවත්කාලීන කිරීමට හා නවීකරණය කිරීමට අදාල කටයුතු.

**2018 වර්ෂයේ ප්‍රසම්පාදන ශාඛාවේ කාර්ය මණ්ඩලය**

| තනතුර / සේවාව | සංඛ්‍යාව |
|---|---|
| සහකාර පාලක (ප්‍රසම්පාදන) | 01 |
| සංවර්ධන නිලධාරි | 02 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 |
| කාර්යාල කාර්යය සහායක | 01 |

**2018 වර්ෂය තුළ ප්‍රසම්පාදනය කරන ලද භාණ්ඩ හා සේවා වල වටිනාකම**

| ප්‍රසම්පාදනය කරන ලද භාණ්ඩ හා සේවා සහ වැඩ | භාණ්ඩවල වටිනාකම (රු.) |
|---|---|
| කටුනායක නිලධාරී නේවාසිකාගාරය අළුත්වැඩියාව | 9,571,857.42 |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 1,978,750.00 |
| කාර්යාලයීය උපකරණ හා ගෘහ භාණ්ඩ | 4,020,406.05 |
| ස්ටිකර් මුද්‍රණ යන්ත්‍ර | 2,236,000.00 |
| පරිගණක පද්ධතියට අදාළ උපකරණ | 11,205,496.40 |
| ගමන් බලපත් කියවීමේ යන්ත්‍ර | 16,138,728.09 |
| ලැමිනේටර් යන්ත්‍ර හා මුද්‍රණ යන්ත්‍ර | 4,757,999.99 |
| පරිලෝකන යන්ත්‍ර | 1,875,000.00 |
| සර්වර් සඳහා විදුලි ජේනු මිලදී ගැනීම | 4,700,000.00 |
| පද්ධති මෘදුකාංග සංවර්ධනය ( Oracle Internet application) | 37,597,344.50 |
| වර්තමාන වීසා නිකුත් කිරීමේ මොඩියුලය වෙනස් කිරීම | 7,700,000.00 |
| Upgrade & enhancing Front End Application | 66,500,000.00 |
| මාර්ගස්ථ වීසා දිගු කිරීමේ ක්‍රමවේදය සංවර්ධනය කිරීම | 27,965,000.00 |
| පරිගණක දත්ත මධ්‍යස්ථානයේ ගිනි ආරක්ෂණ කටයුතු | 8,616,125.58 |
| හිස් ගමන් බලපත් සහ ඊට අදාළ මුද්‍රණ කටයුතු සඳහා තීන්ත | 832,421,116.70 |
| ද්විත්ව පුරවැසි සහතික පත්‍ර ප්‍රදානය කිරීමේ උත්සව සංවිධාන කටයුතු | 827,717.00 |
| **එකතුව** | **1,038,111,541.73** |

# 01 : 4 ඵලදායිතා ප්‍රවර්ධන ඒකකය

විශිෂ්ටතම සේවාවක් ලබාදෙන ආයතනයක් ලෙස වසර ගණනාවක් අඛණ්ඩව සම්මානයන්ගෙන් ඇගයීමට ලක්ව ඇති මෙම දෙපාර්තමේන්තුවේ සේවාවන් තවදුරටත් කාර්යක්ෂමව හා සඵලදායීව පවත්වා ගැනීමේ අරමුණින් 2017 වර්ෂයේදී මෙම ඒකකය ස්ථාපිත කරන ලදී.

**අරමුණ :**

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සේවාවන් කාර්යක්ෂමව ඉටු කිරීමට, වැඩිදියුණු කිරීමට සහාය වීම.

**කාර්ය මණ්ඩලය - 2018**

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| සංවර්ධන නිලධාරි | 1 |

**සිදුකරන ලද කාර්යයන්**

- 2018 වර්ෂය සඳහා වූ ජාතික ඵලදායිතා සම්මාන තරගාවලියේ අන්තර් දෙපාර්තමේන්තුමය අංශයෙන් දෙවන ස්ථානය ලබා ගැනීමට අදාළව අයදුම් කිරීමේ සිට එම තරඟාවලියේ විනිශ්චය මණ්ඩලය පැමිණීම දක්වා සියලු කටයුතු සංවිධානය කිරීම හා සම්බන්ධීකරණය කිරීම.

- දෙපාර්තමේන්තුවේ සේවාවන් කාර්යක්ෂමව සිදු කිරීමට හා වැඩිදියුණු කිරීමට අදාළව අභ්‍යන්තර විගණනයක් සිදුකොට එහි ප්‍රතිඵල අනුව අංශවල සිදු කළ යුතු වැඩිදියුණු කිරීම් පිළිබඳ සියළු අංශ දැනුවත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

පියස පරිශ්‍රය තුළ ප්‍රදර්ශන පුවරු සකස් කිරීම






- නවක කාර්ය මණ්ඩලය සඳහා පුහුණු අංශය හා අනුබද්ධිතව පුහුණු වැඩසටහන් 02 ක් ක්‍රියාත්මක කිරීම.

- ආසියානු ඵලදායීතා සංවිධානය හා ජාතික ඵලදායීතා ලේකම් කාර්යාලය ඒකාබද්ධව “Innovative and Strategic Leadership for Enhancing Public Sector Productivity“ යන මාතෘකාව යටතේ මෙහෙයවන ලද වැඩසටහනෙහි අප දෙපාර්තමේන්තුවේ විශිෂ්ට අත්දැකීම් හුවමාරුව සඳහා වූ වැඩසටහන ක්‍රියාක්මක කිරීම.







- සියළු අංශ නියෝජනය වන පරිදි තත්වකව යාවත්කාලීන කිරීම ,සරප් අංශය හා සුබසාධන අංශය සඳහා නව තත්ව කව පිහිටුවීම හා කව රැස්වීම් ක්‍රියාත්මක වීම තුළින් ලැබෙන යෝජනා හා අදහස් මඟින් සේවා වැඩිදියුණුව ඇති කිරීම.

ගමන් බලපත් අංශයේ තත්ත්ව කව නායක රැස්වීම් පැවැත්වීම



- ඵලදායිතා ප්‍රවර්ධන ඒකකය තුළ ප්‍රදර්ශන මැදිරිය සංවර්ධනය කිරීමට  කටයුතු කිරීම.











- ඵලදායිතා ප්‍රවර්ධන කටයුතු සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ අංශ අතර ඇගයීමක් සිදුකොට හොඳම අංශය තෝරා සම්මාන පිරිනැමීම.





**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව 2018 වසරේදී ලැබූ ජයග්‍රහණ හා සම්මාන**

1. 2018.12.12 දින තායිලන්තයේ බැංකොක් නුවර පැවති 5 වන ප්‍රත්‍යන්ත කළමනාකරණය හා අනන්‍යතා පද්ධති පිළිබඳ සමුළුවේදී ගමන් බලපත්‍රය සඳහා ජෛවමිතික හඳුන්වා දෙමින් කලාපය තුළ නව්‍යකරණ අනන්‍යතා පද්ධති ඇති කිරීම වෙනුවෙන් රේඩියන්ට් සම්මානයෙන්(Rediant Award) පිදුම් ලබන ලදී.





2. 2018 වසරේ ජාතික ඵලදායිතා තරගාවලියේදී අන්තර් දෙපාර්තමේන්තුමය අංශයෙන් සමස්ථ දිවයිනෙන්ම දෙවන ස්ථානය හිමි කර ගන්නා ලදී.









**2019 වර්ෂය සඳහා අපේක්ෂිත කාර්යයන්**

- ඵලදායිතා ප්‍රවර්ධන ඒකකයට අදාළව නිර්මාණය කර ඇති ප්‍රදර්ශන මැදිරිය සංවර්ධනය කිරීම.
- 2019 වර්ෂයේ නවක කාර්ය මණ්ඩලය සඳහා පුහුණු අංශය හා අනුබද්ධිතව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- 2019 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ සේවාවන් කාර්යක්ෂම කිරීම හා වැඩිදියුණු කිරීමට අදාළව ඵලදායිතා ප්‍රවර්ධන කටයුතු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයන් සිදුකොට එහි ප්‍රතිඵල අනුව අංශවල සිදු කළ යුතු වැඩිදියුණු කිරීම් පිළිබඳ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- ඵලදායිතා ප්‍රවර්ධන කටයුතු සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ අංශ අතර ඇගයීමක් සිදුකොට හොඳම අංශ තේරීමට කටයුතු කිරීම.

## 2. ගමන් බලපත්‍ර අංශය

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ මහජනයා සමඟ වඩාත් සමීපතම අංශය මෙන්ම විශාලතම අංශය වන්නේ ගමන් බලපත් අංශයයි. පාලක (ගමන් බලපත්) ගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන මෙම අංශය, ශ්‍රී ලාංකික පුරවැසියන්ට විදේශ රටවලට ගමන් කිරීම සඳහා විදේශයකදී ශ්‍රී ලාංකික අනන්‍යතාව පිළිඹිබු වන ජාත්‍යන්තර ප්‍රමිතීන් හා නිර්නායකයන්ට අනුගත ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රමුඛ වගකීම දරනු ලබයි. පුරවැසියන්ගේ ප්‍රමුඛ අවශ්‍යතාවන් හඳුනාගනිමින් සාමාන්‍ය සේවය යටතේ සහ එක්දින සේවය යටතේ ගමන් බලපත්‍ර නිකුත් කරනු ලබන මෙම අංශයයේ කටයුතු ප්‍රාදේශීය කාර්යාල හතරක්(04) මඟින් ජාලගතකර දියත් කරනු ලැබේ. ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ එක්දින සේවාව ක්‍රියාත්මක වන්නේ ප්‍රධාන කාර්යාලයේ පමණි.

**දැක්ම**

''සේවාලාභීන්ගේ උපරිම පහසුව පිළිබඳව සංවේදී වෙමින් ඔවුන් වෙත ජාත්‍යන්තර පිළිගැනීමක් සහිත නිවැරදි හා ප්‍රමිතියෙන් යුතු විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීම''

**අරමුණු හා කාර්යභාරය**

01. ශ්‍රී ලාංකීය ගමන් බලපත්‍රයේ ප්‍රමිතිය ආරක්ෂා කිරීමට හා වැඩිදියුණු කිරීමට අදාල ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම.
02. නිවැරදි හා සත්‍ය තොරතුරු ඇතුළත් විදේශ ගමන් බලපත්‍ර ශ්‍රී ලාංකිකයන් වෙත නිකුත් කිරීම සඳහා ක්‍රමවේදයන් අනුගමනය කිරීම.
03. ශ්‍රී ලාංකිකයන්ගේ ආගමන හා විගමන කටයුතු සම්බන්ධයෙන් අධිකරණ නියෝග ක්‍රියාත්මක කිරීම.
04. ශ්‍රී ලාංකිකයන්ගේ ආගමන හා විගමන කටයුතු වලට අදාලව රාජ්‍ය ආරක්ෂක අංශ හා අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ මනා සම්බන්ධීකරණයකින් යුතුව කටයුතු කිරීම.

මෙම අංශයේ කාර්යභාරය ශාඛාවන් 5 ක් ඔස්සේ ක්‍රියාත්මක වේ. එනම්,

01. අයදුම්පත් භාර ගැනීමේ ශාඛාව (ගමන් බලපත්‍ර ශාඛාව)
02. පුද්ගලාරෝපන ශාඛාව (ගමන් බලපත් සැකසුම් ශාඛාව)
03. සංශෝධන ශාඛාව
04. විදේශ දූත මණ්ඩල ශාඛාව
05. තැපැල් ශාඛාව

## 02 : 1 ගමන් බලපත්‍ර ශාඛාව

මෙම ශාඛාව පාලක (ගමන් බලපත්) ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.

දෙපාර්තමේන්තුව වෙත වැඩිම සේවාලාභීන් පිරිසක් පැමිණෙනු ලබන්නේ මෙම අංශයට වන අතර එය දිනකට 2500 ඉක්මවනු ලබයි.මහජනතාව වෙත වඩාත් සමීප කාර්යක්ෂම හා කඩිනම් සේවාවක් සැපයීමේ අරමුණින් එක් දින සේවාව හා සාමාන්‍ය සේවාව *යටතේ ගමන් බලපත් ලබා ගැනීම ප්‍රධාන කාර්යාලයේ ක්‍රියාත්මක වන අතර, සාමාන්‍ය සේවාව යටතේ ගමන් බලපත් ලබා ගැනීම* සඳහා මහනුවර, මාතර, වව්නියාව සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය කාර්යාල 4 ක් පිහිටුවා ඇත. මෙම ප්‍රාදේශීය කාර්යාල නියෝජ්‍ය /සහකාර පාලකවරුන් 4 දෙනෙකුගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.

**කාර්ය මණ්ඩලය - 2018 (ප්‍රධාන කාර්යාලය)**

| තනතුර/සේවාව | සංඛ්‍යාව |
|---|---|
| පාලක | 01 |
| නියෝජ්‍ය පාලක | 01 |
| සහකාර පාලක | 16 |
| සංවර්ධන නිලධාරි | 06 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 71 |
| ගමන් බලපත්‍ර සහායක | 01 |
| කාර්යාල සේවක සේවය | 20 |

**කාර්ය මණ්ඩලය - 2018 (ප්‍රාදේශීය කාර්යාල)**

| තනතුර/සේවාව | සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය/ සහකාර පාලක | 01 |
| සංවර්ධන නිලධාරි | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 58 |
| ගමන් බලපත්‍ර සහායක | 05 |
| පිළිගැනීමේ නිලධාරී | 01 |
| නියාමක | 01 |
| කාර්යාල සේවක සේවය | 33 |
| කම්කරු (පුහුණුවන) | 08 |

## 2018 වර්ෂයේ ඉටු කරන ලද විශේෂ කාර්යයන්

1. මුදල් ගෙවූ පසු ලබා දෙන කුවිතාන්සියේ ඇති Barcode එක මඟින් ඉතා කඩිනමින් ගමන් බලපත්‍රයේ පියවරයන් (Steps) පරීක්ෂා කිරීමට හැකි වීම.
2. ගමන් බලපත් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන අයදුම්පතට අදාල ටෝකන් පත භාෂා ත්‍රිත්වයෙන්ම (සිංහල, දෙමල, ඉංග්‍රීසි) ලබා දීම.
3. මැද පෙරදිග රටවල් සඳහා වෙනම ගමන් බලපත්‍රයක් නිකුත් කිරීමේ කටයුතු 2018.12.31 දිනෙන් අවසන් කිරීම.
4. ගමන් බලපත්‍රය සකස් කිරීම සම්බන්ධව පියවරින් පියවර අයදුම්කරු වෙත SMS පණිවිඩ සේවාවක් හඳුන්වා දීම.



## 2019 වර්ෂය සඳහා අපේක්ෂිත කාර්යයන්

1. ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ (ICAO) නිර්නායකයන්ට අනුකූලව ප්‍රමිතියෙන් ඉහළ ජෛවමිතික තොරතුරු ඇතුලත් විද්‍යුත් ගමන් බලපත්‍රයක් (e – Passport) 2020 වර්ෂයේදී හඳුන්වාදීමට අදාල ව්‍යාපෘතියේ මූලික කටයුතු සිදු කිරීම.
2. පරිගණක පද්ධතිය ඇසුරින් ගමන් බලපත් නිකුත් කිරීම සඳහා නව ක්‍රමවේදයක් හඳුන්වා දීමට 2018 වර්ෂයේ පටන් ගෙන ඇති අතර එය 2019 වර්ෂයේදී අවසන් කිරීමට කටයුතු කරමින් පවතී.
3. මහජනතාවට ඉහළ ප්‍රමිතියෙන් යුත් ජාත්‍යන්තර පිළිගැනීමක් සහ සියළුම රටවල් සඳහා ගමන් කිරීමට හැකි එක් ගමන් බලපත්‍රයක් නිකුත් කිරීමට කටයුතු කිරීම.
4. වඩාත් කාර්යක්ෂම සේවාවක් ඉටු කිරීමේ අරමුණින් අයදුම්පත් භාර ගන්නා පරිශ්‍රයේ දැනට පවතින සැකැස්ම (Layout) වෙනස් කිරීමට කටයුතු කිරීම.

## ගමන් බලපත් නිකුත් කිරීමේ ප්‍රගතිය - 2018

### ප්‍රධාන කාර්යාලය

| රාජ්‍ය තාන්ත්‍රික | රාජකාරි | සියලු රටවල් | මැද පෙරදිග | හදිසි සහතික | හඳුනාගැනීමේ සහතික | එකතුව |
|---|---|---|---|---|---|---|
| 364 | 1921 | 313168 | 164507 | 11510 | 02 | 491472 |

### ප්‍රාදේශීය කාර්යාල

| | රාජකාරි | සියලු රටවල් | මැද පෙරදිග | හදිසි සහතික | එකතුව |
|---|---|---|---|---|---|
| මහනුවර | 03 | 28500 | 9033 | 4828 | **42364** |
| වවුනියාව | 01 | 17945 | 5162 | 748 | **23856** |
| මාතර | 04 | 20099 | 3995 | 2606 | **26704** |
| කුරුණෑගල | 05 | 12605 | 5172 | 1554 | **19336** |
| **එකතුව** | **13** | **79149** | **23362** | **9736** | **112260** |



**2018 වර්ෂයේ දෙපාර්තමේන්තුව මඟින් සාමාන්‍ය සේවාව හා එක්දින සේවාව යටතේ නිකුත් කරන ලද සියළුම ගමන් බලපත් සංඛ්‍යාව**

| | රාජ්‍ය තාන්ත්‍රික | රාජකාරී | සියලු රටවල් | මැද පෙරදිග | හදිසි සහතික | හඳුනාගැනීමේ සහතික | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| එක්දින සේවය | 115 | 972 | 158521 | 133607 | - | 1 | **293216** |
| සාමාන්‍ය සේවය | 220 | 956 | 203608 | 35686 | 21246 | 1 | **261717** |

- විදේශ දූත මණ්ඩල අංශයෙන් නිකුත් කළ ගමන් බලපත් තොරතුරු මෙම වගුවට ඇතුළත් නොවේ.




**2018 වර්ෂයේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද සියළුම ගමන් බලපත් සංඛ්‍යාව**

| රාජ්‍යතාන්ත්‍රික | රාජකාරී | සියලු රටවල් | මැද පෙරදිග | හදිසි සහතික | හඳුනාගැනීමේ සහතික | එකතුව |
|---|---|---|---|---|---|---|
| **364** | **1934** | **392317** | **187869** | **21246** | **02** | **603732** |



**2014 සිට 2018 දක්වා ගමන් බලපත් නිකුත් කිරීම් (ගමන් බලපත් වර්ග අනුව)**

| වර්ෂය | රාජ්‍ය තාන්ත්‍රික | රාජකාරි | සියලු රටවල් | මැද පෙරදිග | හදිසි සහතික | හඳුනාගැනීමේ සහතික | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| **2014** | 309 | 1043 | 234,943 | 198,815 | 14,786 | 6 | **449,902** |
| **2015** | 471 | 1313 | 287,438 | 176,963 | 25,180 | 2 | **491,367** |
| **2016** | 40 | 1,856 | 422,394 | 200,311 | 33,751 | 12 | **658,725** |
| **2017** | 339 | 1,819 | 369,197 | 173,901 | 17,787 | 01 | **563,044** |
| **2018** | 364 | 1,934 | 392,317 | 187,869 | 21,246 | 02 | **603,732** |
| එකතුව | **1,884** | **7,965** | **1,706,289** | **937,859** | **112,750** | **23** | **2,766,770** |




## <u>02 : 2 ගමන් බලපත්‍ර සැකසුම් ශාඛාව</u>

පාලක (ගමන් බලපත්‍ර)ගේ අධීක්ෂණය යටතේ මෙම ශාඛාව ක්‍රියාත්මක වේ.

ගමන් බලපත්‍ර ශාඛාවෙන් සහ විදේශ දූත මණ්ඩල ශාඛාවෙන් නව ගමන් බලපත්‍ර සකස් කිරීම සඳහා සැකසුම් ශාඛාව වෙත යොමු වන අයදුම්පත්‍ර අදාල පරීක්ෂා කිරීම් වලින් අනතුරුව පහත සඳහන් පරිදි කටයුතු කරනු ලබයි.

දත්ත ඇතුළත් කිරීම (Data Entry), ඒවා නැවත පරීක්ෂා කිරීම (Validate), ඡායාරූප හා අත්සන් පරිලෝඛණය කිරීම (Capture), මුද්‍රණය කිරීම (Print), මුද්‍රණය කරන ලද ගමන් බලපත්‍ර වල වෙනස් කිරීම් සහ නිරීක්ෂණ ඇතොත් ඒවා ගමන් බලපත්‍රයේ 4 වන පිටුවේ මුද්‍රණය කිරීම (Observation Print), තත්ව පාලනය කිරීම (Quality Assurance), ගමන් බලපත්‍ර ලැමිනේටින් කිරීම, සැසඳීම හා 4 වන පිටුව ස්කෑන් කිරීම (Compare & 4th Page Scan) සහ අවසාන තත්ත්ව පරීක්ෂාව (Quality Confirm) සිදු කර ඉන් අනතුරුව එක්දින සේවය යටතේ නිකුත් කරන ගමන් බලපත් නිකුත් කිරීමේ කවුළු වෙතත්, සාමාන්‍ය සේවය යටතේ නිකුත් කරන ගමන් බලපත් තැපැල් ශාඛාව වෙතටත්, විදේශ දූත මණ්ඩල හරහා ලැබෙන අයදුම්පත් වෙනුවෙන් නිකුත් කරන ගමන් බලපත් විදේශ දූත මණ්ඩල ශාඛාවටත් යවනු ලබයි.

මීට අමතරව සංශෝධන කටයුතු සඳහා යොමු කෙරෙන අයදුම්පත්‍ර අදාල පරීක්ෂා කිරීම් වලින් අනතුරුව දත්ත ඇතුළත් කිරීම (Data Entry ), ඒවා නැවත පරීක්ෂා කිරීම (Validate) හා සංශෝධන 4 වන පිටුවේ මුද්‍රණය කිරීම (Observation Print) ද සිදු කරනු ලබයි.

**කාර්ය මණ්ඩලය - 2018**

| තනතුර/සේවාව | සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය පාලක | 01 |
| සහකාර පාලක | 02 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 60 |
| ගමන් බලපත්‍ර සහායක | 20 |
| කාර්යාල සේවක සේවය | 10 |

## 02 : 3 ගමන් බලපත්‍ර සංශෝධන ශාඛාව

පාලක(ගමන් බලපත්) ගේ අධීක්ෂණය යටතේ මෙම ශාඛාව ක්‍රියාත්මක වේ.

නිකුත් කරන ලද ගමන් බලපත්‍රවලට අදාලව ගමන් බලපත්‍රධාරීන් පසුව කරන ඉල්ලීම් සලකා බලා විවිධ කාණ්ඩ යටතේ සංශෝධන ගමන් බලපත්‍රයට ඇතුලත් කිරීම මෙම ශාඛාව සිදුකරනු ලබයි.

**කාර්ය මණ්ඩලය - 2018**

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය පාලක | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 05 |
| කාර්යාල සේවක සේවය | 02 |

මේ සඳහා එක් වෙනස් කිරීමකට රු. 500/= ක් අය කරනු ලබන අතර අයදුම්පත්‍රය භාරගෙන පැයක කාලයක් ඇතුළත කාර්ය නිම කරනු ලැබේ.

**ගමන් බලපත්‍ර සංශෝධනය - 2018**

| කාණ්ඩය | මුළු එකතුව |
|---|---|
| එක් විදේශ ගමනකට වලංගු කිරීම | 426 |
| තනි ගමන් සීමාව අවලංගු කිරීම | 4212 |
| ද්විත්ව පුරවැසිභාවය ඇතුලත් කිරීම | 364 |
| ළමුන් ඉවත් කිරීම | 1022 |
| හැඳුනුම්පත් අංකය ඇතුළත් කිරීම | 10555 |
| විවාහයට පෙර නම යෙදීම | 196 |
| නම වෙනස් කිරීම | 5372 |
| විවාහයට පසු නම යෙදීම | 1243 |
| වෙනත් සංශෝධන(ගාස්තු රහිත) | 1 |
| වෙනත් සංශෝධන 01 | 10262 |
| වෙනත් සංශෝධන 02 | 112 |
| වෙනත් සංශෝධන 03 | 1 |
| තනතුර සටහන් කිරීම | 25144 |
| අලුත්කිරීම් | 60 |
| විවාහයට පෙර වාසගම ඇතුළත් කිරීම | 23 |
| **එකතුව** | **58993** |

**ගමන් බලපත්‍ර සංශෝධනය (2014 සිට 2018 දක්වා)**

| වර්ගය | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| සියලු රටවල් සඳහා වලංගු කිරීම | 473 | - | 390 | - | - |
| එක් විදේශ ගමනකට වලංගු කිරීම | - | 397 | - | 452 | 426 |
| තනි ගමන් සීමාව අවලංගු කිරීම | 1,151 | 1,289 | 2,053 | 3,250 | 4212 |
| කාලය දීර්ඝ කිරීම | 2,368 | - | - | - | - |
| ද්විත්ව පුරවැසිභාවය ඇතුලත් කිරීම | 11 | 209 | 376 | 448 | 364 |
| මවගේ හෝ පියාගේ ගමන් බලපත්‍රයට ළමයින් ඇතුළත් කිරීම | 1,496 | 794 | - | - | - |
| මවගේ හෝ පියාගේ ගමන් බලපත්‍රයෙන් දරුවන් ඉවත් කිරීම | 2,219 | 2,190 | 2,310 | 1,606 | 1022 |
| මවගේ හෝ පියාගේ ගමන් බලපත්‍රයට දරුවන්ගේ අළුත් ඡායාරූප ඇතුළත් කිරීම | 135 | 47 | - | - | - |
| හැඳුනුම්පත් අංකය ඇතුළත් කිරීම | 2,070 | 2,003 | 4,209 | 8,032 | 10555 |
| විවාහයට පෙර නම යෙදීම | 16 | 48 | 255 | 285 | 219 |
| විවාහයට පසු නම යෙදීම | 2,033 | 1,898 | 1,668 | 1,471 | 1243 |
| නම වෙනස් කිරීම | 3,119 | 3,265 | 4,038 | 5,428 | 5372 |
| නම මාරුකිරීම (වෙනත්) | 3 | 2 | 3 | - | - |
| තනතුර සටහන් කිරීම | 66,922 | 54,400 | 39,629 | 27,101 | 25144 |
| තනතුර සටහන් කිරීම (ගාස්තු රහිත) | - | 880 | - | - | 01 |
| වෙනත් සංශෝධන (ගාස්තු රහිත) | 81 | 9 | 1 | 01 | |
| වෙනත් සංශෝධන 01 | 28,669 | 20,844 | 15,814 | 10,730 | 10262 |
| වෙනත් සංශෝධන 02 | 913 | 330 | 224 | 122 | 112 |
| වෙනත් සංශෝධන 03 | 17 | 7 | 2 | 01 | 01 |
| අලුත්කිරීම් | - | - | 346 | 106 | 60 |
| **එකතුව** | **111,696** | **88,612** | **71,318** | **59,033** | **58,993** |



## 02: 4 විදේශ දූත මණ්ඩල ශාඛාව

පාලක(ගමන් බලපත්) ගේ අධීක්ෂණය යටතේ මෙම ශාඛාව ක්‍රියාත්මක වේ.

විදේශගත ශ්‍රී ලාංකිකයන්ට ගමන් බලපත්‍ර නිකුත් කිරීම මෙම අංශය මඟින් සිදු කරනු ලබයි. විදේශ දූත මණ්ඩල මඟින් විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු කෙරෙන අයදුම්පත් සඳහා සකස් කළ නව ගමන් බලපත් නැවත විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා විදේශ දූත මණ්ඩල වෙත යොමු කරන අතර විදේශ දූත මණ්ඩල මඟින් අදාල අයදුම්කරුවන් වෙත නිකුත් කිරීම සිදු කරයි.

**2018 වර්ෂය තුල විදේශ දූත මණ්ඩල ශාඛාවේ කාර්ය මණ්ඩලය**

| තනතුර/සේවාව | සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය පාලක | 01 |
| සහකාර පාලක | 01 |
| සංවර්ධන නිලධාරීන් | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 14 |
| කාර්යාල සේවක සේවය | 03 |

### විදේශ දූත මණ්ඩල ශාඛාවේ අරමුණු හා කාර්යභාරය.

- විදේශ දූත මණ්ඩල වලින් ලැබෙන අයදුම්පත් වලට අදාල ගමන් බලපත් නිකුත් කිරීම.
- විදේශගත ශ්‍රී ලාංකිකයින් හට විදේශ දූත මණ්ඩල වලින් තාවකාලික ගමන් බලපත්‍ර නිකුත් කිරීමට අනුමැතිය ලබා දීම.
- විදේශගත ශ්‍රී ලාංකිකයින්ගේ ගමන් බලපත් වල තොරතුරු සංශෝධනය කිරීම සඳහා අනුමැතිය ලබා දීම.
- විදේශ දූත මණ්ඩල විසින් ඉල්ලා ඇති අවස්ථාවල විදේශගත ශ්‍රී ලාංකිකයින්ගේ ගමන් බලපත් වලට අදාල නිරවද්‍යතාවය තහවුරු කරමින් වාර්තා ලබා දීම.

### 2018 වර්ෂය තුළ මෙම ශාඛාව මඟින් නිකුත් කරන ලද ගමන් බලපත් පිළිබඳ විස්තර

| මාසය | සංඛ්‍යාව |
|---|---|
| ජනවාරි | 3221 |
| පෙබරවාරි | 3241 |
| මාර්තු | 3786 |
| අප්‍රේල් | 3760 |
| මැයි | 6501 |
| ජුනි | 3298 |
| ජූලි | 6025 |
| අගෝස්තු | 3763 |
| සැප්තැම්බර් | 3377 |
| ඔක්තෝබර් | 4785 |
| නොවැම්බර් | 3402 |
| දෙසැම්බර් | 3633 |
| **එකතුව** | **48792** |

## 2018 වර්ෂය තුළ මෙම ශාඛාව මඟින් නිකුත් කරන ලද ගමන් බලපත් පිළිබඳ විස්තර




## 2014 වර්ෂයේ සිට 2018 වසර දක්වා විදේශ දූත මණ්ඩල ශාඛාව මඟින් නිකුත් කරන ලද ගමන් බලපත් පිළිබඳ විස්තර

| මාසය | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| ජනවාරි | 2929 | 2027 | 2848 | 3043 | 3221 |
| පෙබරවාරි | 3312 | 3152 | 2049 | 3457 | 3241 |
| මාර්තු | 3768 | 3551 | 3783 | 4603 | 3786 |
| අප්‍රේල් | 3446 | 4082 | 4788 | 4038 | 3760 |
| මැයි | 2921 | 3052 | 5229 | 4532 | 6501 |
| ජූනි | 3346 | 3573 | 4491 | 4614 | 3298 |
| ජූලි | 3858 | 3497 | 3271 | 3752 | 6025 |
| අගෝස්තු | 3329 | 3951 | 4562 | 4167 | 3763 |
| සැප්තැම්බර් | 3297 | 3307 | 3485 | 3358 | 3377 |
| ඔක්තෝබර් | 3632 | 3112 | 3322 | 2805 | 4785 |
| නොවැම්බර් | 3010 | 1833 | 3673 | 4016 | 3402 |
| දෙසැම්බර් | 4080 | 1908 | 3021 | 3162 | 3633 |
| **එකතුව** | **40928** | **37045** | **44522** | **45547** | **48792** |

## 2014 වර්ෂයේ සිට 2018 වසර දක්වා විදේශ දූත මණ්ඩල ශාඛාව මඟින් නිකුත් කරන ලද ගමන් බලපත් පිළිබඳ විස්තර



**2018 වසරේදී විදේශ දූත මණ්ඩල ශාඛාව මඟින් එක් එක් රටවල් අනුව ගමන් බලපත් නිකුත් කිරීම පිළිබඳ විස්තර**

| | රට | නිකුත් කල ගමන් බලපත් ප්‍රමාණය |
|---|---|---|
| 1 | එක්සත් අරාබි එමීර් රාජ්‍ය | 1240 |
| 2 | ජෝර්දානය | 492 |
| 3 | තුර්කිය | 3 |
| 4 | ඉරාකය | 8 |
| 5 | බහරේන් | 670 |
| 6 | තායිලන්තය | 14 |
| 7 | චීනය | 70 |
| 8 | ජර්මනිය | 1602 |
| 9 | බ්‍රසීලය | 6 |
| 10 | බෙල්ජියම | 39 |
| 11 | ඊජිප්තුව | 53 |
| 12 | ඕස්ටේලියාව | 3531 |
| 13 | ඉන්දියාව | 247 |
| 14 | බංගලිදේශය | 53 |
| 15 | කටාර් රාජ්‍ය | 4033 |
| 16 | ඩුබායි | 4401 |
| 17 | ඉතියෝපියාව | 1 |
| 18 | ස්විස්ටර්ලන්තය | 1232 |
| 19 | කියුබාව | 4 |
| 20 | පකිස්තානය | 14 |
| 21 | ඉන්දුනීසියාව | 14 |
| 22 | සවුදි අරාබිය | 4502 |
| 23 | නේපාලය | 1 |
| 24 | මැලේසියාව | 411 |
| 25 | කුවේට් | 5455 |
| 26 | ලෙබනනය | 519 |
| 27 | මහා බ්‍රිතාන්‍ය | 2646 |
| 28 | ඇමරිකා එක්සත් ජනපදය | 1381 |
| 29 | මාලදිවයින | 112 |
| 30 | ඉතාලිය | 6002 |
| 31 | රුසියාව | 6 |
| 32 | ඕමානය | 650 |
| 33 | කෙන්නියාව | 27 |
| 34 | නයිජීරියාව | 8 |
| 35 | නෝර්වේ | 155 |
| 36 | කැනඩාව | 1872 |
| 37 | ප්‍රංශය | 4102 |
| 38 | පිලිපීනය | 26 |
| 39 | දකුණු අප්‍රිකාව | 85 |
| 40 | දකුණු කොරියාව | 1335 |
| 41 | සීෂෙල්ස් | 24 |
| 42 | සිංගප්පූරුව | 191 |
| 43 | ස්වීඩනය | 189 |
| 44 | ඉරානය | 3 |
| 45 | ඊශ්‍රාලය | 383 |
| 46 | නෙදර්ලන්තය | 81 |
| 47 | ජපානය | 838 |
| 48 | ඔස්ට්‍රියාව | 37 |
| 49 | වියට්නාමය | 6 |
| 50 | පෝලන්තය | 15 |
| 51 | මියැන්මාරය | 3 |
| | එකතුව | **48792** |

## 2018 වර්ෂය තුළ ඉටු කරන ලද විශේෂිත කාර්යයන්

දෙපාර්තමේන්තුව ගමන් බලපත්‍ර නිකුත් කිරීමේදී ජෛවමිතික සඳහා දත්ත ලබා ගැනීම 2015.08.10 දින ආරම්භ කරනු ලැබුව ද විදෙස්ගත ශ්‍රී ලාංකිකයන්ගේ ගමන් බලපත්‍ර සඳහා සැකසුම් ශාඛාවෙන් ජෛවමිතික දත්ත ලබා ගැනීමක් සිදු නොවීය. 2018.01.01 දින සිට ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල හරහා ගමන් බලපත්‍රයක් අයදුම් කරන අයදුම්කරුවන් (වයස අවුරුදු 16 ට වැඩි හා අවුරුදු 60 අඩු වයස් සීමාවට අයත්) ස්වකීය ගමන් බලපත්‍රය ලබාගැනීමෙන් පසු ශ්‍රී ලංකාවට පැමිණෙන ප්‍රථම අවස්ථාවේදීම ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත පැමිණ සිය ජෛවමිතික දත්ත (ඇඟිලි සලකුණු) ලබා දීම අනිවාර්ය කර ඇත. එබැවින් එම කටයුතු 2018 වර්ෂයේ ජනවාරි මස සිට ක්‍රියාත්මක කරන ලදී.





විදේශ දූත මණ්ඩල ශාඛාව මගින් ජෛවමිතික දත්ත (ඇඟිලි සලකුණු) ලබා ගැනීම

## 2019 වර්ෂය සඳහා අපේක්ෂිත කාර්යයන්

- විදේශගත ශ්‍රී ලාංකිකයන් සඳහා ගමන් බලපත්‍ර නිකුත් කිරීමට මාර්ගගත ක්‍රමවේදයක් (Online Passport Application processing Mechanism) හඳුන්වා දීම තුලින් විදේශගත ශ්‍රී ලාංකිකයන්ට පහසුකම් සැපයීම.

## 2 : 5 තැපැල් ශාඛාව

### අංශයේ අරමුණු හා කාර්යභාරය.

සාමාන්‍ය සේවය යටතේ සකස් කරනු ලබන ගමන් බලපත් අයදුම්කරුවන්ට ප්‍රමාදයකින් තොරව තැපැල් මඟින් යැවීම ශාඛාවේ ප්‍රධාන අරමුණ වේ.

- එසේම සාමාන්‍ය සේවය යටතේ භාරදෙනු ලබන ඉල්ලුම්පත් වලට අදාල ගමන් බලපත් පරිගණක ශාඛාවෙන් ලැබුණු පසු ලැයිස්තුගත කර අදාල අයදුම්කරුවන්ගේ ලිපිනයන්ට ලියාපදිංචි තැපැල් මඟින් යැවීම.

- සාමාන්‍ය සේවය යටතේ භාරදී ඇති ඉල්ලුම්පත් වලට අදාල ගමන් බලපත් නියමිත දිනට සකස් වී නොතිබුන විට හදිසි අවශ්‍යතාවය මත ලබාගැනීම සඳහා පැමිණෙන අයදුම්කරුවන්ට "එදිනම නිකුත් කිරීමේ ක්‍රමය" යටතේ ගමන් බලපත් සකස් කර දීම.

- ලියාපදිංචි තැපැල් මඟින් යවනු ලබන ගමන් බලපත් ලිපිනය වෙනස්වීම මත හෝ භාරනොගැනීම මත හෝ ආපසු ලැබුනු පසු අයදුම්කරු පැමිණ විමසීමේ දී ඔවුන්ගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීමෙන් පසු භාරදීම.

## කාර්ය මණ්ඩලය - 2018

| තනතුර/ සේවාව | සංඛ්‍යාව |
|---|---|
| සහකාර පාලක | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 07 |
| නියාමක | 01 |
| කාර්යාල සේවක සේවය | 03 |

## 2018 වර්ෂය තුළ ඉටුකරන ලද කාර්යයන්

එක් එක් මාසය තුල තැපැල් කරන ලද ගමන් බලපත් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| මාසය | තැපැල් කරන ලද ගමන් බලපත් ප්‍රමාණය |
|---|---|
| ජනවාරි | 7883 |
| පෙබරවාරි | 5953 |
| මාර්තු | 9779 |
| අප්‍රේල් | 6545 |
| මැයි | 5687 |
| ජුනි | 6029 |
| ජූලි | 10183 |
| අගෝස්තු | 10039 |
| සැප්තැම්බර් | 8716 |
| ඔක්තෝබර් | 11125 |
| නොවැම්බර් | 7842 |
| දෙසැම්බර් | 10021 |
| **එකතුව** | **99802** |

## තැපැල් කරන ලද ගමන් බලපත් සංඛ්‍යාව 2014 – 2018

| වර්ෂය | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| ගමන් බලපත් සංඛ්‍යාව | 69768 | 71817 | 104867 | 104706 | 99802 |



# 03. ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ අංශය

පාලක (ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ)/ නියෝජ්‍ය කොමසාරිස් (ඉන්දු ලංකා) ගේ අධීක්ෂණය යටතේ ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ ශාඛාව, ඉන්දු ලංකා පුරවැසි ශාඛාව හා නීති ශාඛාව ක්‍රියාත්මක වේ.

## 03 :1 ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ ශාඛාව

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ කටයුතු වඩාත් සැලසුම් සහගතව හා වඩා විධිමත් අයුරින් ක්‍රියාත්මක කිරීමේ අරමුණින් මෙම ශාඛාව ස්ථාපිත කර ඇත. දෙපාර්තමේන්තුවේ මූලික කාර්යයන් ඉටුකිරීමේදී අදාළ වන ප්‍රතිපත්ති/සැළසුම් සකස් කිරීම, දෙපාර්තමේන්තුවට අදාල නීති, අණ පනත් සංශෝධනය, චක්‍රලේඛ හා කාර්ය පටිපාටි සකස් කිරීම හා නිකුත් කිරීම, පාලන වාර්තා, ප්‍රගති වාර්තා හා වාර්ෂික සැළසුම් සකස් කිරීම, මෙහෙයුම් අත්පොත් සකස් කිරීම හා යාවත්කාලීන කිරීම, මෙම අංශයේ ප්‍රමුඛ කාර්යයන්ය.

**කාර්ය මණ්ඩලය - 2018**

| තනතුර/ සේවාව | සංඛ්‍යාව |
|---|---|
| පාලක | 01 |
| නියෝජ්‍ය පාලක | 01 |
| සංවර්ධන නිලධාරි | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| කාර්යාල සේවක සේවය | 01 |

### 2018 වසරේ දී ඉටුකළ කාර්යයන්

1. 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම (Action Plan) සකස් කිරීම.
2. 2017 වර්ෂයට අදාළ කාර්ය සාධන වාර්තාව සකස් කිරීම.
3. අනෙකුත් ආයතනවලට යැවිය යුතු මාසික හා කාර්තු වශයෙන් ප්‍රගති වාර්තා සකස් කිරීම.
4. ප්‍රාග්ධන හා අනෙකුත් ව්‍යාපෘති වල ප්‍රගතිය සම්බන්ධීකරණය, මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම.
5. රේඛීය අමාත්‍යාංශය හා අනෙකුත් ආයතන සමග ප්‍රතිපත්තිමය කටයුතු වලට අදාල රාජකාරි සම්බන්ධීකරණය කිරීම.
6. දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාව අනුව අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කර, ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට කටයුතු කිරීම හා වෙනත් අමාත්‍යාංශවලින් ඉදිරිපත් කරන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබා දීමට කටයුතු කිරීම.

**2018 වර්ෂය තුළ ඉටු කරන ලද විශේෂිත කාර්යයන්**

1. වීසා ගාස්තු සංශෝධනය හා නව වීසා වර්ග හඳුන්වා දීමට අදාල යෝජනාවලිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම
2. අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද නව වීසා ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට අදාලව ආගාමික හා විගාමික පනත සංශෝධනය කිරීමට හා නව සංශෝධිත කෙටුම්පත සකස් කිරීම සඳහා අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීම හා කෙටුම්පත සකස් කිරීම
3. වීසා ගාස්තු සංශෝධනයට අදාලව ආගාමික හා විගාමික පනතට අදාල සංශෝධිත රෙගුලාසි කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම
4. පුරවැසි පනත අනුව ද්විත්ව පුරවැසිභාවය ප්‍රදානය කිරීම සඳහා අයදුම් කිරීමට හැකියාවක් නොමැති පුද්ගලයන්ට ස්ථිර වාස වීසා ලබා දීමට අදාල ආගාමික හා විගාමික රෙගුලාසි සකස් කිරීම
5. 2019 වසරේ සිට " සියළුම රටවල් " සඳහා වලංගු වන ගමන් බලපත්‍ර පමණක් නිකුත් කිරීමට අදාල කටයුතු සම්බන්ධීකරණය කිරීම.
6. ඉදිරියේදී හඳුන්වාදීමට නියමිත විද්‍යුත් ගමන් බලපත්‍රය ක්‍රියාත්මක කිරීමට අදාල කටයුතු සම්බන්ධීකරණය කිරීම.
7. ගුවන් මඟින් පෙර ක්‍රියාවලිගත කිරීමේ සහ මඟී නාම වාර්තා ලබා ගැනීමේ පද්ධතිය ස්ථාපිත කිරීමට අදාල කටයුතු සම්බන්ධීකරණය කිරීම

## 03 : 2 ඉන්දු ලංකා පුරවැසි ශාඛාව

පාලක ජනරාල්වරයා නිල බලයෙන් ඉන්දීය සම්භවයක් සහිත පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ධූරය දරන අතර ඉන්දීය සම්භවයක් සහිත පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ නියෝජ්‍ය කොමසාරිස් වශයෙන් පාලක (ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ) කටයුතු කරයි.

**කාර්ය මණ්ඩලය - 2018**

| තනතුර/ සේවාව | සංඛ්‍යාව |
|---|---|
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| කාර්යාල සේවක සේවය | 01 |

**කාර්යභාරය**

ශ්‍රී ලංකාවේ වාසය කරන ඉන්දියානු සම්භවයක් සහිත තැනැත්තන් වෙත පුරවැසිභාවය ප්‍රදානය කිරීම හා ඊට අනුෂාංගික කාර්යයන් ඉටු කිරීම මෙම අංශයේ කාර්යභාරය වේ.

1948 අංක 18 දරණ පුරවැසිභාවය පිළිබඳ පනත, 1949 අංක 03 දරණ ඉන්දියානු හා පකිස්ථානු පදිංචිකරුවන්ගේ පුරවැසිභාවය පිළිබඳ පනත 1967 අංක 14 දරණ ඉන්දු ලංකා ගිවිසුම ක්‍රියාවට නැංවීමේ පනත, 1988 අංක 39 දරණ අදේශකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත හා 2003 අංක 35 දරණ ඉන්දියානු සම්භවය ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත, යන පනත්වල සඳහන් සුදුසුකම් සපුරන තැනැත්තන්ට එම පනත් ක්‍රියාත්මක වූ දිනයෙහි සිට බලපවත්වන පරිදි ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය හිමි වී ඇත. එබඳු තැනැත්තකුට අවශ්‍ය නම් තමන්ගේ පුරවැසිභාවය තහවුරු කිරීමේ සහතිකයක් කොමසාරිස්වරයාගෙන් අයදුම් කොට ලබා ගත හැකිය. මේ වන විට සහතික ඉල්ලුම් කරන තැනැත්තන් සංඛ්‍යාව සීඝ්‍රයෙන් පහත වැටී ඇත. ඒ අනුව 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා සහතික පත් ලබා ගත් පුද්ගලයන් සංඛ්‍යාව පහත දක්වා ඇත.

### පුරවැසි සහතික නිකුත් කිරීම 2014 – 2018

| පනත | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| 1988 අංක 39 | 19 | - | - | 03 | 01 |
| 2003 අංක 35 | 03 | - | - | - | - |

ශ්‍රී ලංකාවේ වාසය කරන ඉන්දියානු සම්භවයක් සහිත ලියාපදිංචියෙන් මෙරට පුරවැසිභාවය ලබා ගත් පුද්ගලයින් හට අවශ්‍ය වන අවස්ථාවලදී තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ තොරතුරු සනාථ කිරීමේ ලිපි නිකුත් කිරීම ද මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

### ලියාපදිංචිය පිළිබඳ තොරතුරු සනාථ කිරීමේ ලිපි නිකුත් කිරීම 2015 – 2018

| පනත | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|
| 1949 අංක 03 | - | 149 | 29 | **20** |
| 1967 අංක 14 | - | 48 | 30 | **10** |
| 1988 අංක 39 | 48 | 49 | 24 | **13** |
| 2003 අංක 35 | 02 | 01 | - | **01** |



## 03:3 නීති ශාඛාව

පාලක (ප්‍රතිපත්ති, සංවර්ධන හා ප්‍රතිසංස්කරණ) අධීක්ෂණයෙන් සහකාර පාලක (නීති) යටතේ ක්‍රියාත්මක වේ.

### කාර්ය මණ්ඩලය - 2018

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| සහකාර පාලක | 01 |
| ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරි | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 |
| කාර්යාල සේවක සේවය | 01 |

### නීති ශාඛාවේ අරමුණ හා කාර්යභාරය

මෙම ශාඛාව මඟින් ආගාමන හා විගමන දෙපාර්තමේන්තුවේ කාර්යානුබද්ධ අණපනත් මඟින් ලැබී ඇති නෛතික අධිකාරිය ක්‍රියාවේ යෙදවීමට අවශ්‍ය උපදෙස් හා සහාය ලබාදීමටත්, අවශ්‍යතාවයන් අනුව අදාළ අණපනත් සංශෝධනය කිරීමට කටයුතු කිරීම මඟින් දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව ඉටුකිරීමටත් සහාය වීම.

**නීති අංශයෙන් ඉටුකරන ලද විශේෂිත කාර්යයන්:**

- 1948 අංක 20 දරණ ආගාමික හා විගාමික පනතට සහ එම පනතේ සංශෝධන සියල්ල සඳහා නව ආගමික හා විගාමික පනතක් සැකසීමට අදාළ පනත් කෙටුම්පත් නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමුකරවීමට කටයුතු කර ඇත.
- නව ආගාමික හා විගාමික පනතට අදාල රෙගුලාසි සැකසීමට වැඩමුළු තුනක් පැවැත්වීම සහ වීසා ලබා දීමට අදාල රෙගුලාසි සකසා නිම කිරීම.
- සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය, නීතිපති දෙපාර්තමේන්තුව හා ආගමන විගමන දෙපාර්තමේන්තුව ඒකාබද්ධව නව වීසා රෙගුලාසි සැකසීම සඳහා පනත් කෙටුම් පත් නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමුකරවීමට කටයුතු කර ඇත.
- 1948 අංක 20 දරණ ආගාමික හා විගාමික පනතේ 14 වන වගන්තිය හා පනතට අදාළව රෙගුලාසි සංශෝධනය කිරීම හා වීසා ගාස්තු සංශෝධනය කිරීමට අදාල සංශෝධන පනත් කෙටුම්පත් නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමුකරවීමට කටයුතු කිරීම.

**නීති අංශයෙන් ඉටුකරන ලද කාර්යයන්:**

1. දෙපාර්තමේන්තුව මගින් පවරා ඇති නඩු වලට අදාළ සිතාසි, වරෙන්තු කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයෙන් ලබාගැනීම සහ එම සිතාසි, වරෙන්තු අදාල පුද්ගලයන් වෙත යොමු කිරීමට කටයුතු කිරීම.
2. පාලක ජනරාල් හෝ දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරියකුට අධිකරණය ඉදිරියේ සාක්ෂි දීම පිණිස සිතාසි යොමු කර ඇති අවස්ථාවන්හිදී නඩු 187 ක් සඳහා අදාළ තොරතුරු සහ ලිපිගොනු සකස් කර සුදුසු නිලධාරින් අදාළ දිනයන්හිදී අධිකරණ කටයුතු වලට සහභාගීකරවීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.
3. අධිකරණ නියෝග ක්‍රියාත්මක කිරීමට නොහැකි, තොරතුරු අසම්පූර්ණ අධිකරණ නියෝග සම්බන්ධ දැනුවත් කිරීමේ ලිපි 1118 ක් සකස් කර අදාළ අධිකරණ වෙත යොමු කොට ඇත.
4. ජනාධිපති විශේෂ විමර්ශණ කොමිසම ඇතුළුව විශේෂ පොලිස් අපරාධ විමර්ශන ඒකක වලින් සහ විවිධ පොලිස් ස්ථාන වලින් පුද්ගලයන්ගේ වංචා සම්බන්ධයෙන් අදාල පුද්ගලයන්ගේ තොරතුරු විමසා එවා ඇති ලිපිවලට පිළිතුරු ලිපි 29 ක් යොමු කොට ඇත.
5. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වගඋත්තරකරුවන් කොට ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරා ඇති මූලික අයිතිවාසිකම් නඩු 06 ක් සම්බන්ධව නිරීක්ෂණ වාර්තා සකස් කර ඉදිරිපත් කිරීම.
6. දෙපාර්තමේන්තුවේ කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය වන්නාවූ ගොඩනැගිලි, නිවාස විවේකාගාර වලට අදාළව පාර්ශව අතර ඇති කරගන්නා බදු ගිවිසුම් සකස් කොට අත්සන සඳහා යොමු කිරීම සහ අදාල ගිවිසුම් ලියාපදිංචි කිරීමට කටයුතු සිදු කිරීම. (මහනුවර, ත්‍රිකුණාමලය, හම්බන්තොට,මාතර, කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලයන්)
7. දෙපාර්තමේන්තුවේ කටයුතු වලට අදාළ වන්නාවූ කාර්යයන් සම්බන්ධ දේශීය ආයතන සමඟ දෙපාර්තමේන්තුව එළඹ ඇති ගිවිසුම් 20 ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත.
8. රාජතාන්ත්‍රික හා රාජකාරි ගමන් බලපත්‍ර දරන්නන් සඳහා ද්විපාර්ශික වීසා නිදහස් කිරීමේ ගිවිසුම් සකස් කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ සිදුකිරීමට කටයුතු කිරීම.
   - සම්බන්ධීකරණය කරන ලද ගිවිසුම් අත්සන් කිරීමට නියමිත රටවල් :
     කොළොම්බියාව,ලාඕසය,ඕමානය, එල්සැල්වදෝර්, ජෝර්ජියාව, බහරේනය, භූතානය, යුක්රේනය, ඉරාකය, මැලේසියාව, රුවන්ඩාව, කුවේට්ය, ටියුනිෂියාව, ඊජිප්තුව, ලෙබනනය.
9. තොරතුරු දැනගැනීමෙ පනතට අදාළව ලැබී ඇති ඉල්ලීම් **51** ක් සම්බන්ධව අවශ්‍ය කටයුතු සිදු කර ඇත.
10. ආගමන විගමන නීති සම්පාදනය සමාලෝචනය කර යාවත් කාලීන කිරීමේ වැඩමුළුව.

1948 අංක 20 දරණ ආගාමික හා විගාමික පනතට අදාළ පරතර විශ්ලේෂණ වාර්තාවේ නිගමන මත පදනම් වෙමින් වත්මන් ආගාමික හා විගාමික පනත අවලංගු කර ඒ වෙනුවට නව පනතක් සම්පාදනය කිරීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කරන ලදී. අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූලව ආගමන හා විගමන දෙපාර්තමේන්තුව උනන්දුවක් දක්වන අදාළ පාර්ශ්වයන්ගේ උපදේශකත්වය හා සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානයේ තාක්ෂණික සහයෝගය ලබා ගනිමින් යෝජිත ආගාමික හා විගාමික පනත් කෙටුම්පතෙහි අන්තර්ගත විය යුතු යැයි අපේක්ෂිත විධි විධාන ඇතුළත් වාර්තාව සකසන ලදී.

ගමන් බලපත්‍රයේ ඒකාග්‍රතාව වැඩි දියුණු කිරීම, වීසා නිකුත් කිරීමේ ක්‍රියාවලිය හා අනන්‍යතා කළමනාකරණ රාමුව තවදුරටත් සවිමත් කිරීම හා පාරජාතීය අපරාධ මැඩලීම උදෙසා වන ගෝලීය ප්‍රයත්නය සඳහා ශ්‍රී ලංකා රජයට සක්‍රීයව දායක වීමට අවශ්‍ය නෛතික රාමුව සවිමත් කිරීම මෙම නීති සම්පාදන සාර සංග්‍රහයේ අරමුණ වේ. මෙම වාර්තාව 2018 මාර්තු 29 වන දින ගරු අග්‍රාමාත්‍යවරයා වෙත පිළිගන්වන ලද අතර 2018 මැයි 18 වන දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඒ  සඳහා හිමි විය.



නව ආගාමික හා විගාමික පනතට අදාල රෙගුලාසි සකස් කිරීමේ වැඩමුළුව 2018 ජනවාරි 6 – 7



නව ආගාමික හා විගාමික පනතට ආදාල රෙගුලාසි සකස් කිරීමේ II වන වැඩමුළුව 2018.07.28-29



යෝජිත ආගාමික හා විගාමික පනත් කෙටුම්පතෙහි අන්තර්ගත විය යුතු යැයි අපේක්ෂිත විධි විධාන' ඇතුළත් වාර්තාව 2018 මාර්තු මස 29 වන දින ගරු අග්‍රාමාත්‍යවරයා වෙත පිළිගැන්වීම.

# 04. වීසා හා ප්‍රත්‍යන්ත පාලන අංශය

පාලක (වීසා හා ප්‍රත්‍යන්ත පාලන) ගේ අධීක්ෂණය යටතේ මෙම අංශය ක්‍රියාත්මක වේ. වීසා කටයුතු වීසා ශාඛාව මඟින්ද, ප්‍රත්‍යන්ත පාලන කටයුතු තොටුපල හා විමර්ශන ශාඛා මඟින්ද ක්‍රියාත්මක වේ.

## 04.1 වීසා ශාඛාව

1948 අංක 20 දරණ ආගාමික හා විගාමික පනතේ III කොටස මඟින් ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන තැනැත්තන් ශ්‍රී ලංකාවට ඇතුළු වීම පාලනය කරයි. ඒ යටතේ 1956 ආගාමික හා විගාමික රෙගුලාසි අංක 02 සිට අංක 35 ප්‍රකාරව ජාතික ආරක්ෂාව තහවුරු වන පරිදි ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයන් සඳහා මෙරට තුළ නීත්‍යානුකූලව රැඳී සිටීමට වලංගු වීසා බලපත් නිකුත් කිරීම හා වීසා දීර්ඝ කිරීම මෙම අංශය මඟින් සිදු කෙරේ. වීසා නිකුත් කිරීමෙන් ලබන වීසා ආදායම් සහ අත්‍යාවශ්‍ය ක්ෂේත්‍රයන්හි විදේශික සේවා නියුක්තියට පහසුකම් සැලසීම මඟින් ජාතික සංවර්ධනයට දායක වීම, වීසා ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම මූලික අරමුණ වේ.

### නේවාසික /වාස වීසා (Resident Visa)

විශේෂිත අරමුණු සඳහා ශ්‍රී ලංකාව තුල දීර්ඝකාලීනව වාසය කිරීමට අපේක්ෂා කරන පහත සඳහන් කාණ්ඩ වලට අයත් ශ්‍රී ලාංකිකයින් නොවන පුද්ගලයින්හට මෙම වීසාවන් නිකුත් කෙරේ.

1. සේවා නියුක්තිකයන්
   - ආයෝජන මණ්ඩල යටතේ ව්‍යාපෘති වල සේවයේ නියුක්ත වූවන්
   - රාජ්‍ය නොවන සංවිධාන වල සේවකයන්
   - විදේශ දූත මණ්ඩල යටතේ ඇති ආයතන වල සේවයේ නියුක්ත වූවන්
   - පෞද්ගලික සමාගම් / රාජ්‍ය අංශය මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘති වල සේවකයන්
2. ආයෝජන වර්ගයන්
   - ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රාග්ධනය ආයෝජනය කරන්නන්
   - ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරික කටයුතු වල නියුක්ත වූවන්
3. ආගමික කාර්යයන් සඳහා පැමිණෙන්නන්
   - පූජ්‍ය පක්ෂය
   - ආගමික ස්ථාන ඉදි කරන්නන් / ආවතේවකවරුන්
4. ශිෂ්‍යයන්
   - විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්
   - රජයේ අනුමත අධ්‍යාපනික ආයතන වල ශිෂ්‍යයන්
5. 1964 ඉන්දු ලංකා ගිවිසුමෙන් ආවරණය වන ලියාපදිංචි ඉන්දියානුවන්
6. හිටපු ශ්‍රී ලාංකිකයන් සහ ඔවුන්ගේ යැපෙන්නන්
7. ශ්‍රී ලාංකිකයෙකුගේ පවුලේ සාමාජිකයන්
   - ස්වාමිපුරුෂයා හෝ භාර්යාව
   - විදේශ ජාතිකත්වය හිමි ළමයි
8. ශ්‍රී ලංකාවේ පිහිටි විදේශ දූත මණ්ඩල වල සේවයේ යෙදී සිටින්නන් හා යැපෙන්නන්
9. මගේ සිහින නිවාස වීසා (My Dream Home)
10. ආගන්තුක වීසා (Residence Guest Scheme)
11. වෛද්‍ය හේතූන් මත රැඳී සිටින්නන්

## පැමිණීමේ වීසා (Visit Visa)

විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල මඟින් හා විද්‍යුත් සංචරණ අනුමැතිය යටතේ සංචාරක හෝ ව්‍යාපාරික කටයුතු වෙනුවෙන් කෙටි කාලීනව විදේශිකයන් වෙත මෙම වීසාවන් නිකුත් කරනු ලැබේ.

1. සංචාරක වීසා (Tourist Visa)
    - ශ්‍රී ලංකාවේ සංචාරය කිරීම, ඥාතීන් බැලීම, ආයුර්වේද ප්‍රතිකර්ම, යෝග හා භාවනා ආදී කටයුතු සඳහා කෙටි කාලීනව පැමිණෙන විදේශිකයන් වෙනුවෙන් විද්‍යුත් සංචරණ අනුමැතිය යටතේ දින 30ක කාලයක් හෝ ඉන් කොටසක් සඳහා මෙම වීසා නිකුත් කෙරේ.

2. සංචාරක නොවන කටයුතු වෙනුවෙන් වීසා (Business Visa)
    - සංචාරක නොවන කෙටි කාලීන ව්‍යාපාරික ස්වරූපයේ අනෙකුත් කටයුතු සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයන්ට මෙම වීසා නිකුත් කරයි. මේ සඳහා අදාළ කාර්යය තහවුරු කෙරෙන ලේඛන ඉදිරිපත් කළ යුතුය. (මේ යටතේ වැඩමුළු,සම්මන්ත්‍රණ,ප්‍රාසංගික කටයුතු,ව්‍යාපාරික සාකච්ඡා, ආයතනික වැඩ මුළු සඳහා සහභාගී වීම ආදිය)

## මාර්ගස්ථ වීසා (Transit Visa)

- ශ්‍රී ලංකාවෙන් බැහැරව වෙනත් රටක සිට තවත් රටක ගමනාන්තයක් කරා යන අතරතුරදී කෙටි කාලීනව ශ්‍රී ලංකාවට ඇතුළුවීම සඳහා නිකුත් කරනු ලබන වීසාවකි. මෙය දින 02ක උපරිමයකට යටත්ව නොමිලයේ නිකුත් කරනු ලැබේ.

උක්ත අරමුණු හා කාර්යයන් මෙහෙයවීම හා ක්‍රියාත්මක කිරීමට 2018 වර්ෂය සඳහා වීසා අංශයට අනුයුක්තව සිටි කාර්යය මණ්ඩලය පහත පරිදි විය.

| තනතුර/ සේවාව | සංඛ්‍යාව |
|---|---|
| පාලක | 01 |
| නියෝජ්‍ය පාලක | 01 |
| සහකාර පාලක | 03 |
| ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරි | 01 |
| බලයලත් නිලධාරි | 01 |
| සංවර්ධන නිලධාරී | 02 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 30 |
| ගමන් බලපත් සහකාර | 02 |
| කාර්යාල කාර්ය සහායක | 08 |

මීට අමතරව ගිණුම් අංශයෙන් සතිපතා අනුයුක්ත කරනු ලබන රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් දෙදෙනෙකු සරප් අංශයේ සේවයෙහි යෙදෙන ලදී.

## 2018 වසරේ වීසා පිළිබඳ ප්‍රගතිය

2014.01.01 සිට 2018.12.31 දක්වා විද්‍යුත් සංචරණ අනුමැතීන් ලබාදීම, නව වීසා නිකුත් කිරීම සහ දීර්ඝ කිරීම් ප්‍රමාණයන් පහත පරිදි වේ.

| විස්තරය | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| ඉ - සංචරණ අනුමැතිය ලබා දීම් | 1,283,789 | 1,736,520 | 2,191,516 | 2,392,219 | 2,307,541 |
| වාස වීසා නිකුත් කිරීම් | 19,298 | 20,131 | 22,673 | 26,634 | 25,831 |
| වාස වීසා දීර්ඝ කිරීම් | 22,008 | 23,220 | 22,483 | 26,949 | 29,948 |
| කෙටි කාලීන වීසා දීර්ඝ කිරීම් (සංචාරක , ව්‍යාපාරික සහ බහුවාර පිවිසුම් වීසා) | 54,322 | 59,135 | 60,109 | 58,220 | 63,452 |
| සාර්ක් වීසා | 664 | 943 | 1,209 | 1,410 | 1,564 |
| ද්විත්ව පුරවැසි භාවය ලබා ගැනීම හේතුවෙන් වීසා අවශ්‍යතාවයෙන් මුදා හැරීම් (ශ්‍රී ලාංකික) | - | 816 | 2,538 | 2,598 | 1,478 |
| එකතුව | 1,380,081 | 1,840,765 | 2,300,528 | 2,508,030 | 2,429,814 |



## වාස වීසා දීර්ඝ කිරීම් හා නිකුත් කිරීම් පිළිබඳ විස්තරාත්මක සටහන - 2018 වර්ෂය

| වාස වීසා වර්ගය | දීර්ඝ කිරීම් | නිකුත් කිරීම් | තානාපති කාර්යාල වෙත යවනු ලැබූ ෆැක්ස් පණිවුඩ | ගුවන් තොටුපල වෙත යවනු ලැබූ පණිවුඩ (Landing Endorsement) |
|---|---|---|---|---|
| ආයෝජන මණ්ඩල වල සේවයේ නියුතු | 5,595 | 4,554 | 5,896 | 95 |
| ශ්‍රී ලාංකික දෙමාපියන්ගේ දරුවන් | 273 | 781 | අදාල නොවේ | අදාල නොවේ |
| පුරවැසි පනතේ 5.2 වගන්තිය යටතේ | 357 | 1,073 | අදාල නොවේ | අදාල නොවේ |
| පුරවැසි පනතේ 5.1 වගන්තිය යටතේ | 94 | 314 | අදාල නොවේ | අදාල නොවේ |
| පූජ්‍ය පක්ෂය | 927 | 239 | 211 | 10 |
| උසාවි නියෝග | 151 | 17 | අදාල නොවේ | අදාල නොවේ |
| රාජ්‍යතාන්ත්‍රික | 261 | 319 | 453 | 15 |
| කලින් ශ්‍රී ලාංකිකයින්ව සිටි | 2,018 | 1,686 | අදාල නොවේ | අදාල නොවේ |
| වෛද්‍ය හේතූන් මත පැමිණි | 542 | 365 | අදාල නොවේ | අදාල නොවේ |
| රාජ්‍යය නොවන සංවිධාන(NGO+INGO) | 613 | 450 | 499 | 47 |
| රාජ්‍ය අංශයේ සේවයට පැමිණි | 4,708 | 4,506 | 4,349 | 344 |
| පුද්ගලික අංශයේ සේවයේ නියුතු | 5,413 | 5,782 | 3,702 | 170 |
| ලියාපදිංචි ඉන්දියානුවන් | 21 | 2 | අදාල නොවේ | අදාල නොවේ |
| ආගමික කාර්යයන් සඳහා පැමිණි | 463 | 513 | 549 | 6 |
| දීර්ඝ කාලීන නේවාසික වීසා (වසර 05) (RGS) | 29 | 7 | අදාල නොවේ | අදාල නොවේ |
| ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ කලත්‍රයන් | 3,766 | 1,113 | අදාල නොවේ | අදාල නොවේ |
| SSRV (My Dream Home) | 199 | 48 | අදාල නොවේ | අදාල නොවේ |
| රාජකාරි | 242 | 280 | 197 | - |
| ශිෂ්‍ය / ශිෂ්‍යත්වලාභීන් | 4,276 | 3,570 | 2,753 | 172 |
| ඉදිකිරීම් ක්ෂේත්‍රය | - | 212 | 187 | - |
| එකතුව | 29,948 | 25,831 | 18,796 | 859 |

## 2018 වර්ෂය තුලදී වීසා අංශය මගින් සිදු කරන ලද විශේෂ කාර්යයන්

1. රාජ්‍ය ආර්ථික ප්‍රතිපත්තියට අදාලව ජාත්‍යන්තර ආයෝජන ඉහල නංවමින් රටෙහි වාණිජ හා මූල්‍යක්ෂේත්‍රයන් දිරිගැන්වීමට පදනම සකසමින් 2017 අයවැය මඟින් යෝජිත නව වීසා ක්‍රමවේදයන් ක්‍රියාත්මක කරලීම සඳහා ආගාමික හා විගාමික පනතට අදාල සංශෝධන සිදුකිරීම හා ආනුෂාංගික රෙගුලාසි සංශෝධනයට අදාල කටයුතු.

   මෙහිදී විශේෂ අවධානයට යොමු වූ ප්‍රධාන ක්ෂේත්‍රයන් පහත දැක්වේ.

   - දැනට ශ්‍රී ලංකා රුපියල් වලින් අයකරනු ලබන වීසා ගාස්තු ඇමරිකා එක්සත් ජනපද ඩොලර් වලින් අය කිරීම.
   - වලංගු වීසා කාලය ඉක්මවා සිටින්නන්ගෙන් අදාල වීසා ගාස්තුවට අමතරව වීසා කාලය ඉක්මවා සිටීම මත දඩ මුදලක් වශයෙන් ඇමරිකානු ඩොලර් 500ක ගාස්තුවක් නියම කිරීම තුලින් නිශේධනාත්මක (Deterant effect)පියවරක් ගැනීම.
   - පුරවැසි පනත අනුව ද්විත්ව පුරවැසිභාවය ප්‍රදානය කිරීම සඳහා අයදුම්කිරීමට හැකියාවක් නොමැති දැනටමත් විදේශ රටක පුරවැසිභාවය ලබා ඇති ශ්‍රී ලාංකිකයන්ව සිටි පුද්ගලයින්ට ස්ථිර වාස වීසාවක් (Permanent Residence Visa) ලබා දීමට ක්‍රමයක් සැකසීම.

- ආයෝජකයින් දිරිගන්වනු පිණිස අදාල රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය පරිදි එකවර වසර 10ක වීසාවක් ලබා දීම. මෙහිදී අපේක්ෂිත ආයෝජන ගිණුම /අක් වෙරළ ගිණුම වැනි ගිණුම් හරහා ඇ.ඩො. 500,000 අවමයකට යටත්වූ ආයෝජනයක් සපුරාලිය යුතු බවට යෝජනා කෙරේ.

- දැනට ඊ-සංචරණ පද්ධතියට (ETA)ඇතුලත්ව නොමැති මාලදිවයින, සිංගප්පූරුව, ෂී ෂෙල්ස් යන රටවල්ද ඊ-සංචරණ පද්ධතියට ඇතුලත් කර ගැනීම, එසේම අවුරුදු 12ට අඩු දරුවන්ද එම පද්ධතියට ඇතුලත් කර ගැනීම.

2. ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයන්ගේ විදේශ ගමන් බලපත් හි ආගමනය වූ බවට සලකුණු කරමින් හා වීසා කාලය දක්වමින් තොටුපලේ දී ලබා දෙන ස්ටිකරය (On Arrival Visa Stickers) මුද්‍රණය කිරීම සඳහා නව මුද්‍රණ යන්ත්‍ර මිල දී ගැනීමට අදාල කටයුතු සිදු කිරීම.

3. ශ්‍රී ලංකාව තුළ ආයෝජනය කිරීම පහසු කරලීම සඳහාත් ආයෝජන සේවා සැපයීම සඳහාත් තනි කවුළු ආයෝජන පහසුකම් සැලසීමේ කාර්ය සාධන බලකායක් පිහිටුවීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිවන ලදී. එම කාර්ය සාදන බලකායේ යොමු කිරීම් අනුදේශ අනුව ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ අදාල නියාමන ආයතන අතර අවබෝධතා ගිවිසුම් අත්සන් කළ යුතු අතර ඒ අනුව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව අතර අවබෝධතා ගිවිසුමකට අත්සන් තබන ලදී.



## 2019 වර්ෂය සඳහා අපේක්ෂිත වැඩසටහන් හා ව්‍යාපෘතීන්

### 1. වීසා ස්ටිකර් මුද්‍රණ යන්ත්‍ර මිළ දී ගැනීම

වීසා ස්ටිකර් මුද්‍රණය කිරීම වෙනුවෙන් වීසා අංශය විසින් දැනට භාවිත කරනු ලබන්නේ සාමාන්‍ය ලිපි මුද්‍රණය සඳහා භාවිතා කරනු ලබන HP OFFICE JET 7110 වර්ගයේ වර්ණ පිටපත් මුද්‍රණ යන්ත්‍ර වේ. එමගින් ස්ටිකර් මුද්‍රණය කිරීමේදී සිදු වන දෝෂ අවම කරලීම සඳහා වීසා ස්ටිකර් මුද්‍රණය කිරීම සඳහාම යොදා ගත හැකි නව මුද්‍රණ යන්ත්‍ර මිලදී ගැනීමට කටයුතු කිරීම.

### 2. මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ වාස වීසා අයදුම්පත්‍ර ලබා ගැනීම

දැනට අනුගමනය කරන ක්‍රමවේදය අනුව අයදුම්පත් භාරගෙන සීමිත තොරතුරු ප්‍රමාණයක් පරිගණක පද්ධතියට ඇතුලත් කරනු ලබන අතර ලිපි ගොණුව පරිලෝකණය කර ගබඩා කරනු ලබයි. මෙමගින් පසු කාලීනව යම් පුද්ගලයකුගේ වැඩිමනත් තොරතුරු සොයා ගැනීම අපහසු වී

ඇත. මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීමට ඉඩ ලබාදීම හේතුවෙන් වීසා ලබාගන්නා පුද්ගලයන් පිළිබඳ තොරතුරු පද්ධතිය යාවත්කාලීන කර ගැනීමටත් පුද්ගලයන් පැමිණීමට පෙර ඒ පිළිබඳ තීරණ ගැනීමටත් හැකිවනු ඇත. එබැවින් අංශයේ කාර්යක්ෂමතාවය මේ හරහා වැඩිදියුණු වන අතරම ඵලදායී ලෙස යොදාගත හැකි දත්ත පද්ධතියක් සකස් කර ගැනීමටද අවස්ථාව ලැබෙනු ඇත.

## 04 : 2 තොටුපළ ශාඛාව

ජාතික ආරක්ෂාව තහවුරු වන පරිදි ආර්ථික සංවර්ධනය ප්‍රශස්ථ මට්ටමක පවත්වාගෙන යමින් ශ්‍රී ලංකාවේ අනුමත තොටුපලවල් හරහා මෙරටට පැමිණෙන හා මෙරටින් පිටව යන විදේශිකයන්ට මෙන්ම ශ්‍රී ලාංකිකයන්ටද කාර්යක්ෂම සේවාවක් ලබා දීම සහ තොටුපලවල් හරහා සිදුවන මගීන්ගේ ආගමන විගමන කටයුතු පාලනය කිරීම (ප්‍රත්‍යන්ත පාලනය) මෙම ශාඛාව මගින් සිදු වන අතර එයට අදාල පහසුකම් සැපයීම, වෙනත් ආධාරක සේවා සැපයීම සහ විමර්ශන කටයුතු සිදුකිරීමද මෙම අංශයෙන් සිදු කරනු ලබයි.

**කාර්යයන්**

1. ශ්‍රී ලංකාවට පැමිණෙන හා ශ්‍රී ලංකාවෙන් පිටවන මගීන්ගේ නිෂ්කාශන කටයුතු ඉටුකිරීම.
2. විදෙස් රටවල තානාපති කාර්යාල ශ්‍රී ලංකාව තුල ස්ථාපනය කර නොමැති රටවල් සඳහා ඇතුළුවීමට අවශ්‍ය වීසා ලබා ගැනීමට අවශ්‍ය වන පුද්ගලයන්ගේ ගමන් බලපත් අදාල තානාපති කාර්යාල ඇති රටවල් වෙත තැපැල් මගින් යැවීම (කුරියර් කිරීම) සඳහා අනුමැතිය ලබා දීම.
3. ශ්‍රී ලංකාවේ අනුමත වරායක නැංගුරම් ලා තිබෙන නැවක නාවික කාර්ය මණ්ඩලයට තාවකාලිකව ගොඩබිමට පැමිණීමට අවසර පත්‍ර නිකුත් කිරීම.
4. ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශික නාවික කාර්ය මණ්ඩල සඳහා බැඳුම්කර (ස්ටිකර්) නිකුත් කිරීම.
5. විදේශ ගත වූ මගීන්ගේ ආගමන විගමන තොරතුරු ඇතුලත් ලිපි විවිධ ආයතනවල අවශ්‍යතාවය අනුව නිකුත් කිරීම.
6. ශ්‍රී ලංකාවට විද්‍යුත් සංචරණ අනුමැතිය (ETA) නොමැතිව පැමිණෙන සංචාරකයන් හට තොටුපලවලදී විද්‍යුත් සංචරණ අනුමැතිය (ETA) ලබා දීම.
7. උසාවි මගින් නිකුත් කර ඇති රටින් පිටවීම හා මෙරටට පැමිණීම තහනම් නියෝග ක්‍රියාත්මක කිරීම හා වෙනත් ආයතන මගින් පුද්ගලයන් රටින් පිටවීම හා රටට පැමිණීම පිළිබඳව විමසා එවන ලිපි සම්බන්ධ රාජකාරී
8. ශ්‍රී ලංකාවෙන් පිටවීමේදී හා ශ්‍රී ලංකාවට පැමිණීමේදී තොටුපලවලදී මගීන් විසින් සම්පූර්ණ කළ යුතු ආගමන/ විගමන පත්‍රිකා නිකුත් කිරීම.
9. තොටුපල වලට අනුයුක්ත ආගමන හා විගමන නිලධාරීන්ගේ සේවාවන් මෙහෙය වීම, අධීක්ෂණය කිරීම, සමාලෝචනය කිරීම හා යාවත්කාලීන කිරීම.

**කාර්ය මණ්ඩලය - 2018**

| තනතුර/සේවාව | සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය පාලක | 01 |
| සහකාර පාලක | 03 |
| ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරීන් | 30 |
| බලයලත් නිලධාරීන් | 387 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 06 |
| කාර්යාල සේවක සේවය | 04 |

# අනුමත ඇතුල්වීමේ හා පිටත්වීමේ තොටුපල

1. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල - කටුනායක
2. මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපල - මත්තල
3. කොළඹ ගුවන් තොටුපල - රත්මලාන
4. පලාලි ගුවන් තොටුපල
5. කොග්ගල ගුවන් තොටුපල
6. කොළඹ වරාය
7. ගාල්ල වරාය
8. රුහුණු මාගම්පුර මහින්ද රාජපක්ෂ වරාය
9. ත්‍රිකුණාමල වරාය
10. කන්කසන්තුරේ වරාය
11. තලේමන්නාරම් ජැටිය
12. නොරොච්චෝලේ වරාය
13. ඔලුවිල් වරාය

**එක් එක් තොටුපලවල් හරහා පැමිණි හා පිටත් වූ පුද්ගලයින් සංඛ්‍යාව - 2018**

| තොටුපල | පැමිණි සංඛ්‍යාව | පිටත් වූ සංඛ්‍යාව | එකතුව |
|---|---|---|---|
| කටුනායක ගුවන් තොටුපල | 3,946,633 | 3,933,567 | 7,880,200 |
| හම්බන්තොට වරාය | 1,549 | 1,401 | 2,950 |
| මත්තල ගුවන් තොටුපල | 1,237 | 1,678 | 2,915 |
| කොළඹ වරාය | 70,751 | 69,230 | 139,981 |
| ගාල්ල වරාය | 16,753 | 14,647 | 31,400 |
| නොරොච්චෝලේ වරාය | 215 | 141 | 356 |
| ත්‍රිකුණාමලය වරාය | 1,141 | 2,210 | 3,351 |
| රත්මලාන ගුවන් තොටුපල | 73 | 57 | 130 |
| තලේමන්නාරම් ජැටිය | 2 | 2 | 4 |
| **එකතුව** | **4,038,354** | **4,022,933** | **8,061,287** |






**ශ්‍රී ලංකාවට පැමිණි හා පිටවූ ශ්‍රී ලාංකිකයන් හා විදේශිකයන් සංඛ්‍යාව මාසිකව - 2018**

| මාසය | පැමිණි සංඛ්‍යාව | | | පිටත් වූ සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|
| | ශ්‍රී ලාංකික පුරවැසියන් | විදේශිකයන් | පැමිණි මුළු සංඛ්‍යාව | ශ්‍රී ලාංකික පුරවැසියන් | විදේශිකයන් | පිටත් වූ මුළු සංඛ්‍යාව |
| ජනවාරි | 124,530 | 260,840 | 385,370 | 121,697 | 286,450 | 408,147 |
| පෙබරවාරි | 100,783 | 253,782 | 354,565 | 107,871 | 257,551 | 365,422 |
| මාර්තු | 119,828 | 247,683 | 367,511 | 116,378 | 252,912 | 369,290 |
| අප්‍රේල් | 149,305 | 187,235 | 336,540 | 145,492 | 213,876 | 359,368 |
| මැයි | 113,610 | 150,495 | 264,105 | 107,054 | 164,330 | 271,384 |
| ජූනි | 119,891 | 166,343 | 286,234 | 97,863 | 146,713 | 244,576 |
| ජූලි | 132,119 | 241,880 | 373,999 | 116,186 | 202,975 | 319,161 |
| අගෝස්තු | 141,246 | 222,691 | 363,937 | 156,016 | 257,151 | 413,167 |
| සැප්තැම්බර් | 121,336 | 168,585 | 289,921 | 149,742 | 183,076 | 332,818 |
| ඔක්තෝබර් | 115,267 | 173,582 | 288,849 | 122,956 | 174,978 | 297,934 |
| නොවැම්බර් | 110,889 | 205,935 | 316,824 | 108,194 | 193,162 | 301,356 |
| දෙසැම්බර් | 140,902 | 269,597 | 410,499 | 126,489 | 213,821 | 340,310 |
| **එකතුව** | **1,489,706** | **2,548,648** | **4,038,354** | **1,475,938** | **2,546,995** | **4,022,933** |



## ශ්‍රී ලංකාවට පැමිණි විදේශිකයන් සංඛ්‍යාව කලාප අනුව - 2018

| මාසය | අප්‍රිකාව | ආසියාව | ඔස්ට්‍රේලියාව | යුරෝපය | උතුරු ඇමරිකාව | දකුණු ඇමරිකාව | ඇන්ටාර්ක්ටිකාව | හඳුනා නොගත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | 2,458 | 113,183 | 12,464 | 117,904 | 14,014 | 701 | 0 | 116 | **260,840** |
| පෙබරවාරි | 1,846 | 111,026 | 7,390 | 121,728 | 11,036 | 649 | 0 | 107 | **253,782** |
| මාර්තු | 2,148 | 102,392 | 11,128 | 116,939 | 14,114 | 794 | 0 | 168 | **247,683** |
| අප්‍රේල් | 1,946 | 89,015 | 13,310 | 69,959 | 11,849 | 1,037 | 0 | 119 | **187,235** |
| මැයි | 1,207 | 97,096 | 6,786 | 36,395 | 8,386 | 409 | 0 | 216 | **150,495** |
| ජූනි | 1,762 | 97,513 | 11,577 | 43,698 | 11,370 | 303 | 0 | 120 | **166,343** |
| ජූලි | 2,325 | 111,629 | 11,834 | 100,588 | 15,008 | 403 | 0 | 93 | **241,880** |
| අගෝස්තු | 2,316 | 111,306 | 11,087 | 86,054 | 11,411 | 396 | 0 | 121 | **222,691** |
| සැප්තැම්බර් | 1,880 | 89,348 | 11,372 | 57,600 | 7,865 | 380 | 0 | 140 | **168,585** |
| ඔක්තෝබර් | 1,511 | 93,753 | 9,102 | 61,479 | 7,185 | 420 | 1 | 131 | **173,582** |
| නොවැම්බර් | 1,787 | 96,247 | 11,483 | 86,273 | 9,464 | 592 | 0 | 89 | **205,935** |
| දෙසැම්බර් | 3,714 | 114,021 | 20,540 | 115,136 | 15,480 | 651 | 0 | 55 | **269,597** |
| **එකතුව** | **24,900** | **1,226,529** | **138,073** | **1,013,753** | **137,182** | **6,735** | **1** | **1,475** | **2,548,648** |




## ශ්‍රී ලංකාවට පැමිණි ශ්‍රී ලාංකිකයින් සංඛ්‍යාව තොටුපල හා මාස අනුව - 2018

| තොටුපල | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කටුනායක ගුවන් තොටුපල | 124,260 | 100,539 | 119,068 | 148,999 | 113,114 | 119,626 | 131,844 | 140,877 | 120,945 | 114,643 | 110,567 | 140,409 | **1,484,891** |
| හම්බන්තොට වරාය | 3 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 3 | 0 | 0 | 0 | 0 | **7** |
| මත්තල ගුවන් තොටුපල | 60 | 29 | 60 | 72 | 48 | 14 | 0 | 0 | 0 | 0 | 0 | 0 | **283** |
| කොළඹ වරාය | 49 | 68 | 483 | 47 | 258 | 79 | 64 | 171 | 212 | 364 | 76 | 206 | **2,077** |
| ගාල්ල වරාය | 134 | 121 | 182 | 155 | 178 | 172 | 209 | 192 | 173 | 257 | 222 | 270 | **2,265** |
| නොරොච්චෝලේ වරාය | 13 | 15 | 30 | 25 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 14 | 7 | **104** |
| ත්‍රිකුණාමලය වරාය | 5 | 11 | 4 | 4 | 12 | 0 | 2 | 3 | 6 | 3 | 10 | 4 | **64** |
| රත්මලාන ගුවන් තොටුපල | 6 | 0 | 0 | 3 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 6 | **15** |
| **එකතුව** | **124,530** | **100,783** | **119,828** | **149,305** | **113,610** | **119,891** | **132,119** | **141,246** | **121,336** | **115,267** | **110,889** | **140,902** | **1,489,706** |

## ශ්‍රී ලංකාවට පැමිණි විදේශිකයින් සංඛ්‍යාව තොටුපල හා මාස අනුව - 2018

| තොටුපල | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කටුනායක ගුවන් තොටුපල | 250,999 | 248,190 | 232,687 | 167,741 | 146,190 | 162,767 | 240,121 | 220,853 | 165,756 | 170,680 | 194,514 | 261,244 | **2,461,742** |
| හම්බන්තොට වරාය | 6 | 3 | 303 | 634 | 459 | 5 | 0 | 33 | 6 | 24 | 13 | 56 | **1,542** |
| මත්තල ගුවන් තොටුපල | 116 | 170 | 234 | 87 | 51 | 7 | 0 | 4 | 0 | 59 | 207 | 19 | **954** |
| කොළඹ වරාය | 8,379 | 4,189 | 12,690 | 17,679 | 2,472 | 2,572 | 617 | 576 | 1,455 | 1,499 | 9,851 | 6,695 | **68,674** |
| ගාල්ල වරාය | 1,261 | 1,173 | 1,197 | 1,039 | 1,233 | 981 | 1,132 | 1,108 | 1,272 | 1,259 | 1,287 | 1,546 | **14,488** |
| නොරොච්චෝලේ වරාය | 26 | 9 | 28 | 0 | 0 | 0 | 0 | 0 | 26 | 0 | 21 | 1 | **111** |
| ත්‍රිකුණාමලය වරාය | 31 | 40 | 542 | 41 | 86 | 11 | 10 | 117 | 70 | 59 | 42 | 28 | **1,077** |
| රත්මලාන ගුවන් තොටුපල | 22 | 8 | 0 | 14 | 4 | 0 | 0 | 0 | 0 | 2 | 0 | 8 | **58** |
| තලේමන්නාරම් ජැටිය | 0 | 0 | 2 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | **2** |
| එකතුව | **260,840** | **253,782** | **247,683** | **187,235** | **150,495** | **166,343** | **241,880** | **222,691** | **168,585** | **173,582** | **205,935** | **269,597** | **2,548,648** |

## ශ්‍රී ලංකාවෙන් පිටවූ ශ්‍රී ලාංකිකයින් සංඛ්‍යාව තොටුපල හා මාස අනුව - 2018

| තොටුපල | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කටුනායක ගුවන් තොටුපල | 121,432 | 107,548 | 115,817 | 144,986 | 106,731 | 97,613 | 115,847 | 155,662 | 149,525 | 122,393 | 107,754 | 126,173 | **1,471,481** |
| හම්බන්තොට වරාය | 3 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 2 | 0 | 0 | **5** |
| මත්තල ගුවන් තොටුපල | 82 | 44 | 57 | 74 | 89 | 12 | 0 | 0 | 0 | 0 | 0 | 0 | **358** |
| කොළඹ වරාය | 36 | 81 | 66 | 76 | 60 | 66 | 198 | 62 | 72 | 373 | 203 | 88 | **1,381** |
| ගාල්ල වරාය | 134 | 171 | 138 | 137 | 157 | 172 | 137 | 140 | 138 | 187 | 222 | 217 | **1,950** |
| නොරොච්චෝලේ වරාය | 7 | 15 | 14 | 22 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 6 | 5 | **69** |
| ත්‍රිකුණාමලය වරාය | 3 | 12 | 286 | 194 | 17 | 0 | 4 | 152 | 7 | 1 | 9 | 0 | **685** |
| රත්මලාන ගුවන් තොටුපල | 0 | 0 | 0 | 3 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 6 | **9** |
| එකතුව | **121,697** | **107,871** | **116,378** | **145,492** | **107,054** | **97,863** | **116,186** | **156,016** | **149,742** | **122,956** | **108,194** | **126,489** | **1,475,938** |

## ශ්‍රී ලංකාවෙන් පිටවූ විදේශිකයින් සංඛ්‍යාව තොටුපල හා මාස අනුව - 2018

| තොටුපල | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කටුනායක ගුවන් තොටුපල | 276,688 | 252,038 | 238,074 | 194,420 | 160,330 | 143,360 | 201,444 | 255,589 | 180,394 | 172,095 | 182,002 | 205,652 | **2,462,086** |
| හම්බන්තොට වරාය | 6 | 4 | 686 | 3 | 1 | 1 | 2 | 22 | 2 | 12 | 644 | 13 | **1,396** |
| මත්තල ගුවන් තොටුපල | 199 | 206 | 271 | 280 | 81 | 9 | 0 | 4 | 0 | 58 | 205 | 7 | **1,320** |
| කොළඹ වරාය | 7,870 | 3,737 | 12,747 | 18,198 | 2,794 | 2,556 | 574 | 580 | 1,507 | 1,702 | 8,685 | 6,899 | **67,849** |
| ගාල්ල වරාය | 917 | 1,419 | 1,100 | 872 | 1,033 | 777 | 935 | 866 | 1,116 | 1,044 | 1,544 | 1,074 | **12,697** |
| නොරොච්චෝලේ වරාය | 13 | 0 | 0 | 41 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 18 | 0 | **72** |
| ත්‍රිකුණාමලය වරාය | 751 | 125 | 26 | 55 | 87 | 10 | 20 | 90 | 57 | 64 | 64 | 176 | **1,525** |
| රත්මලාන ගුවන් තොටුපල | 6 | 22 | 6 | 7 | 4 | 0 | 0 | 0 | 0 | 3 | 0 | 0 | **48** |
| තලේමන්නාරම් ජැටිය | 0 | 0 | 2 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | **02** |
| එකතුව | **286,450** | **257,551** | **252,912** | **213,876** | **164,330** | **146,713** | **202,975** | **257,151** | **183,076** | **174,978** | **193,162** | **213,821** | **2,546,995** |

# රට තුලට ඇතුල්වීමට අවසර නොදුන් විදේශිකයන් (Refused Entry)- 2018

| | ජාතිය | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | බංග්ලාදේශ | | | 03 | 04 | 04 | 02 | | | 01 | 02 | | | 16 |
| 2 | ඉන්දියානු | 35 | 19 | 30 | 41 | 25 | 40 | 37 | 18 | 20 | 11 | 04 | 05 | 285 |
| 4 | පලස්තීන | | 01 | | | | 01 | | | | 02 | | | 04 |
| 5 | කැමරූන් | 02 | | | | 01 | | | | | | | | 03 |
| 6 | පාකිස්ථානු | 56 | 40 | 41 | 08 | 20 | 31 | 22 | 32 | 61 | 62 | 13 | 41 | 427 |
| 7 | චීන | 12 | 03 | 25 | 16 | 23 | 11 | 05 | 07 | 05 | 10 | | 07 | 124 |
| 9 | ඇෆ්ගනිස්ථානු | | | 04 | 08 | 03 | | 02 | 01 | | | | | 18 |
| 11 | ඉන්දුනීසියානු | | | | | 02 | | | | | | | | 02 |
| 12 | ප්‍රංශ | | | 01 | | | | 02 | | | | | | 03 |
| 14 | නයිජීරියන් | 09 | 09 | 13 | 13 | 06 | 03 | 02 | 04 | 03 | 02 | 02 | 01 | 67 |
| 15 | ඇමෙරිකන් | | 01 | | 01 | | 01 | | 01 | | 01 | | | 05 |
| 16 | ඉරාන | 10 | 01 | 03 | | | | 12 | 01 | 01 | | | | 28 |
| 18 | යුක්රේන | | 01 | | 01 | | | | | | | | | 02 |
| 19 | බ්‍රිතාන්‍ය | | | | 01 | | 01 | | | 02 | | | 01 | 05 |
| 20 | මාලදිවයින් | 02 | | | | | | | | 01 | 01 | | 01 | 05 |
| 22 | කැනේඩියානු | 01 | 01 | | | | 01 | | | 01 | | 01 | | 05 |
| 26 | නේපාල | 02 | 01 | | | | | 01 | 02 | 03 | | | 04 | 13 |
| 27 | තායිලන්ත | 01 | | | | 02 | | 01 | 01 | 05 | 03 | | 01 | 14 |
| 28 | නෙදර්ලන්ත | | | | | | 01 | | | | | | | 01 |
| 30 | පිලිපීන | | | | 03 | 02 | 06 | | 02 | 03 | 04 | | | 20 |
| 31 | ඝානා | | | | | | | | | 01 | | | 01 | 02 |
| 33 | කොරියානු | | | | | | 01 | | | 01 | | | | 02 |
| 34 | ඊජිප්තු | | 01 | 01 | | 01 | | | 01 | | | | 01 | 05 |
| 37 | මියන්මාර් | | | | 01 | 01 | | | 01 | 01 | | 06 | | 10 |
| 41 | නෝර්වේ | | | | | | | | | | 02 | | | 02 |
| 42 | උස්බෙකිස්ථානු | | | 01 | 01 | | | | | | | | 02 | 04 |
| 49 | කාම්බෝජ | | | | 01 | | | | | | | | | 01 |
| 50 | ඇල්බේනියා | | | | | | | | | | 01 | | | 01 |
| 52 | කොන්ගෝ | | | | | | | | 01 | | | | | 01 |
| 53 | සුඩාන් | | 01 | | 04 | | | 01 | | | | | | 06 |
| 55 | ටියුනීසියානු | | | | 01 | | | | | | | | | 01 |
| 58 | සෝමාලියානු | | | | | | | | | | | 01 | | 01 |
| 59 | එස්තෝනියන් | 01 | | | | | | | | | | | | 01 |
| 60 | යේමන් | 01 | | | | | 01 | | | | | | | 02 |
| 61 | ඊශ්‍රායල් | | 01 | | | | | | | | 01 | | | 02 |
| 62 | ලැට්වියානු | | 01 | | | | | | | | | | | 01 |
| 63 | චෙක්රිපබ්ලික් | | 02 | | | | | | 02 | | | | | 04 |
| 64 | කිර්ගිස්තාන් | | | 01 | | | | | | | | | | 01 |
| 65 | පෝලන්ත | | | 01 | | | | | | | | | | 01 |
| 66 | සැම්බියානු | | | | 01 | | | | | | | | | 01 |
| 67 | කොම්රෝස් | | | | | | 01 | | | | | | | 01 |
| 68 | වියට්නාම් | | | | | | 04 | | | | | | | 04 |
| 69 | සවුදි | | | | | | | 01 | 01 | | | | | 02 |
| 70 | අයිවරි කෝට්ස් | 01 | | | | | | | 01 | 01 | | | | 03 |
| 71 | කොලොම්බියානු | | | | | | | | | 01 | | 01 | | 02 |
| 72 | මොරොක්කෝ | | | | | | | | | | 01 | | | 01 |
| 73 | ස්ලෝවේනියානු | | | | | | | | | | 02 | | | 02 |
| 74 | බෙල්ජියම් | | | | | | | | | | | 01 | | 01 |
| 75 | කසකස්තාන් | | | | | | | | | | | | 01 | 01 |
| | එකතුව | 133 | 83 | 124 | 105 | 90 | 105 | 86 | 76 | 111 | 105 | 29 | 66 | 1113 |

**විදේශිකයන්ට රට තුළට ඇතුල්වීමට අවසර ලබා නොදීමට හේතු:-**

1. නිර්ව්‍යාජ සංචාරකයකු නොවීම.
2. ව්‍යාජ ගමන් බලපත්‍ර භාවිතය.
3. විධිමත් වීසාවක් ලබා නොතිබීම.
4. මීට පෙර ආගාමික හා විගාමික පනත උල්ලංඝනය කිරීම මත මෙරටින් ඉවත් කර තිබීම.
5. අසාධු ලේඛනගත කිරීම.
6. විද්‍යුත් සංචරණ අනුමැතිය ලබා නොතිබීම.
7. ප්‍රමාණවත් මුදල් නොතිබීම.
8. ආපසු යාමේ ගුවන් ටිකට් පත නොමැති වීම.

**ගමන් බලපත්‍ර ශ්‍රී ලංකාවෙන් පිටතට යැවීම (කූරියර් කිරීම) සඳහා අනුමැතිය දීම.**

ආගාමික හා විගාමික පනතට අනුව ආගමන විගමන පාලක ජනරාල්වරයාගේ පූර්ව ලිඛිත අවසරයකින් තොරව ගමන් බලපත්‍ර හිමිකරු නොමැතිව ගමන් බලපත්‍රයක් තැපෑලෙන් හෝ අන් අයුරකින් වෙනත් රටකට යැවීම නීතිවිරෝධී වේ. ඒ අනුව ශ්‍රී ලංකාව තුළ තානාපති කාර්යාල පිහිටා නොමැති රටවලට ඇතුළුවීමට අවශ්‍ය වන වීසා ලබාගැනීම සඳහා එම රටවල්වල තානාපති කාර්යාල පිහිටා ඇති රටකට ගමන් බලපත්‍ර යැවීම සඳහා මෙම දෙපාර්තමේන්තුව මඟින් අනුමැතිය ලබා දේ. (උදා: නවසීලන්ත වීසා ලබාගැනීම සඳහා ඉන්දියාවේ නවදිල්ලි නුවර නවසීලන්ත මහ කොමසාරිස් කාර්යාලය වෙත ගමන් බලපත්‍ර කූරියර් කරනු ලැබේ.)

ඒ අනුව 2018 වර්ෂය තුළදී ගමන් බලපත්‍ර 26718 ක් දෙපාර්තමේන්තු අනුමැතිය යටතේ කූරියර් කිරීමට අවසර ලබා දී ඇති අතර ඒ සඳහා එක් ගමන් බලපත්‍රයක් වෙනුවෙන් රු:1000.00 ක මුදලක් අය කරනු ලැබේ. එමගින් රු:26,718,000.00 (රුපියල් මිලියන 26.718) ආදායමක් උපයා ඇත.

**2018 වර්ෂය තුළදී කූරියර් කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇති ගමන් බලපත්‍ර සංඛ්‍යාව**

| මාසය | කූරියර් කළ ප්‍රමාණය | ආදායම (ඒකක වටිනාකම රු:1000.00) |
|---|---|---|
| ජනවාරි | 1729 | 1729000 |
| පෙබරවාරි | 2196 | 2196000 |
| මාර්තු | 2438 | 2438000 |
| අප්‍රියෙල් | 1830 | 1830000 |
| මැයි | 2681 | 2681000 |
| ජූනි | 2634 | 2634000 |
| ජූලි | 3028 | 3028000 |
| අගෝස්තු | 2494 | 2494000 |
| සැප්තැම්බර් | 1905 | 1905000 |
| ඔක්තෝබර් | 2282 | 2282000 |
| නොවැම්බර් | 1941 | 1941000 |
| දෙසැම්බර් | 1560 | 1560000 |
| **එකතුව** | **26718** | **26718000** |

ගමන් බලපත්‍ර කුරියර් කිරීම 2014 - 2018

| මාසය | කුරියර් කළ ප්‍රමාණය | ආදායම (ඒකක වටිනාකම රු:1000.00) |
|---|---|---|
| **2014** | 26286 | 26,286,000 |
| **2015** | 28820 | 28,820,000 |
| **2016** | 30676 | 30,676,000 |
| **2017** | 30529 | 30,529,000 |
| **2018** | 26718 | 26,718,000 |
| එකතුව | 143029 | 143,029,000 |

**ශ්‍රී ලංකාවේ අනුමත වරායක නැංගුරම් ලා තිබෙන නැවක නාවික කාර්ය මණ්ඩලයට තාවකාලිකව ගොඩබිමට පැමිණීමට අවසර පත්‍ර නිකුත් කිරීම.**

| තොටුපළ | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| කොළඹ වරාය | 65988 | 86102 | 91122 | 86753 | 88158 | 61664 | 479787 |
| ගාල්ල වරාය | 1442 | 1696 | 2177 | 2269 | 1341 | 1596 | 10521 |
| නොරොච්චෝලේ වරාය | - | - | - | - | - | 209 | 209 |
| ත්‍රිකුණාමලය වරාය | 2 | 0 | 105 | 0 | 0 | 2334 | 2441 |
| හම්බන්තොට වරාය | - | - | - | - | - | 345 | 345 |
| **එකතුව** | **67432** | **87798** | **93404** | **89022** | **89499** | **66148** | **493303** |

**විදේශික නාවික කාර්ය මණ්ඩල සඳහා බැඳුම්කර (ස්ටිකර්) නිකුත් කිරීම**

නාවික කාර්යමණ්ඩලවල සෑම සාමාජිකයෙකුම රටට ඇතුළුවීමට ප්‍රථම බැඳුම්කරයකට අත්සන් කළ යුතු වන අතර, ඒ සඳහා රුපියල් 1000.00 ක බැඳුම්කර ගාස්තුවක් අයකෙරේ. ශ්‍රී ලංකාවට පැමිණෙන නැව්වල සේවයට යන විදේශිකයින් හා නැව්වල සේවය කර ශ්‍රී ලංකාවෙන් බැහැර වන විදේශිකයින් සඳහා මෙම බැඳුම්කර නිකුත් කරන අතර, අදාළ බැඳුම්කර ගාස්තුව රටට ඇතුළුවන්නාගේ මෙරට නියෝජිතයා විසින් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුවේ. අදාළ ගාස්තු ගෙවීමෙන් පසු තීරු සංකේත සහිත ස්ටිකරයක් නියෝජිතයා වෙත නිකුත් කරනු ලැබේ.

නාවික කාර්ය මණ්ඩල සඳහා බැඳුම්කර (ස්ටිකර්) නිකුත් කිරීම - මාසිකව ආදායම 2018

| මාසය | නිකුත් කළ ස්ටිකර් ප්‍රමාණය | ආදායම (ඒකක වටිනාකම රු:1000.00) |
|---|---|---|
| ජනවාරි | 3458 | 3458000 |
| පෙබරවාරි | 3849 | 3849000 |
| මාර්තු | 3209 | 3209000 |
| අප්‍රේල් | 3265 | 3265000 |
| මැයි | 2442 | 2442000 |
| ජූනි | 3410 | 3410000 |
| ජූලි | 2678 | 2678000 |
| අගෝස්තු | 2828 | 2828000 |
| සැප්තැම්බර් | 3764 | 3764000 |
| ඔක්තෝබර් | 2607 | 2607000 |
| නොවැම්බර් | 3984 | 3984000 |
| දෙසැම්බර් | 2679 | 2679000 |
| **එකතුව** | **38173** | **38173000** |

බැඳුම්කර (ස්ටිකර්) නිකුත් කිරීම 2014 - 2018

| මාසය | නිකුත් කළ ස්ටිකර් ප්‍රමාණය | ආදායම (ඒකක වටිනාකම රු:1000.00) |
|---|---|---|
| **2014** | 46194 | 46,194,000 |
| **2015** | 44841 | 44,841,000 |
| **2016** | 35573 | 35,573,000 |
| **2017** | 37532 | 37,532,000 |
| **2018** | 38173 | 38,173,000 |
| එකතුව | 202313 | 202,313,000 |

## නෞකා කාර්ය මණ්ඩලය පැමිණීම - 2018

| මාසය | කොළඹ වරාය | ගාල්ල වරාය | ත්‍රිකුණාමලය වරාය | නොරොච්චෝලේ වරාය | හම්බන්තොට වරාය | එකතුව |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | 587 | 1268 | 31 | 14 | 04 | **1904** |
| පෙබරවාරි | 553 | 1141 | 28 | 40 | 02 | **1764** |
| මාර්තු | 685 | 1323 | 23 | 57 | 06 | **2094** |
| අප්‍රියෙල් | 536 | 1095 | 26 | 42 | 04 | **1703** |
| මැයි | 547 | 1286 | 62 | - | 27 | **1922** |
| ජූනි | 656 | 1111 | 11 | - | 01 | **1779** |
| ජූලි | 610 | 1274 | 15 | - | - | **1899** |
| අගෝස්තු | 595 | 1222 | 118 | - | 33 | **1968** |
| සැප්තැම්බර් | 550 | 1296 | 74 | 12 | 01 | **1933** |
| ඔක්තෝබර් | 504 | 1433 | 55 | - | 22 | **2014** |
| නොවැම්බර් | 509 | 1424 | 53 | 41 | 11 | **2038** |
| දෙසැම්බර් | 576 | 1544 | 18 | 07 | 31 | **2176** |
| **එකතුව** | **6908** | **15417** | **514** | **213** | **142** | **23194** |



**නෞකා කාර්ය මණ්ඩලය පිටවීම - 2018**

| මාසය | කොළඹ වරාය | ගාල්ල වරාය | ත්‍රිකුණාමලය වරාය | නොරොච්චෝලේ වරාය | හම්බන්තොට වරාය | එකතුව |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | 592 | 1024 | 147 | 26 | 04 | **1793** |
| පෙබරවාරි | 519 | 1059 | 32 | 24 | 04 | **1638** |
| මාර්තු | 219 | 1133 | 22 | 26 | 07 | **1407** |
| අප්‍රේල් | 529 | 944 | 28 | 66 | 01 | **1568** |
| මැයි | 596 | 1148 | 68 | - | 01 | **1813** |
| ජූනි | 685 | 919 | 10 | - | 01 | **1615** |
| ජූලි | 559 | 1085 | 15 | - | - | **1659** |
| අගෝස්තු | 651 | 1016 | 240 | - | 21 | **1928** |
| සැප්තැම්බර් | 490 | 1237 | 43 | - | - | **1770** |
| ඔක්තෝබර් | 559 | 1174 | 67 | - | 08 | **1808** |
| නොවැම්බර් | 611 | 1344 | 66 | 28 | 39 | **2088** |
| දෙසැම්බර් | 544 | 1245 | 13 | 05 | 02 | **1809** |
| **එකතුව** | **6554** | **13328** | **751** | **175** | **88** | **20896** |



නෞකා කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම 2015 - 2018

| අනුමත වරායන් | 2015 | | 2016 | | 2017 | | 2018 | |
|---|---|---|---|---|---|---|---|---|
| | පැමිණීම | පිටවීම | පැමිණීම | පිටවීම | පැමිණීම | පිටවීම | පැමිණීම | පිටවීම |
| කොළඹ වරාය | 6786 | 7474 | 5736 | 5623 | 5945 | 6020 | 6908 | 6554 |
| ගාල්ල වරාය | 20339 | 18474 | 14111 | 13008 | 14135 | 12334 | 15417 | 13328 |
| ත්‍රිකුණාමලය වරාය | 917 | 877 | 432 | 439 | 626 | 821 | 514 | 751 |
| නොරොච්චෝලේ වරාය | 38 | 21 | 94 | 136 | 167 | 144 | 213 | 175 |
| හම්බන්තොට වරාය | 178 | 163 | 61 | 62 | 43 | 31 | 142 | 88 |
| එකතුව | **28258** | **27009** | **20434** | **19268** | **20916** | **19350** | **23194** | **20896** |

විදේශගත වූ මගීන්ගේ ආගමන විගමන තොරතුරු ඇතුලත් ලිපි විවිධ ආයතනවල අවශ්‍යතාවය අනුව නිකුත් කිරීම 2016 – 2018

| වර්ෂය | ලිපි සංඛ්‍යාව |
|---|---|
| 2016 | 6483 |
| 2017 | 5672 |
| 2018 | 4884 |

ශ්‍රී ලංකාවට විද්‍යුත් සංචරණ අනුමැතිය (ETA) නොමැතිව පැමිණෙන සංචාරකයන් හට තොටුපලවල දී විද්‍යුත් සංචරණ අනුමැතිය (ETA) ලබා දීම.

| | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| කටුනායක ගුවන් තොටුපල | 354487 | 833506 | 443748 | 448811 | 407964 | 428775 | 2917291 |

## 04 : 3 විමර්ශන ශාඛාව

1948 අංක 20 දරණ ආගාමික හා විගාමික පනත හා ඒ යටතේ පනවන ලද 1956 ආගමන විගමන රෙගුලාසි සහ ජාත්‍යන්තර නීතිවලට අනුකූල වන පරිදි ශ්‍රී ලංකාවට ඇතුළුවන හා එහි රැඳී සිටින විදේශිකයන්ගේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම, ආගාමික හා විගාමික නීති උල්ලංඝණය කරමින් රැඳී සිටින විදේශිකයන් පිළිබඳව නිරීක්ෂණය කර අත්අඩංගුවට ගැනීම, රඳවා තබා ගැනීම, රටින් ඉවත් කිරීම හෝ රටින් පිටුවහල් කිරීම සඳහා අවශ්‍ය විමර්ශන කටයුතු මෙහෙයවීම සහ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම මෙම අංශය මඟින් සිදුකරනු ලැබේ.

**කාර්ය මණ්ඩලය - 2018**

| තනතුර/සේවාව | සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය පාලක | 01 |
| සහකාර පාලක | 01 |
| බලයලත් නිලධාරීන් | 11 |

**2018 වසරේ විමර්ශනයට ලක් කළ හා ඉන් පසුව රටින් ඉවත් කළ විදේශකයන් සංඛ්‍යාව පහතින් දක්වා ඇත.**

| මාසය | විමර්ශනය කළ සංඛ්‍යාව | ඉවත් කළ සංඛ්‍යාව |
|---|---|---|
| ජනවාරි | 99 | 45 |
| පෙබරවාරි | 124 | 41 |
| මාර්තු | 166 | 114 |
| අප්‍රියෙල් | 126 | 33 |
| මැයි | 49 | 31 |
| ජූනි | 119 | 54 |
| ජූලි | 157 | 77 |
| අගෝස්තු | 72 | 67 |
| සැප්තැම්බර් | 113 | 80 |
| ඔක්තෝබර් | 233 | 38 |
| නොවැම්බර් | 135 | 55 |
| දෙසැම්බර් | 155 | 43 |
| **එකතුව** | **1548** | **678** |

**ඉහත විදේශිකයන් රටින් ඉවත් කිරීමට හේතු.**

1 වීසා කාලය ඉක්මවා රැඳී සිටීම.

2 වීසා කොන්දේසි උල්ලංඝණය කිරීම (උදා: සංචාරක වීසාවක් දරමින් රැකියාවක නිරත වීම).

3 අධිකරණ නියෝග අනුව

**මිරිහාන රැඳවුම් කඳවුරට ඇතුළත් කරන ලද විදේශිකයන් රටින් ඉවත් කිරීම ( 2014 – 2018 දක්වා)**

| ජාතිය | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| දකුණු කොරියා | - | 01 | - | 03 | 02 |
| ඉන්දියානු | 51 | 39 | 75 | 247 | 94 |
| තුර්කි | 03 | 01 | - | 05 | - |
| ජර්මානු | 02 | 01 | 02 | 04 | 01 |
| තුර්ක්මෙනිස්තානු | - | - | - | 01 | - |
| පකිස්තානු | 10 | 41 | 09 | 25 | 11 |
| ඉරාක | - | 13 | 02 | 01 | 02 |
| චීන | 05 | 49 | 04 | 86 | 59 |
| කැනේඩියානු | 02 | - | 01 | 01 | - |
| ප්‍රංශ | 01 | 02 | - | 02 | - |
| රුසියානු | 02 | 04 | 01 | 23 | 02 |
| චෙක් | - | - | - | 05 | 01 |
| ඉතාලි | - | - | - | 05 | - |
| බ්‍රිතාන්‍ය | 02 | - | 01 | 02 | 02 |
| නයිජීරියානු | 03 | 05 | 03 | 21 | 08 |
| ඩෙන්මාර්ක් | - | - | - | 01 | - |
| සවුදි | - | - | - | 02 | - |
| උස්බෙකිස්තානු | - | 01 | - | 09 | 01 |
| බංගලාදේශ | 08 | 44 | 46 | 12 | 03 |
| ඉන්දුනීසියානු | - | - | - | 01 | - |
| තායිලන්ත | - | 10 | 01 | 12 | 19 |
| ඕස්ට්‍රේලියානු | - | - | 02 | 02 | - |
| පෘතුග්‍රීසි | - | - | - | 01 | - |
| මොරොක්කෝ | - | - | - | 02 | - |
| යේමානු | - | 01 | 01 | 02 | 01 |
| යුක්රේන් | 01 | 06 | 02 | 03 | 02 |
| නේපාල් | - | - | - | 03 | 02 |
| ඊජිප්තු | - | - | - | 01 | - |
| ඉරාන | 09 | 12 | 04 | 16 | 16 |
| අයිරිෂ් | 01 | - | - | 01 | - |
| ජපන් | - | - | - | 01 | 01 |
| මැලේසියානු | - | 01 | 01 | 02 | 04 |
| මාලදිවයින් | 01 | - | - | 02 | 03 |
| මියන්මාර් | 07 | - | - | 02 | - |
| පලස්තීනු | 03 | 04 | - | 01 | 01 |
| සියරාලියෝන් | - | - | - | 01 | - |
| සෝමාලියානු | - | 02 | - | 02 | 03 |
| තායිවාන් | - | - | - | 03 | - |
| තජිකිස්තාන් | - | - | - | 01 | - |
| ඇෆ්ගනිස්ථානු | - | 01 | - | - | - |
| කැමරූන් | - | 01 | - | - | - |
| ලයිබීරියානු | 01 | - | - | - | - |
| මාලි | 02 | 01 | - | - | - |
| සිරියානු | 07 | 03 | - | - | 01 |
| ඒලිට්‍රියන් | 02 | - | - | - | - |
| ස්පාඤ්ඤ | 01 | - | - | - | - |
| ආමේනියා | - | 01 | - | - | - |
| කසකස්තාන | - | 01 | - | - | - |
| ලෙබනන් | - | 01 | 03 | - | - |
| ස්වීඩන් | - | 02 | 01 | - | - |
| ජෝර්ජියා | - | 03 | - | - | - |
| ගානා | - | 03 | - | - | - |
| නෙදර්ලන්ත | - | 01 | - | - | - |
| දකුණු අප්‍රිකානු | - | 01 | - | - | - |
| සූඩාන | - | 01 | - | - | - |
| අසර්බයිජානු | - | 01 | - | - | - |
| සිංගප්පූරු | - | 01 | - | - | - |
| ඊශ්‍රායලය | - | - | - | - | 01 |
| ඇමරිකානු | - | - | - | - | 01 |
| බෙලරුස් | - | - | - | - | 01 |
| වියට්නාමය | - | - | - | - | 03 |
| ටිබෙටය | - | - | - | - | 01 |
| **එකතුව** | **124** | **259** | **159** | **514** | **246** |

විමර්ශන ශාඛාව විසින් සිදුකළ පරීක්ෂණ සංඛ්‍යාව 2014 - 2018

| මාසය | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|
| ජනවාරි | 61 | 54 | 73 | 36 | 99 |
| පෙබරවාරි | 50 | 74 | 43 | 64 | 124 |
| මාර්තු | 98 | 103 | 50 | 89 | 166 |
| අප්‍රේල් | 88 | 59 | 72 | 48 | 126 |
| මැයි | 29 | 93 | 46 | 75 | 49 |
| ජූනි | 52 | 46 | 56 | 56 | 119 |
| ජූලි | 41 | 64 | 77 | 72 | 157 |
| අගෝස්තු | 11 | 39 | 89 | 112 | 72 |
| සැප්තැම්බර් | 30 | 37 | 109 | 88 | 113 |
| ඔක්තෝබර් | 45 | 48 | 57 | 29 | 233 |
| නොවැම්බර් | 39 | 41 | 61 | 82 | 135 |
| දෙසැම්බර් | 24 | 41 | 23 | 42 | 155 |
| **එකතුව** | **568** | **699** | **756** | **793** | **1548** |





**එක්සත් ජාතීන්ගේ සරණාගතයන් සඳහා වන මහ කොමසාරිස් කාර්යාලයේ (UNHCR) ලියාපදිංචි වීම් පිළිබඳ දත්ත**

2005 වර්ෂයේ දෙසැම්බර් මස 07 වන දින විදේශ කටයුතු අමාත්‍යාංශය හා එක්සත් ජාතීන්ගේ සරණාගතයන් සඳහා වූ මහ කොමසාරිස් කාර්යාලය අතර අත්සන් කල ගිවිසුම හා ඒ මත පදනම් වූ ක්‍රියාකාරී සැලැස්ම (Working Arrangement ) 2006 ජූනි මස 01 වන දින සිට ක්‍රියාත්මක කර ඇති අතර, ඒ යටතේ විදේශිකයන්ට ශ්‍රී ලංකාවට පැමිණ එක්සත් ජාතීන්ගේ සරණාගතයන් සඳහා වූ මහ කොමසාරිස් කාර්යාලයේ ලියාපදිංචි වී ශ්‍රී ලංකාවේ සිට සරණාගත තත්ත්වය ලබාගෙන ශ්‍රී ලංකාවෙන් බැහැරව වෙනත් රටක ස්ථිර පදිංචිය ලබාදෙන තෙක් රැඳී සිටීමට ඉඩකඩ සැලසී ඇත. මෙම ක්‍රමය යටතේ 2018.12.31 දින වන විට UNHCR ආයතනයේ ලියාපදිංචිව සිටි විදේශිකයන්ගේ සංඛ්‍යාව 1542 කි. මෙම සංඛ්‍යාවෙන් 742 දෙනෙකු සරණාගත තත්ත්වය අපේක්ෂාවෙන් පසුවන අතර, 800 දෙනෙකු සරණාගත තත්ත්වය පිරිනැමීමෙන් අනතුරුව වෙනත් රටක පදිංචිය අපේක්ෂාවෙන් සිටී.

**සරණාගත තත්ත්වය ඉල්ලුම් කර සිටි සංඛ්‍යාව (Asylum – Seekers) - 2018.12.31 දිනට**

| ජාතිකත්වය | පුද්ගලයන් සංඛ්‍යාව |
|---|---|
| පාකිස්ථාන් | 676 |
| ඇෆ්ගනිස්ථාන් | 34 |
| ඉරාන | 11 |
| යේමන් | 03 |
| මාලදිවයින් | 03 |
| නයිජීරියා | 07 |
| බංග්ලාදේශ | 01 |
| මියන්මාර් | 01 |
| ජර්මන් | 01 |
| ඉන්දීය | 01 |
| සූඩාන් | 04 |
| **එකතුව** | **742** |

**සරණාගත තත්ත්වය ලබා සිටි සංඛ්‍යාව (Refugees) - 2018.12.31 දිනට**

| ජාතිකත්වය | පුද්ගලයන් සංඛ්‍යාව |
|---|---|
| පාකිස්ථාන් | 558 |
| ඇෆ්ගනිස්ථාන් | 146 |
| මියන්මාර් | 33 |
| සිරියා | 14 |
| යේමන් | 12 |
| ඉරාන් | 18 |
| මාලදිවයින් | 06 |
| පලස්තීන් | 09 |
| සෝමාලියා | 01 |
| ටියුනීසියා | 01 |
| එරිත්‍රියා | 02 |
| **එකතුව** | **800** |

2018 වර්ෂයේ දී ජාත්‍යන්තර සරණාගත නීති හා සරණාගතයන් සම්බන්ධයෙන් වන ගෝලීය ප්‍රවනතා පිළිබඳව UNHCR ආයතනය මගින් පවත්වන එක් දින වැඩමුලු පහක් කොළඹ Cinnamon Grand හෝටලයේ දී පවත්වනු ලැබූ අතර, ඒ සඳහා සහකාර පාලකවරුන් 07 දෙනෙකු හා ආගමන හා විගමන නිලධාරීන් 93 දෙනෙකු සහභාගී කරවන ලදී.

**2018 වර්ෂය තුළ ඉටු කරන ලද විශේෂිත කාර්යයන්**

**1. ශ්‍රී ලංකා ඒකාබද්ධ ප්‍රත්‍යන්ත කළමනාකරණ උපායමාර්ගය පිළිබඳ සාකච්ඡා සම්මේලනය**

සියලුම ප්‍රධාන ප්‍රත්‍යන්ත කළමනාකරණ නියෝජිත ආයතනවල ප්‍රධානීන්ගෙන් සැදුම්ලත් ජාතික ප්‍රත්‍යන්ත කළමනාකරණ කමිටුවක් (NBMC) ශ්‍රී ලංකා රජය විසින් ස්ථාපිත කරන ලද අතර ප්‍රත්‍යන්ත කළමනාකරණයේ සියලු අංශ අධීක්ෂණය කිරීමේත්, අංශ දියුණු කිරීමට අදාළ යෝග්‍ය ක්‍රියාමාර්ග අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ කිරීමේත් බලය මෙම කමිටුව සතු වේ.

ඔවුන්ගේ විධි නියෝග ප්‍රකාරව, ප්‍රත්‍යන්ත කළමනාකරණයට ඒකාබද්ධ, අවදානම් පාදක කරගත් ප්‍රවේශයක් සඳහා ප්‍රත්‍යන්ත නියෝජිත ආයතනවලට ප්‍රතිපත්තිමය මඟ පෙන්වීමක් ලබා දෙන "ශ්‍රී ලංකා ඒකාබද්ධ ප්‍රත්‍යන්ත කළමනාකරණ උපාය මාර්ගය" ජාතික ප්‍රත්‍යන්ත කළමනාකරණ කමිටුව (NBMC) විසින් සංවර්ධනය කරනු ලැබ ඇත. ශ්‍රී ලංකා ඒකාබද්ධ ප්‍රත්‍යන්ත කළමනාකරණ උපාය මාර්ගය 2018 මැයි මස 30 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර, රටේ පළමු ජාතික ප්‍රත්‍යන්ත කළමනාකරණ උපාය මාර්ගය දියත් කිරීම සනිටුහන් කරමින්, සියලුම ප්‍රධාන ප්‍රත්‍යන්ත නියෝජිත ආයතනවල සහභාගීත්වය ඇතිව 2018 ජූලි මස 26 වන දින ඒකාබද්ධ ප්‍රත්‍යන්ත කළමනාකරණය හඳුන්වාදීමේ සාකච්ඡා සම්මේලනයේදී මෙම උපාය මාර්ගය විධිමත්ව දියත් කරන ලදී.

ප්‍රත්‍යන්ත අවදානම් වඩාත් කාර්යක්ෂමව මැඩලනු වස් ඒකාබද්ධ ප්‍රත්‍යන්ත කළමනාකරණ ක්‍රමයක් වෙත හුවමාරු වීමට ශ්‍රී ලංකා රජයේ කැපවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයේ නිලධාරීන්ව මෙම අවවස්ථාවේ දී ඇගයීමට ලක් කරන ලදී.






යෝජිත ඒකාබද්ධ ප්‍රත්‍යන්ත කළමනාකරණ පද්ධතිය පිළිබඳ කණ්ඩායම් සාකච්ඡාව




ආගමන හා විගමන පාලක ජනරාල්වරයා සාකච්ඡා සම්මේලනය අමතමින්

## 2. මඟී නෞකා ශ්‍රී ලංකාවට පැමිණෙන අතරතුර මඟී නිශ්කාශන කටයුතු සිදු කිරීම (On-board Cleararance).

2016 වර්ෂයෙහි අවසන් භාගය වන විට ශ්‍රී ලංකාවට නෞකා මඟින් සංචාරකයන්ගේ පැමිණීමේ වර්ධනයක් ඇති විය. විශේෂයෙන්ම කොළඹ, ගාල්ල හා ත්‍රිකුණාමලය වරායන් ඒ සඳහා වඩාත් ප්‍රචලිත තොටුපලවල් විය. එක් මඟී නෞකාවක එක වරකට සංචාරකයන් 500 සිට 3000 දක්වා ප්‍රමාණයක් රැගෙන එන අතර, මඟී නිශ්කාශන කටයුතු නියමිත අයුරින් ලබා දීමට පහසුකම් වරාය පරිශ්‍රයන් තුළ නොතිබිනි.

එයට පිළියමක් ලෙස සංචාරකයන් 500 ට වැඩි ප්‍රමාණයක් රැගෙන එන නෞකා සඳහා එම නෞකා ශ්‍රී ලංකා වරායන් තුළ නැංගුරම් ලෑමට ප්‍රථම මඟී නිශ්කාශන කටයුතු සිදු කිරීමේ ක්‍රමවේදයක් ආගමන විගමන දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂයේ මුල් භාගයේ දී හඳුන්වා දෙන ලදී. මෙම ක්‍රමවේදය හඳුන්වා දීම තුළින් ජාතික ආරක්‍ෂාවට තර්ජනයක් වන විදේශිකයන් මෙන්ම අසාදු ලේඛනගත කර ඇති මඟීන් පිළිබඳව කල් ඇතිව හඳුනාගත හැකි විය. එසේම, වරායන් තුලට පැමිණෙන නෞකා හා මඟීන් පිළිබඳ නිවැරදි දත්ත රැස්කර ගැනීමට හැකි වූ අතර, සංචාරකයින් සඳහා වඩාත් කාර්යක්‍ෂම සේවාවක් ලබා දීමට ද හැකි වී ඇත.

ඒ අනුව 2018 වසරේ දී මඟී නෞකා මඟින් ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින් 64,446 දෙනෙකුගේ මඟී නිශ්කාශන කටයුතු සිදු කරන ලදී.






"celebrity constellation" මඟී නෞකාව තුළ දී මඟී නිශ්කාශන කටයුතු කිරීම

## 3. නව ප්‍රත්‍යන්ත පාලන පද්ධති නවීකරණයන් පිළිබඳ පරිශීලක පුහුණුව

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවෙහි ප්‍රත්‍යන්ත පාලන ධාරිතාව ශක්තිමත් කිරීම සඳහා සිදු කරගෙන යන්නා වූ ප්‍රයත්නයන්ගේ එක් අදියරයක් ලෙස වත්මන් ප්‍රත්‍යන්ත පාලන පද්ධතිය සඳහා වන පද්ධති නවීකරණයන් හඳුන්වා දෙන ලදී. පද්ධතියේ කාර්යක්ෂමතාව,ඒකාබද්ධතාව හා ආරක්ෂාව ඉහළ නැංවීම සඳහා යෝජිත නවීකරණයන් පහත දැ ඇතුළත් කරමින් සැලසුම් කරන ලදී. මඟීන්ට අදාළ ද්විතීය විමර්ශන පරීක්ෂාවන්ට පහසුකම් සැලසීම පිණිස අතිරේක කාර්ය ප්‍රවාහ ක්‍රියාකාරකම් හඳුන්වා දීම; දැනුවත් ඉලක්ක සඳහා මඟී නාම ලේඛනවල පූර්ව සුපරීක්ෂා කිරීම්; මඟී නාම ලේඛන සමඟ ප්‍රත්‍යන්ත වාර්තාවල සැබෑ කාල එකඟතාව සහ උපකරණ පුවරුව හා දැන්වීම් අධීක්ෂණය කිරීමේ කටයුතු වැඩි දියුණු කිරීම.

මෙම ව්‍යාපෘතිය යටතේ හඳුන්වා දෙන ලද නව Info Border System නවීකරණයන් පිළිබඳව දැනුවත් කිරීමට 2018 නොවැම්බර් 19-29 දක්වා පවත්වන ලද පුහුණු මාලාවන් යටතේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රත්‍යන්ත නිලධාරීන් 390 ක් සඳහා විස්තීර්ණ පද්ධති පුහුණුවක් ලබා දෙන ලදී. පද්ධති පුහුණුවෙහි ඉලක්කය වන්නේ ඉදිරි පෙළ ප්‍රත්‍යන්ත පාලන කටයුතු හා විධායක කාර්ය භාරයට සම්බන්ධ ආගමන හා විගමන දෙපාර්තමේන්තු නිලධාරීන් තුළ නව පද්ධති ක්‍රියාකාරීත්වයන් පිළිබඳව සහ එම පද්ධතිය ක්‍රියාත්මක වන්නේ කෙසේ ද යන්න පිළිබඳව ප්‍රශස්ථ ආකාරයට දැනුවත්භාවය ඉහළ නැංවීමයි. අවසාන වශයෙන් මෙම පුහුණු වැඩසටහන මගින් 2019 වර්ෂයේ මෙම නව පද්ධතිය ක්‍රියාත්මක කිරීමට මඟ පාදනු ලැබේ.



ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ විධායක නිලධාරීන් සඳහා පුහුණුව - 2018 නොවැම්බර් 28 සහ 29



ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරීන් සඳහා පුහුණුව - නොවැම්බර් 21 සහ 23






ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරීන් සඳහා පුහුණුව - 2018 නොවැම්බර් 19 - 23

### 4. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ විමර්ශන ඒකකයේ සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටිය (Standard Operating Procedure) යාවත්කාලීන කිරීමේ වැඩමුළුව.

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ විමර්ශන කටයුතු හා බලාත්මක කිරීමේ ධාරිතාව වැඩිදියුණු කිරීම උදෙසා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ විමර්ශන ඒකකයේ සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටිය යාවත්කාලීන කිරීම සම්බන්ධයෙන් වැඩමුළුවක් පැවැත්වීමට සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය (IOM) සිය සහයෝගය ලබා දුන් අතර, 2018 නොවැම්බර් 17 වන දින මෙම වැඩමුළුව පවත්වන ලදී. වත්මන් විමර්ශන ක්‍රියාවලිය සමාලෝචනය කිරීමට මෙන්ම නූතන අවශ්‍යතාවන් සපුරාලනු වස් සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටිය යාවත්කාලීන කිරීමට අවශ්‍ය නිර්දේශ සැකසීමට ද සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය (IOM) සිය තාක්ෂණික දායකත්වය ලබා දෙන ලදී. මෙම වැඩමුළුවට සහභාගී වූවන්ට ආගමන විමර්ශන ක්‍රියාපටිපාටිය, පැන නගින්නා වූ අභියෝග, පාරජාතීය සංවිධිත අපරාධ හා ප්‍රත්‍යන්ත අවදානම් වළකාලීමට අදාළව ජාත්‍යන්තරව අනුගමනය කරන්නාවූ වඩාත් නිවැරදිම ක්‍රියාමාර්ග පිළිබඳව සිය දැනුම වර්ධනය කර ගැනීමට අවස්ථාව සැලසිණ.








## 04:4 තැනැත්තන් වෙළඳාම තුරන් කිරීමේ ජාතික සම්පත් මධ්‍යස්ථානය (NCHTRC)

මෙම විෂය කරුණ පිළිබඳව නිලධාරීන් පුහුණු කිරීම තවදුරටත් ඉටු කිරීමට මෙම අංශයට හැකි විය. අලුතින් බඳවා ගන්නා ලද බලයලත් නිලධාරීන් 90 දෙනෙකු සඳහා මූලික පුහුණුවක් ලබාදීමට පුහුණු අංශය හා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණය කරන ලදී.

අධිකරණ අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් පිහිටුවන ලද තැනැත්තන් වෙළඳාමට එරෙහි ජාතික සන්ධානය විසින් (Anti – Human Trafficking Task Force) එම අමාත්‍යාංශයේ පවත්වන ලද ද්වි මාසික රැස්වීම් 6 ක් සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව නියෝජනය කරන ප්‍රධාන ආයතනය ලෙස තැනැත්තන් වෙළඳාම තුරන් කිරීමේ ජාතික සම්පත් මධ්‍යස්ථානය සක්‍රීයව සහභාගී වන ලදී. එහි 2015 – 2019 උපාය මාර්ගික සැලැස්මෙහි 2018 වසර සඳහා යෝජිත වැඩසටහන්වල දී ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් සිදුකළ යුතු කාර්යභාරයට දායකත්වය සපයන ලද අතර, ඇමරිකා එක්සත් ජනපද තැනැත්තන් වෙළඳාමට එරෙහි වාර්තාව සැකසීමේ දී ඒ සඳහා සක්‍රීයව දායකත්වය සපයන ලදී. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ දායකත්වයන්හි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාව තවදුරටත් තැනැත්තන් වෙළඳාම තුරන් කිරීමට කැපවීමෙන් කටයුතු කරන දෙවන මට්ටමේ (Tier 2) රාජ්‍යයක් ලෙස පිළිගැනීමකට ලක්ව ඇත.

**2018 වර්ෂය තුළ ඉටු කරන ලද විශේෂිත කාර්යයන්**

ප්‍රධාන වශයෙන් ජාත්‍යන්තර පොලීසියේ (INTERPOL) PROJECT RELAY නැමති තැනැත්තන් වෙළඳාම හා සංක්‍රමණිකයන් ජාවාරම මැඩ පැවැත්වීමට කැනඩා රජයේ ආධාර මත ශ්‍රී ලංකාව ජාත්‍යන්තර පොලීසියේ තොරතුරු ජාලයට එක් කිරීමට අවශ්‍ය වැඩ සටහනට සක්‍රීයව දායකත්වය සපයන ලදී. මෙහි දී මූලික වශයෙන් ජාත්‍යන්තර පොලීසියේ විශේෂඥයින්ගේ මැදිහත් වීම මත 2018 අප්‍රියෙල් මාසයේදී "Operation Mandala" නැමති මෙහෙයුම දින 9 ක් පුරා කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලෙහි පවත්වන ලද අතර, එම පුහුණු වැඩසටහනෙහි පූර්ණ සංවිධාන කටයුතු මෙම අංශය විසින් සිදු කරන ලදී. මෙමඟින් ජාත්‍යන්තර අපරාධකරුවන් හඳුනා ගැනීම මෙන්ම ලෝකයේ වෙනත් රටවල හා ශ්‍රී ලංකාවේ නැතිවූ ගමන් බලපත්‍ර හෝ සොරකම් කරන ලද ගමන් බලපත්‍ර උපයෝගී කරගන්නන් හඳුනා ගැනීම අරමුණු කොට සිදු කරන ලද ප්‍රායෝගික පුහුණුවක් සපයන ලදී. වසර අවසානයේ දී ජාත්‍යන්තර පොලීසියේ දත්ත ගබඩාවෙහි ඇති අපරාධකරුවන් ශ්‍රී ලංකාව හරහා ගමන් කිරීමට තැත්කළහොත් හඳුනා ගැනීමට මෙමඟින් ඉඩකඩ සැලසෙනු ඇත.



මෙම මෙහෙයුම සඳහා ශ්‍රී ලංකාව, බංගලාදේශය, බ්‍රිතාන්‍යය, නේපාලය සහ මියන්මාරය යන රටවල් එකවිට දී සම්බන්ධ වූ අතර, ඉන් වැඩිම සෝදිසි දායකත්වයක් එනම් 464,760 ක සෝදිසියකින් 182,478 හෙවත් 39% ක වැඩිම දායකත්වයක් ලබාදීමට ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සමත් විය. එහි ප්‍රතිඵල ලෙස නැති වූ හෝ සොරකම් කළ ගමන් බලපත්‍ර පිළිබඳව හා ජාත්‍යන්තර පොලීසියේ රතු වරෙන්තු හා අනෙකුත් සොයාගැනීම් 14 ක් හඳුනා ගැනීමට හැකිවීම මෙම මෙහෙයුමේ සාර්ථකත්වයක් ලෙස පිළිගන්නා ලදී.






තව ද මෙම වැඩසටහනට අවශ්‍ය ජාතික සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටිය සකස් කිරීමට මෙම අංශය මූලිකත්වය ගනු ලැබීය. මේ සඳහා වැඩමුළු 3 ක් පැවැත්වූ අතර, අවසානයේ දී මෙහෙයුම් අත්පොතක් සකස් කරන ලදී.

ජාත්‍යන්තර පොලීසියේ සම්පත් දායකත්වය මත පවත්වන ලද මෙම වැඩසටහනට සහය දැක්වීමට සහකාර පාලකවරුන්, ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරීන් හා බලයලත් නිලධාරීන් 60 ක් පමණ පුහුණු කිරීම පුහුණු අංශයේ ද සහභාගිත්වය මත සිදු කරන ලදී.





**2019 වර්ෂය තුළ ඉටු කිරීමට අපේක්ෂිත කාර්යයන්**

- අලුතින් බඳවා ගන්නා ලද බලයලත් නිලධාරීන් 115 ක් පමණ පිරිස සඳහා විෂය කරුණුවලට අදාළ සංක්ෂිප්ත පුහුණු වැඩසටහන් සිදු කිරීම.
- අනුමත තොටුපලවල් හරහා සිදුවන සංවිධානාත්මක අපරාධ අවම කිරීමට ස්ථාපිත කිරීමට නියමිත දේශසීමා ආවේක්ෂණ ඒකකයේ වැඩ කටයුතු නිම කිරීම. (Border Surveillance Unit)
- කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලෙහි ඇති ලේඛන පරීක්ෂණාගාරයේ වැඩකටයුතු විධිමත් කිරීම.
- අනෙකුත් ආයතන සමග එක්ව සංවිධානාත්මක අපරාධ තුරන් කිරීමට සම්බන්ධීකරණ ඒකකයක් පිහිටුවීම තුළින් සියල්ලන්ගේ දායකත්වය මත ජාතික වැඩපිළිවෙලට සහභාගී වීම.
- ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ සේවය ලබාගැනීමට පැමිණෙන්නන් සඳහා අත් පත්‍රිකා, පොත්පත් ආදිය බෙදාදීම තුළින් මහජනතාව දැනුවත් කිරීම.
- මෙතෙක් පුහුණුව නොලද නිලධාරීන් සඳහා තැනැත්තන් වෙළඳාම පිළිබඳව ජාතික හා ජාත්‍යන්තර නීතිරීති පිළිබඳව දැනුවත් කිරීම.

# 05. පුරවැසි අංශය

1948 අංක 18 දරණ පුරවැසි පනතින් පුරවැසි අංශය සඳහා ව්‍යවස්ථාපිත බලය ලැබී ඇත. පුරවැසි පනත ක්‍රියාත්මක කිරීමේ විධායක නිලබලය ලැබෙන්නේ අදාළ රේඛීය අමාත්‍යාංශයේ අමාත්‍යාංශ ලේකම්වරයාට ය. පුරවැසි පනතේ ප්‍රතිපාදන සහ විධායක ක්‍රියාපටිපාටි ආගාමික හා විගාමික පනතින් පාලනය වන විදේශ දූත මණ්ඩල හරහා ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය සමඟ ඍජුවම සම්බන්ධ වන නිසා පුරවැසි අංශය ආගමන හා විගමන දෙපාර්මේන්තුවේ ස්ථාපිත කර ඇත. අමාත්‍යාංශ ලේකම්වරයාගේ විධායක බලතල සහකාර ලේකම්වරයෙකු මඟින් ක්‍රියාත්මක වන අතර, එම බලතල ද පුරවැසි අංශයේ නියෝජ්‍ය පාලකවරයකු මඟින් ක්‍රියාත්මක වේ. සෙසු කාර්ය මණ්ඩලය පහත දැක්වේ.

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| සහකාර පාලක | 02 |
| සංවර්ධන නිලධාරි | 01 |
| රාජ්‍ය කළමණාකරන සහකාර | 22 |
| කාර්යාල සේවක සේවය | 04 |

**කාර්යභාරය**

පුරවැසි අංශය මඟින් 1948 අංක 18 දරණ පුරවැසි පනතේ ප්‍රතිපාදන පහත සඳහන් මූලික කරුණු ඔස්සේ ක්‍රියාත්මක කරයි.

- **<u>පනතේ 5(2) වගන්තිය යටතේ පුරවැසිභාවය ලියාපදිංචි කිරීම.</u>**

  එක් අයකු හෝ දෙදෙනාම ශ්‍රී ලාංකිකයන් වන දෙමව්පියන්ට දාව විදේශ රටවල උපත ලැබූ දරුවන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කිරීම මෙමඟින් සිදු කරනු ලබයි.

- **<u>පනතේ 8 වන වගන්තිය යටතේ ශ්‍රී ලාංකික පුරවැසිභාවය නැවත ප්‍රදානය කිරීම.</u>**

  විදේශ රටක පුරවැසිභාවය ලබාගැනීම හේතුවෙන් ශ්‍රී ලාංකික පුරවැසිභාවය අහිමි වූ තැනැත්තන්ට නැවත ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය අත්පත් කර ගැනීමට අදාළ කටයුතු ඉටු කරනු ලබයි.

- **<u>පනතේ 11 වන වගන්තියට අදාළ කටයුතු කිරීම.</u>**

  මව හෝ පියා ශ්‍රී ලාංකික වන 5(2) වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම අවුරුදු 22 දක්වා ඉටු කර ගැනීමට අපොහොසත් වන තැනැත්තකු හෝ දරුවන් උපදින අවස්ථාවේ දී දෙමව්පියන්ගේ ශ්‍රී ලාංකික පුරවැසිභාවය අවසන් වී ඇති තැනැත්තෙකු මෙම වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සිදු කරනු ලබයි.

- **<u>පනතේ 12 වගන්තියට අදාළ කටයුතු කිරීම.</u>**

  ශ්‍රී ලාංකික කලත්‍රයකු ආවාහ කර ගන්නා විදේශීය කාන්තාවන් සඳහා පුරවැසිභාවය ප්‍රදානය කිරීම මෙමගින් සිදු කරනු ලබයි.

- **<u>පනතේ 13 වන වගන්තියට අදාළ කටයුතු කිරීම.</u>**

  සුවිශේෂී සමාජ සේවාවක් ඉටු කළ හෝ වෘත්තිමය, වාණිජමය කාර්මික හෝ කෘෂිකාර්මික අංශයන්හි නිපුනයෙකු වන ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පුරවැසියකු වශයෙන් ජීවත්වීමේ අපේක්ෂාවෙන් පසුවන පුරවැසි පනතේ 11 වන වගන්තිය හා 12 වන වගන්තිය යටතේ පුරවැසිභාවය සඳහා හිමිකම් නොලබන තැනැත්තකු සඳහා ශ්‍රී ලාංකික පුරවැසිභාවය ප්‍රදානය කිරීම මෙමඟින් සිදු කරනු ලබයි.

- **පනතේ 13(අ) වගන්තියට අදාළ කටයුතු කිරීම.**

  වර්ෂ 5ක කාලයක් සඳහා වලංගු වීසා බලපත්‍රයක් හෝ පිටසනක් ප්‍රදානය කරනු ලැබ ඇති සහ විදේශ ආයෝජකයන් සහ වෘත්තිකයන් සඳහා රජය විසින් අනුමත කරන ලද නේවාසික ආගන්තුක යෝජනා ක්‍රමයක ලියාපදිංචි කර ඇති යම් තැනැත්තෙකුට ලියාපදිංචියෙන් ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය ලබාදීමට අදාළ කටයුතු සිදු කරනු ලබයි.

- **පනතේ 19 වගන්තිය පරිදි ද්විත්ව පුරවැසිභාවය ප්‍රදානය කිරීම.**

  19(2) වගන්තිය යටතේ විදේශ රටවල පුරවැසිභාවය ලබා ගැනීම හේතුවෙන් ශ්‍රී ලාංකික පුරවැසිභාවය අහිමි වූ තැනැත්තකු හට එම රටවල පුරවැසිභාවය තිබියදීම ශ්‍රී ලාංකික පුරවැසිභාවය නැවත ප්‍රදානය කිරීම මෙමගින් සිදු කරනු ලබයි.

  19(3) වගන්තිය යටතේ විදේශ රටවල වාස වීසා මඟින් සිටින තැනැත්තන් සඳහා ශ්‍රී ලාංකික පුරවැසිභාවය තිබියදීම අදාළ රට වෙත ද්විත්ව පුරවැසිභාවය ප්‍රදානය කරනු ලබයි.

- **පනතේ 20 වගන්තියට අදාළ කටයුතු කිරීම.**

  20(1) වගන්තිය යටතේ 1948.11.15 දින හෝ එදිනට පෙර උපන් අයකු නම් සහ එම දිනය වන විට වෙනත් රටක ද පුරවැසියකු වන්නේ නම්, 1952.12.31 දින හෝ එම අයට වයස අවුරුදු 22ට පත්වන දින යන දින දෙකෙන් එම අය සම්බන්ධව පසුව එළඹෙන කවර වූ දිනයෙහි වෙනත් රටක පුරවැසිභාවය එකී රටෙහි නීතියට අනුව අත්හැර නියමිත නිලධාරියාට දන්වන්නේ නම් මිස ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම අවසන්වීම සම්බන්ධයෙන් කටයුතු කිරීම සිදු කරයි.

  20(2) වගන්තිය යටතේ යම් පුද්ගලයකු පරම්පරාවෙන් ලංකාවේ පුරවැසියකු වන්නා වූ සහ නීතිය ක්‍රියාත්මක වීමෙන්, ඔහුගේ උපත සිදු වූ අවස්ථාවේ දී හෝ ඉන් පසුව යම් වෙනත් රටක පුරවැසියකු වන්නා වූ විටක 1952.12.31 දින හෝ එලෙස වෙනත් රටක පුරවැසියකු වන්නා වූ දින සිට වර්ෂයක් ගතවී එළඹෙන්නා වූ දින හෝ වයස අවුරුදු 22ට පත්වන දින යන දිනවලින් එම අය සම්බන්ධයෙන් අන්තිමට එළඹෙන කවර දිනයක දී වෙනත් රටක පුරවැසිභාවය එකී රටෙහි නීතියට අනුව අත්හැර නියමිත නිලධාරියාට දන්වන්නේ නම් මිස ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම අවසාන වීම සම්බන්ධයෙන් කටයුතු සිදු කරයි.

  20(3) වගන්තිය යටතේ පරම්පරාවෙන් ලංකාවේ පුරවැසියකු වන තැනැත්තකු ස්වේච්ඡාවෙන් වෙනත් රටක පුරවැසියකු වෙතොත් එම අයගේ ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය අහෝසිවීම සම්බන්ධයෙන් කටයුතු සිදු කරයි.

  20(4) වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය නැවත අයදුම්කරන අයකු විසින් ස්වකීය විදේශ රටෙහි පුරවැසිභාවය මාස 03ක් ඇතුලත අත්නොහරින්නේ නම් ඔහුගේ ශ්‍රී ලාංකික පුරවැසිභාවය අහෝසි කිරීම සම්බන්ධයෙන් කටයුතු සිදු කරයි.

### පුරවැසි පනත අනුව 2016.01.01 සිට 2018.12.31 දක්වා නිකුත් කරන ලද සහතික

| වගන්තිය | 2016 | 2017 | 2018 | එකතුව |
|---|---|---|---|---|
| 5(2) වගන්තිය | 8,276 | 12,904 | 10,659 | 31,839 |
| 8 වගන්තිය | 12 | 6 | 9 | 27 |
| 11 වගන්තිය | 51 | 46 | 73 | 170 |
| 12 වගන්තිය | 8 | 6 | 24 | 38 |
| 19(2)/ 19(3) වගන්තිය | 17,544 | 10,648 | 7,888 | 36,080 |
| 20 වගන්තිය | 108 | 94 | 120 | 322 |
| **එකතුව** | **25,999** | **23,704** | **18,773** | **68,476** |

**පුරවැසි පනත අනුව 2018.01.01 සිට 2018.12.31 දක්වා ලැබුණු අයදුම්පත් සහ නිකුත් කරන ලද සහතිකපත් සංඛ්‍යාව**

| වගන්තිය | ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව | නිකුත් කළ සහතික පත් සංඛ්‍යාව |
|---|---|---|
| 5(2) වගන්තිය | 10,576 | 10,659 |
| 8 වගන්තිය | 31 | 09 |
| 11 වගන්තිය | 203 | 73 |
| 12 වගන්තිය | 13 | 24 * |
| 19(2)/ 19(3) වගන්තිය | 9,752 | 7,888 |
| 20 වගන්තිය | 120 | 120 |
| එකතුව | **20,695** | **18,773** |

* 2018 වර්ෂයේ සහතිකපත් නිකුත් කර ඇත්තේ එම වර්ෂයේත්, ඊට පෙර වර්ෂයේත් ලද අයදුම්පත් ඇසුරිනි.






## ද්විත්ව පුරවැසිභාවය ප්‍රදානය කිරීම 2016 – 2018

| විස්තරය | 2016 | 2017 | 2018 | එකතුව |
|---|---|---|---|---|
| පුරවැසි පනතේ 19(2) වගන්තිය යටතේ ශ්‍රී ලංකා පුරවැසිභාවය නැවත ලබා ගැනීම. | 9,418 | 5,113 | 4,082 | **18,613** |
| පුරවැසි පනතේ 19(3) වගන්තිය යටතේ ශ්‍රී ලංකා පුරවැසිභාවය රඳවා තබා ගැනීම. | 8,126 | 5,535 | 3,806 | **17,467** |
| එකතුව | **17,544** | **10,648** | **7,888** | **36,080** |

## ද්විත්ව පුරවැසිභාවය අයදුම් කිරීම - 2018 (රටවල් අනුව)

| රට | ලද අයදුම්පත් සංඛ්‍යාව |
|---|---|
| ඇමරිකා එක්සත් ජනපදය | 1,185 |
| එක්සත් රාජධානිය | 1,985 |
| කැනඩාව | 1,249 |
| ප්‍රංශය | 333 |
| ඉතාලිය | 892 |
| ඕස්ට්‍රේලියාව | 3,168 |
| ස්විස්ටර්ලන්තය | 429 |
| නවසීලන්තය | 335 |
| ස්වීඩනය | 62 |
| වෙනත් රටවල් | 114 |
| **එකතුව** | 9,752 |

## 2018 වර්ෂය තුළ ඉටු කරන ලද විශේෂිත කාර්යයන්, ජයග්‍රහණ හා අභියෝග

1. 1948 අංක 18 දරන පුරවැසි පනතේ 19 වගන්තිය යටතේ ද්විත්ව පුරවැසිභාවය ලබාදීම නව ක්‍රමවේදයක් යටතේ 2015.03.23 දින ආරම්භ කරන ලදී. ඒ අනුව 2018 වර්ෂය තුළ "සුහුරුපාය" ගොඩනැගිල්ලේ පිහිටි ශ්‍රවණාගාරයේදී අවස්ථා 03 කදී උත්සවශ්‍රීයෙන් සහතිකපත් 7888 ක ප්‍රමාණයක් පිරිනමන ලදී.





2. 1948 අංක 18 දරන පුරවැසි පනතේ 11 වන වගන්තිය යටතේ ශ්‍රී ලාංකික පුරවැසිභාවය ලබා ගත් තැනැත්තන් සඳහා ද්විත්ව පුරවැසිභාවය ඉල්ලුම් කිරීමට අවස්ථාව සලසා දෙන ලදී.

3. දකුණු ඉන්දියාවේ සිට පැමිණි ශ්‍රී ලාංකික සරණාගතයන් 421 දෙනෙක් සඳහා ජංගම සේවාවන් දෙකක් 2018.07.01 හා 2018.07.02 දිනවල කිලිනොච්චියේ දී සහ 2018.08.12 හා 2018.08.13 දිනවල මන්නාරමේදී පවත්වන ලදී.

- 2018.07.01 හා 2018.07.02 දිනවල කිලිනොච්චියේදී පැවැත්වූ ජංගම සේවය





- 2018.08.12 හා 2018.08.13 දිනවල මන්නාරමේදී පැවැත්වූ ජංගම සේවය






එහිදී 1948 අංක 18 දරන පුරවැසි පනතේ 5(2) වගන්තිය යටතේ 372කට ද පුරවැසි පනතේ 11 වගන්තිය යටතේ 46කට ද ශ්‍රී ලාංකික පුරවැසිභාවය ලබාදීමට කටයුතු කරන ලදී.

## 06. තොරතුරු තාක්ෂණ අංශය

පාලක (තොරතුරු තාක්ෂණ) ගේ අධීක්ෂණය යටතේ මෙම අංශය ක්‍රියාත්මක වේ.

**කාර්ය මණ්ඩලය**

| තනතුර/ සේවාව | සංඛ්‍යාව |
|---|---|
| පාලක | 01 |
| සහකාර පාලක | 01 |
| බලයලත් නිලධාරි | 04 |
| සංවර්ධන නිලධාරි | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 03 |
| ගමන් බලපත්‍ර සහායක | 03 |
| කාර්යාල සේවක සේවය | 01 |

තොරතුරු තාක්ෂණ අංශයේ මූලික වගකීම වන්නේ දැනට පවත්නා මෘදුකාංග හා දෘඩාංග බාධාවකින් තොරව පවත්වාගෙන යාම සහ මහජනතාවට උපරිම සේවා පහසුව හා රජයට ප්‍රශස්ත පිරිවැයක් දැරෙන පරිදි නව ක්‍රමවේද හඳුන්වා දෙමින් දෙපාර්තමේන්තුවේ තොරතුරු පද්ධතිය වැඩිදියුණු කිරීම වේ. එමෙන්ම, මෙම දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතිය සඳහා සේවා සපයන බාහිර ආයතන සමග නිසි පරිදි ගිවිසුම් යාවත්කාලීන කිරීම සහ ගිවිසුම් ප්‍රකාරව කටයුතු පවත්වාගෙන යාම අධීක්ෂණය කිරීම ද මෙම අංශයේ තවත් කර්තව්‍යයක් වේ.

ඉහතින් දැක්වූ මූලික කාර්යභාරයට අමතරව පහත දැක්වෙන විශේෂිත කාර්යයන්ද තොරතුරු තාක්ෂණ අංශය මගින් ඉටු කරන ලදී.

**1. තොරතුරු තාක්‍ෂණ අංශය මගින් සිදුකරන ලද විශේෂ කාර්යයන්.**

- මහජන අවශ්‍යතා කෙරෙහි සංවේදී වෙමින් පවත්නා පරිගණක මෘදුකාංග මොඩියුල පහ සඳහා හඳුනාගත් වැඩිදියුණු කිරීම් සිදුකොට සේවා ඵලදායිතාව ඉහළ නැංවීම.
- දෙපාර්තමේන්තුව සඳහා නව වෙබ් අඩවියක් නිර්මාණය කිරීම හා යාවත්කාලීන කිරීම.
- නව පරිගණක උපකරණ මිලදී ගෙන, වඩා හොඳ සේවාවක් සැපයීමේ අරමුණින් පවතින දෘඩාංග හා මෘදුකාංග පද්ධතිය වැඩිදියුණු කිරීම (Upgrade).
- උසාවි නියෝග මත ගුවන් ගමන් මගීන් පිළිබඳව අවශ්‍ය කටයුතු යාවත්කාලීන කිරීම.අවශ්‍ය අවස්ථා වලදී ගමන්බලපත් අසාදු ලේඛණ ගත කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.

**2. අස්ථානගත වූ සොරකම් කරන ලද ගමන්බලපත්‍ර ඒකකය (SLTD)**

අස්ථානගත වූ, සොරකම් කරන ලද ගමන් බලපත්‍ර පිළිබඳව පොලිස් ස්ථාන විසින් ලබා දෙන තොරතුරු මධ්‍යම තොරතුරු කාර්යාංශය හෝ විදේශ දූත මණ්ඩල කාර්යාල විසින් හෝ සෘජුවම දෙපාර්තමේන්තුව වෙත තොරතුරු සම්ප්‍රේෂණය කරනු ලැබේ. ඒවා විමර්ශනය කොට, එම ගමන්බලපත්‍ර නැවත පරිහරණය කළ නොහැකි පරිදි අවලංගු කර, ජාත්‍යන්තර පොලිසිය (INTERPOL) වෙත යවනු ලබයි. එවැනි ගමන් බලපත්‍රයක් මගින් වෙනත් පුද්ගලයෙකු විදේශගත වීම වැලැක්වීමට පියවර ගෙන ඇති අතර, එවැනි නීති විරෝධී කටයුතු සිදුවීම වැලැක්වීම මෙම පද්ධතියේ මූලික අරමුණ වේ.

2018.01.01 දින සිට 2018.12.31 දින දක්වා මධ්‍යම තොරතුරු කාර්යාංශය (NCB) හා විදේශ දූත මණ්ඩල (SLDM) විසින් ගමන් බලපත්‍ර 10266ක් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට එවා ඇති අතර ගමන් බලපත්‍ර 2049 ක් ජාත්‍යන්තර පොලීසියේ දත්ත පද්ධතියට යවා ඇත.

### 3. ඒකාබද්ධ තොරතුරු කළමනාකරණ ඒකකය (IEMS)

ආගමන හා විගමන තොරතුරු හා සංඛ්‍යා ලේඛන ලබා දීම සඳහා ඒකාබද්ධ තොරතුරු කළමනාකරණ ඒකකය (IEMS) ස්ථාපනය කරන ලදී. ශ්‍රී ලංකාවේ පිහිටි විදේශ තානාපති කාර්යාලයන් සෘජුව සම්බන්ධතා පවත්වන්නේ මෙම අංශය සමග වන අතර අවශ්‍ය විටකදී වීසා නිකුත් කිරීමට පෙර විදේශ ගමන් බලපත් පිළිබඳ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම මෙම අංශය හරහා කරනු ලබයි. 2018.01.01 සිට 2018.12.31 දින දක්වා අප දෙපාර්තමේන්තුව මගින් විමසුම් 1713 ක් සඳහා පිළිතුරු ලබා දී ඇත.

පසුගිය වසර පහක කාලසීමාව තුළ ගමන් බලපත්වල නිරවද්‍යතාවය තහවුරු කරමින් යොමු කරන ලද ලිපි සංඛ්‍යාව පහත පරිදි වේ:

| | ආයතනය | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|---|
| 1 | ජර්මන් තානාපති කාර්යාලය | 469 | 222 | 100 | 21 | 8 |
| 2 | ප්‍රංශ තානාපති කාර්යාලය | 88 | 104 | 86 | 29 | 166 |
| 3 | නෝර්වේ තානාපති කාර්යාලය | 86 | 161 | 16 | 7 | 10 |
| 4 | ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලය | 302 | 384 | 336 | 253 | 102 |
| 5 | ඇමරිකානු තානාපති කාර්යාලය | 359 | 86 | 69 | 23 | 22 |
| 6 | ඉතාලි තානාපති කාර්යාලය | 15 | 23 | 9 | 21 | 1 |
| 7 | ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලය | 104 | 42 | 137 | 197 | 119 |
| 8 | කැනඩා මහ කොමසාරිස් කාර්යාලය | 133 | 52 | 17 | 99 | 116 |
| 9 | එක්සත් රාජධානි මහ කොමසාරිස් කාර්යාලය | 183 | 182 | 169 | 406 | 374 |
| 10 | නෙදර්ලන්ත තානාපති කාර්යාලය | 3 | 1 | 2 | 0 | 0 |
| 11 | තායිලන්ත තානාපති කාර්යාලය | 0 | 5 | 2 | 1 | 1 |
| 12 | ජපන් තානාපති කාර්යාලය | 0 | 0 | 0 | 0 | 0 |
| 13 | ඉන්දියානු සහකාර මහ කොමසාරිස් කාර්යාලය | 2 | 1 | 0 | 0 | 0 |
| 14 | ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය, බ්‍රිතාන්‍යය | 872 | 911 | 955 | 661 | 690 |
| 15 | ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය, නවදිල්ලිය | 0 | 0 | 0 | 0 | 0 |
| 16 | ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය | 5 | 11 | 23 | 16 | 102 |
| 17 | විදේශ කටයුතු අමාත්‍යාංශය | 9 | 4 | 4 | 2 | 0 |
| 18 | ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව | 0 | 0 | 7 | 0 | 2 |
| | **එකතුව** | **2630** | **2189** | **1932** | **1736** | **1713** |

4. **නැවත භාරගැනීමේ සිද්ධි කළමනාකරණ පද්ධතිය. (RCMS)**

විදේශයන්හි දී පිටුවහල් කරන ශ්‍රී ලාංකිකයින් සම්බන්ධයෙන් ඒ ඒ රටවල පිහිටි තානාපති කාර්යාල මගින් ඔවුන්ගේ ශ්‍රී ලාංකිකභාවය තහවුරු කර ගැනීමෙන් පසු අදාල දත්ත හා තොරතුරු පරිගණක පද්ධතිය හරහා මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ලැබේ. එම පරිගණක පද්ධතිය තුලින්ම දෙපාර්තමේන්තුව සතු ගමන් බලපත් දත්ත සහ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ දත්ත උපයෝගී කර ගෙන අවසාන වශයෙන් පුද්ගලයාගේ ශ්‍රී ලාංකිකභාවය තහවුරු කර ගැනීමෙන් පසු තාවකාලික ගමන් ලියවිල්ලක් (Temporary Travel Document ) නිකුත් කිරීම සඳහා නිර්දේශය ලබා දේ. ඒ අනුව පසුගිය වසර පහක කාලසීමාව තුළ ශ්‍රී ලංකා තනාපති කාර්යාල මගින් නිකුත් කර ඇති තාවකාලික ගමන් ලියවිලි පිළිබඳ විස්තර පහතින් දැක්වේ:

| රට | ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් නිකුත් කරන ලද තාවකාලික ගමන් ලියවිලි සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
| ඕස්ට්‍රේලියාව | 122 | මෙම පද්ධතිය ක්‍රියාත්මක නොවිනි. | 223 | 271 | 299 |
| ඔස්ට්‍රියාව | 2 | | 0 | 0 | 1 |
| බෙල්ජියම | 3 | | 0 | 3 | 3 |
| කැනඩාව | 39 | | 25 | 31 | 33 |
| ප්‍රංශය | 32 | | 34 | 56 | 54 |
| ජර්මනිය | 0 | | 12 | 27 | 23 |
| ඉන්දුනීසියාව | 31 | | 0 | 0 | 0 |
| ඉතාලිය | 3 | | 1 | 0 | 6 |
| ජපානය | 24 | | 55 | 20 | 28 |
| කොරියාව | 13 | | 0 | 0 | 0 |
| මැලේසියාව | 0 | | 0 | 0 | 0 |
| නෙදර්ලන්තය | 3 | | 2 | 5 | 7 |
| නෝර්වේ | 3 | | 2 | 6 | 4 |
| පිලිපීනය | 0 | | 0 | 0 | 0 |
| පෝලන්තය | 5 | | 3 | 55 | 10 |
| රුසියානු සමූහාණ්ඩුව | 3 | | 5 | 0 | 16 |
| ස්වීඩනය | 8 | | 17 | 11 | 5 |
| ස්විට්සර්ලන්තය | 6 | | 24 | 59 | 83 |
| තායිලන්තය | 2 | | 0 | 0 | 0 |
| තුර්කිය | 0 | | 25 | 57 | 54 |
| මහා බ්‍රිතාන්‍යය | 99 | | 104 | 176 | 112 |
| එක්සත් රාජධානිය | 5 | | 2 | 17 | 21 |
| * ශ්‍රී ලංකාව | 0 | | 0 | 0 | 6 |
| එකතුව | **403** | **-** | **534** | **794** | **765** |

* මෙම අයදුම් පත්‍ර විදේශ දූත මණ්ඩල නොමැති හා ප්‍රමාද සහිත අයදුම්පත්වලට අදාලව විදේශ කටයුතු අමාත්‍යාංශය මගින් පද්ධතියට ඇතුලත් කරන ලද ඒවාය.

**2018 වර්ෂයේ මෙම අංශය විසින් සිදු කරන ලද විශේෂ වැඩසටහන්**

1. ප්‍රධාන දත්ත ගබඩාව (Server) Hyper Converge Infrastructure ලෙස යාවත්කාලීන කිරීම.

මේ වන විට ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සතුව පවතින ප්‍රධාන දත්ත ගබඩාව 2012 වසරේ ස්ථාපිත කරන ලද්දක් වන අතර මේ වන විට තාක්ෂණික වශයෙන් යාවත්කාලීන කිරීමට සිදුවන ලෙසින් දත්ත ගබඩාවේ මෘදුකාංග කල් ඉකුත් වී ඇත. මේ අනුව දැනට පවතින නවීනතම තාක්ෂණය වන VM තාක්ෂණය භාවිතා කළ හැකි ලෙස මෘදුකාංග සඳහා වැඩි පහසුකමක් ලැබෙන පරිදි සකසනයක් (Intel Processor) සහිත දත්ත ගබඩාව (server) යාවත්කාලීන කිරීම මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වේ. **මේ යටතේ,**

(i) IBM power server 2012 පද්ධතිය Intel Hyper Converge Infrastructure 2018 මඟින් යාවත්කාලීන කිරීම,

(ii) VM තාක්ෂණය මගින් පද්ධතියේ ගබඩා පහසුකම් වැඩි දියුණු කර ගැනීම,

(iii) මේ වන විට ප්‍රධාන දත්ත ගබඩාව (Server) යාවත්කාලීන වීම් නොමැති කමින් තාක්ෂණික ගැටළු මතුව ඇති මෘදුකාංග පහසුවෙන් ක්‍රියා කරවීමට අවශ්‍ය දත්ත පද්ධති පහසුකම සැපිරීම අපේක්ෂා කෙරේ.





2. ගුවන් තොටුපල ආගමන විගමන කවුළු රාජකාරි සඳහා ගමන් බලපත් පරිලෝඛණ (Scanner) යන්ත්‍ර මිලදී ගැනීම.

දැනට කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ ආගමන විගමන ප්‍රත්‍යන්ත පාලන කවුළුවල රාජකාරි කිරීම සඳහා භාවිතා වන ගමන් බලපත් පරිලෝඛණ (Scanner) යන්ත්‍රවල වගකීම් කාලසීමාව (warranty) අවසන් වීම සහ යාන්ත්‍රික දෝෂ නිසා නව යන්ත්‍ර මගින් ප්‍රතිස්ථාපනය කළ යුතුව ඇත. ඒ අනුව නිවැරදි ලෙස දත්ත හා තොරතුරු ලබාගත හැකි විද්‍යුත් ගමන් බලපත් හා යන්ත්‍රානුසාරයෙන් කියවිය හැකි (MRZ) ගමන් බලපත් සඳහා අනුකූල වන පරිලෝකන යන්ත්‍ර ලබාගැනීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදුවේ.මෙමගින්,

(i) කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ ප්‍රත්‍යන්ත පාලන රාජකාරි සඳහා භාවිතා වන ගමන් බලපත් පරිලෝකන යන්ත්‍ර (Scanner), විද්‍යුත් ගමන් බලපත් හා MRZ ගමන් බලපත් කියවිය හැකි පරිලෝකන යන්ත්‍ර මගින් ප්‍රතිස්ථාපනය කිරීම.

(ii) කාර්යක්ෂම හා ඵලදායී ලෙස ප්‍රත්‍යන්ත පාලන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම අපේක්ෂා කෙරේ.



3. මාර්ගගත ක්‍රමයට වීසා දීර්ඝ කිරීම - අදියර I හා II

ශ්‍රී ලංකාවට ඇතුළුවන වලංගු වීසා සහිත සංචාරකයින්ගේ වීසා දිගුකිරීමේ ක්‍රියාවලිය මාර්ගගත ක්‍රමයට සිදු කෙරේ. මේ යටතේ,

(i) ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින් ආගමන හා විගමන දෙපාර්තමේන්තුව තුල රැඳී සිටීමේ කාලය අඩු කිරීම මගින් ශ්‍රී ලංකාවේ සංචාරය කිරීමට සංචාරකයින් උනන්දු කිරීම,

(ii) වලංගු වීසා නොමැතිව රැඳී සිටින සංචාරකයින් ප්‍රමාණය අවම කර ගැනීම,

(iii) වීසා නිකුත් කිරීම සඳහා ගතවන කාලය අඩු කිරීම මගින් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය ඉහළ නැංවීම අපේක්ෂා කෙරේ.

4. නැවත භාර ගැනීමේ ගැටලු කළමනාකරණ පද්ධතියට (Readmission Case Management System) අදාළව ජෝර්ජියාවේ අධ්‍යයන චාරිකාව

ශ්‍රී ලංකාවේ නැවත භාර ගැනීමේ ගැටලු කළමනාකරණ පද්ධතිය තවදුරටත් සංවර්ධනය කිරීම උදෙසා ජෝර්ජියාවේ ක්‍රියාත්මක වන පද්ධතිය නිරීක්ෂණය කිරීමට 2018 අගෝස්තු මස 5 සිට 7 දක්වා අධ්‍යයන චාරිකාවක් සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකාවේ නැවත භාර ගැනීමේ අයදුම්පත් ක්‍රියාවලිය වැඩිදියුණු කර මනා විනිවිදභාවයකින් හා වගවීමකින් යුතු පද්ධතියක් හඳුන්වාදීමේ අරමුණින් තාක්ෂණික සැලසුම් නිරීක්ෂණය කර සාකච්ඡා කිරීම, කාර්ය ප්‍රවාහයන් ආශ්‍රිත තාක්ෂණික කටයුතු, ආරක්ෂක හා සැලසුම් අංග යන කරුණු පිළිබඳව මෙම චාරිකාවේදී අවධානය යොමු කරන ලදී. යුරෝපානු නැවත භාර ගැනීමේ ධාරිතා සංවර්ධන පහසුකම (EURCAP) ආයතනයේ තොරතුරු තාක්ෂණ විශේෂඥ හා ජෝර්ජියානු පද්ධති උපදේශකවරයාගේ සහභාගීත්වයෙන් රැස්වීම් පවත්වන ලද අතර නැවත භාර ගැනීමේ ගැටලු කළමනාකරණ පද්ධතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳව ඔවුන්ගේ විශේෂඥ දැනුම හා අත්දැකීම් එහිදී හුවමාරු කරගන්නා ලදී.





## 2019 වර්ෂය තුළ ඉටු කිරීමට අපේක්ෂිත කාර්යයන්

1. මගී ගමන් රටා අධ්‍යයන මොඩියුලය

ප්‍රත්‍යන්ත පාලන පද්ධතිය මගින් ගුවන් ගමන් විස්තර වාර්ථා විවිධ උපමානයන් යටතේ විශ්ලේෂණය කළ හැකි පරිදි මොඩියුලය වැඩි දියුණු කිරීම මෙමගින් අපේක්ෂා කෙරේ.(උදාහරණ:- ජාතිය, වයස, ස්ත්‍රි පුරුෂභාවය).මෙමගින් පද්ධතියේ සටහන් දත්ත අවශ්‍ය ආකාරයට හසුරුවමින් විශේෂිත වූ වාර්තා පාලක ජනරාල්වරයාගේ බලය ලැබූ නිලධාරියකුට පිළියෙල කර ගැනීමේ පහසුකම සැලසීම සිදු වේ.මෙම තොරතුරු රජයේ අනෙකුත් දෙපාර්තමේන්තු සමඟ හුවමාරු කර ගැනීමෙන් රාජ්‍ය සේවයේ කාර්යක්‍ෂමතාව හා කළමනාකරණය ඉහළ නැංවීමට හේතු වේ.

2. අධි අවදානම් තැනැත්තන්ගේ ප්‍රත්‍යන්ත අධීක්ෂණ මොඩියුලය

මෙමගින් අධි අවදානම් තැනැත්තන් ප්‍රත්‍යන්ත සීමා පසු කර යාම් සෘජුවම පාලක ජනරාල් වෙතට වාර්ථා කිරීම කෙටි පණිවුඩයක් හෝ විද්‍යුත් තැපැල (email) මාර්ගයෙන් සිදු කරනු ලබයි. පාලක ජනරාල් වෙත ට වාර්තා වන කරුණු කිසිදු අන් පුද්ගලයකු හට නිරීක්ෂණය කළ නොහැකි වන බැවින් අවශ්‍යතාව පරිදි ජාතික ආරක්ෂාව සඳහා යොදාගත හැක.

3. මාර්ගගත නොවන ක්‍රමයට මගී නැව් නිෂ්කාශන කිරීමේ මොඩියුලය

දැනට ශ්‍රී ලංකාවට පැමිණෙන හා පිටවෙන මගී නැව් නිෂ්කාෂණය සිදු කිරීමේදී මගීන් සඳහා ගාස්තු රහිත විද්‍යුත් සංචරණ අනුමැතියක් ලබා දීම දැනට සිදු කරයි. අන්තර් ජාතික පොලිස් වාර්ථා (Interpol) පරීක්ෂා කිරීම පසුව සිදුවන බැවින් කිසියම් ආකාරයක ආරක්ෂිත බවේ අඩුකමක් දක්නට ලැබේ.මෙම කරුණු සලකා මගී නැව්වලට එය අවසන් වරට නිෂ්කාෂණය වන වරායෙන් ආගමන විගමන නිලධාරීන් හා තාක්ෂණික කණ්ඩායම් ගොඩ වී නිෂ්කාෂණ කටයුතු සිදු කිරීම මෙමගින් අපේක්ෂා කරයි. මෙය වඩාත් ආරක්ෂාකාරී හා ක්‍රමවත් වන අතර 2020 වසරේ සිට මෙම මගී නැව් සඳහා විද්‍යුත් සංචරණ අනුමැතිය, ගාස්තුව සහිතව සිදු කිරීමෙන් ජාතික ආදායමට ඩොලර් ලක්‍ෂ තිස්පහකට (35) ආසන්න මුදලක් වාර්ෂිකව ඉපයීමට හැකි වේ යැයි අපේක්ෂා කෙරේ.

4. අධිකරණ නියෝග හා අසාදුගත ලේඛන ගුවන් ගමන් තහනම් කිරීමේ ඒකකයට පරිලෝකන පහසුකම් සැපයීම.

වර්තමානයේ අසාදුගත ලේඛන කළමනාකරණය සඳහා Centralized Black Listed පද්ධතිය (CBL) භාවිත කරනු ලබන අතර එහිදී අදාල අධිකරණ නියෝග හෝ පොලිස් වාර්ථා පද්ධතියට ඇතුළත් කළද පරිලෝකනය (Scan) කිරීමේ පහසුකමක් සපයා නොමැත.මේ සඳහා පද්ධතියේ අවශ්‍ය වෙනස්කම් සිදු කොට ඇති අතර එයට අවශ්‍ය පරිලෝඛණ යන්ත්‍ර (Scanner) ලබා ගැනීම මෙහිදී අපේක්ෂා කරයි. මෙමගින් අත්‍යවශ්‍ය වැදගත් ලේඛන පරිලෝඛණගත (Scan) කිරීමත් ඒවා නැවත ලබා ගැනීමත් පහසු වන අතර නීති අංශයේ හා තොරතුරු තාක්ෂණ අංශයේ කාර්යයන් වඩාත් පහසු වේ.

5. විද්‍යුත් සංචරණ පද්ධතිය හා රාජ්‍ය බුද්ධි සේවා පද්ධතිය මාර්ග ගත ක්‍රමයට අනුකලනය කිරීම

දැනට විද්‍යුත් සංචරණ පද්ධතිය සඳහා ඉදිරිපත් වන අයදුම්පත් Watch List, Black List හා රාජ්‍ය බුද්ධි සේවා විසින් පවත්වාගෙන යනු ලබන තොරතුරු ලේඛන සමග සසඳා විද්‍යුත් තැපැල මගින් ලැබෙන නිවැරදි තොරතුරු ස්වයංක්‍රීය නොවන ක්‍රමයට දත්ත පද්ධතියට ඇතුළු කිරීම සිදු වේ. මෙය ස්වයංක්‍රීය ක්‍රමයක් තුළ සිදු කිරීමෙන් ඒ සඳහා ගතවන කාලය පැය 24ත් 48 ත් අතර කාලයකට සීමා කරගත හැකි අතර එමගින් කාර්යක්ෂම විද්‍යුත් සංචරණ පද්ධතියක් සංචාරකයින් වෙත ලබා දිය හැකි වේ.ඒ සමඟින්ම පද්ධතියේ තොරතුරුවල ආරක්ෂාවත් විශ්වාසනීය බවත් ආරක්ෂා වේ.

6. විමර්ශන මොඩියුලය හඳුන්වාදීම හා එයට එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ තොරතුරු ලියාපදිංචි කිරීමේ පහසුකම ලබාදීම.

ආගමන විගමන නිලධාරින් විසින් සිදුකරනු ලබන විමර්ශන, අත්අඩංගුවට ගැනීම් හා ඉදිරි නීතිමය කටයුතු සියල්ල පරිගණකගත කිරීමෙන් විමර්ශන වාර්තා, රැඳවියන්ගේ තොරතුරු නිසි පරිදි කළමනාකරණය කිරීමට හැකිවේ. එමෙන්ම එම තොරතුරු විශ්ලේෂණය කිරීමෙන් ඉදිරි විමර්ශන කටයුතු හා ආරක්ෂක පියවරයන් සඳහා භාවිතා කිරීමට ද හැකිවේ. එමෙන්ම මෙම පද්ධතිය තුළින් රට තුළට ඇතුලුවී සරණාගත භාවයන් ඉල්ලා සිටින සංක්‍රමකයින් එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහලේකම් කාර්යාලයේ ලියාපදිංචි වී ඇත්නම් ඒ පිළිබඳව තොරතුරු ඇතුළත් කිරීමෙන් ඒවා විමර්ශන කටයුතු සඳහා යොදා ගැනීමට ද වීසා නිකුත් කිරීමේ ක්‍රියාවලියට එම තොරතුරු පාදක කර ගැනීමෙන් අනවශ්‍ය පුද්ගලයින් සඳහා වීසා දිගු කිරීමෙන් වැලකී සිටීමට ද, ඔවුන් රටින් ඉවත් කිරීමට ද හැකි වේ.

7. වාස වීසා අයදුම් කිරීම මාර්ගගත ක්‍රමයට දිගු කිරීමේ පහසුකම ඇති කිරීම.

වාස වීසා ලබාගත් පසු ඒවා නැවත දිගු කිරීම සඳහා අයදුම්කරුවන් ප්‍රධාන කාර්යාලය වෙතටම පැමිණීමට සිදුවීමෙන් කාලයත් ශ්‍රමයත් සේම අයදුම්කරුවන්ට ද ශ්‍රී ලංකාව තුළ රැඳී සිටීමට දිරිමත් නොකරන තත්ත්වයක් හට ගෙන ඇත. මෙම වාස වීසා අයදුම්කරුවන් ජාතික ආර්ථිකයට විදේශ මුදල් සම්ප්‍රේශණය කරන පුද්ගලයන් වන අතර ඔවුන් ශ්‍රී ලංකාව තුළ රැඳී සිටීම දිරිමත් කිරීම, අත්‍යවශ්‍ය කාරණයකි. එබැවින් මාර්ගගත ක්‍රමයට ලේඛන හා තොරතරු දත්තගත කර ගැනීමෙන් ඔවුන්ගේ කාලය ද, ආගමන හා විගමන දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ කාලය ද යන දෙකම කළමනාකරණය වේ. කෙසේ වෙතත් වීසාව ලබා ගැනීමේදී සම්මුඛ පරීක්ෂණයක් සඳහා ඔවුන් කාර්යාලය වෙත පැමිණිය යුතු වුවත් එහිදී පුද්ගලයා තහවුරු කර ගැනීමේ අවශ්‍යතාව මත එසේ සිදු කරයි. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේත්, පුද්ගලයාගේත් කාලය කළමනාකරණය කිරීම මෙමගින් අපේක්ෂා කරයි.

8. සංඛ්‍යා ලේඛන තොරතුරු සකස් කළ හැකි මොඩියුලයක් හා දර්ශන තිර හඳුන්වාදීම.

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සතු දත්ත රටේ ආර්ථිකයේ ඉදිරි ගමන් මග කෙසේ විය යුතු ද යන්න තීරණය කිරීම සඳහා තීරණ ගැනීමේ කාර්යයන් සිදු කිරීමට රජයට ඉතා වැදගත් වේ.තවද ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, මහ බැංකුව වැනි ආයතනවල වාර්ෂික වාර්තා සකස් කිරීමට ද මෙම තොරතුරු වැදගත් වේ. එම නිසා දැනට පවතින දත්ත කළමනාකරණ පද්ධතිය සඳහා ස්ථාවර තොරතුරු ලබා දියහැකි වගුගත දර්ශණ තිර සකස් කිරීම මෙම ව්‍යාපෘතිය තුළින් සිදුකිරීමට අපේක්ෂා කරයි.

9. ප්‍රධාන මොඩියුලයන්වල හා මෘදුකාංගවල සිදු කළයුතු අත්‍යාවශ්‍ය වෙනස්කම් සිදු කිරීම.

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පවතින ප්‍රධාන මෘදුකාංග මොඩියුලයන් පිළිබඳ වෙනස්කම් සිදු කිරීම කාලීන අවශ්‍යතාවන් අනුව වරින් වර සිදුවේ. මෙමගින්, පද්ධති ආරක්ෂාව තවදුරටත් ඉහළ නැංවීමත්, මහජනතාව සඳහා වඩා හොඳ සේවයක් ලබාදීමත් මගින් රජයේ ආදායම් ඉහළ නැංවීම සිදුවන අතර රාජ්‍ය ප්‍රතිරූපය ඉහළ නැංවීමක් ද සිදු වේ. මෙම පද්ධති අනුකළනය සුමටව සිදුකිරීමෙන් වඩාත් කාර්යක්ෂම හා ඵලදායී ගමන් බලපත් නිකුත් කිරීමේ ක්‍රියාවලියක් සහ වීසා හා ප්‍රත්‍යන්ත කළමනාකරණයක් සිදු කිරීමට හැකියාව ලැබෙනු ඇත.

10. ප්‍රත්‍යන්ත කළමනාකරණය සඳහා අනුකලිත ප්‍රත්‍යන්ත කළමනාකරණ පද්ධතිය හා ප්‍රත්‍යන්ත කළමණාකරණ මධ්‍යස්ථානය පිහිටුවීම.

ප්‍රත්‍යන්ත කළමනාකරණයේදී ජාතික ආරක්ෂාවට අදාල වඩාත් සංවේදී කරුණු සම්බන්ධ තීරණ සියලු ආයතන එක්ව ගැනීම තුළින් ඉතා ආරක්ෂාකාරී ලෙස ප්‍රත්‍යන්ත දේශ සීමා කළමනාකරණය සිදු කිරීම, ප්‍රත්‍යන්ත කළමනාකරණය සඳහා අනුකලිත ප්‍රත්‍යන්ත කළමනාකරණ පද්ධතියක් හා ප්‍රත්‍යන්ත කළමනාකරණ මධ්‍යස්ථානයක් පිහිටුවීම මගින් අපේක්ෂා කෙරේ. එහිදී පද්ධතිය තුළ වෙනස්කම් සිදුකර පද්ධතිය අනුකලිත කිරීමෙන් තොරතුරු සම්ප්‍රේශණය ඉහළ නැංවීම ද සිදු වේ.

11. ද්විත්ව පුරවැසිභාවය දරන්නන් සඳහා යන්ත්‍රානුසාරයෙන් කියවිය හැකි හැඳුනුම්පතක් නිකුත් කිරීම

ද්විත්ව පුරවැසිභාවය දරන්නන් හඳුනා ගැනීම සඳහා දැනට නිකුත් කරනු ලබන ද්විත්ව පුරවැසි සහතිකයට අමතරව ඒ සඳහා යන්ත්‍රානුසාරයෙන් කියවිය හැකි හැඳුනුම්පතක් නිකුත් කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. ආගමන විගමන කවුළුවල රාජකාරිවල නිරත නිලධාරීන් ද්විත්ව පුරවැසිභාවය සනාථ කිරීමට දැනට නිකුත් කරන ද්විත්ව පුරවැසි සහතිකය ඉල්ලා සිටින අවස්ථාවේදී, විශාල ප්‍රමාණයේ ද්විත්ව පුරවැසි සහතිකයක් රැගෙන යාම, ඉදිරිපත් කිරීම අපහසු බැවින් හා එය තාක්ෂණික වශයෙන් දියුණු පද්ධතියකට අනුකලනය කිරීමට නොහැකි වීම නිසාද ඒ සඳහා යන්ත්‍රානුසාරයෙන් කියවිය හැකි කුඩා ප්ලාස්ටික් හැඳුනුම්පතක් නිකුත් කිරීම විසඳුමක් ලෙස ක්‍රියාත්මක කිරීමට නියමිත වේ.

# 07. ගිණුම් අංශය

ප්‍රධාන ගණකාධිකාරීගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන  මෙම අංශයේ කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

| තනතුර/සේවාව | තනතුරු ගණන |
|---|---|
| ප්‍රධාන ගණකාධිකාරි | 01 |
| ගණකාධිකාරි (ආදායම්) | 01 |
| ගණකාධිකාරි  (ගෙවීම්) | 01 |
| පරිපාලන නිලධාරී (මුදල්) | 01 |
| අයවැය සහකාර | 01 |
| සංවර්ධන නිලධාරී | 04 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 52 |
| කාර්යාල සේවක සේවය | 03 |

### මූල්‍ය කළමනාකරණය

ආගමන හා විගමන දෙපර්තමේන්තුවේ මූල්‍ය කළමනාකරණය මුදල් අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. ආදායම් උපයන දෙපාර්තමේන්තුවක් වන මෙහි ආදායම් හා වියදම් පිළිබඳ කළමනාකරණය, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් කටයුතු නියමිත සීමාවන් තුළ පවත්වාගෙන යාම, භාණ්ඩාගාර චක්‍රලේඛ ප්‍රකාරව මෙම දෙපාර්තමේන්තුවේ වාර්ෂික/මාසික වාර්තාවන් (වාර්ෂික අයවැය ඇස්තමේන්තුව, වාර්ෂික ආදායම් ඇස්තමේන්තුව, විසර්ජණ ගිණුම, මාසික ගිණුම් සාරාංශ)  පිළියෙල කර නියමිත දිනයන්හි භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම සහ මුදල් රෙගුලාසිවලට අනුකූලව මූල්‍ය කටයුතු මෙහෙයවීම මෙම අංශය තුළින් සිදුවන  ප්‍රධාන කාර්යභාර්ය වේ.

### ආදායම් ඉලක්ක හා ප්‍රගතිය

2018 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුගත මුළු ආදායම් ඉලක්කය රුපියල් මිලියන 16,000 ක් වූ අතර,  2018.12.31 දිනට උපයන ලද මුළු ආදායම රුපියල් මිලියන 17,260 ක් විය.  2018 මුළු ආදායම් ඉලක්කය ඉක්මවමින් රුපියල් මිලියන 1,260ක ආදායම් වර්ධනයක් වාර්තාකර ඇත. 2018 වර්ෂයේ ඇස්තමේන්තුගත අදායම හා සලකා බලන කල ආදායමේ වර්ධනය  සියයට 7.88 කි.

**2018 වර්ෂයේ දෙපාර්තමේන්තුව ප්‍රධාන ආදායම් මූලාශ්‍ර තුළින් උපයන ලද ආදායම් පහත පරිදි වේ.**

| අනු. අංකය | ප්‍රධාන ආදායම් මූලාශ්‍රය | උප අදායම් මූලාශ්‍රය | ආදායම (රු.) |
|---|---|---|---|
| **1** | **ගමන් බලපත් නිකුත් කිරීම් හා සංශෝධන** | | **2,827,558,600** |
| | | (i) එක්දින ගමන් බලපත්‍ර නිකුත් කිරීම | 2,103,123,000 |
| | | (ii) සාමාන්‍ය ගමන් බලපත්‍ර නිකුත් කිරීම | 694,066,000 |
| | | (iii) ගමන් බලපත්‍ර සංශෝධනය කිරීම | 29,749,200 |
| | | (iv) වෙනත් | 620,400 |
| **2** | **විදේශ දූත මණ්ඩල හරහා ගමන් බලපත් කටයුතු** | | **1,374,155,955** |
| **3** | **තොටුපල කටයුතු** | | **64,371,000** |
| **4** | **වීසා නිකුත් කිරීම්/ දීර්ඝ කිරීම්** | | **1,240,281,160** |
| | | (i) පදිංචිය සඳහා වීසා නිකුත් කිරීම | 799,491,471 |
| | | (ii) සංචාරක වීසා නිකුත් කිරීම | 311,570,855 |
| | | (iii) වීසා දීර්ඝ කිරීම | 129,218,834 |
| | | (iv) වෙනත් | - |
| **5** | **විද්‍යුත් සංචරන වීසා වැඩසටහන (ETA)** | | **10,142,914,555** |
| **6** | **පුරවැසි අංශය** | | **1,610,608,260** |
| | **එකතුව** | | **17,259,889,530** |



# ආදායම් විශ්ලේෂණය 2014 – 2018

| වර්ෂය | ගමන් බලපත් නිකුත් කිරීම් හා සංශෝධන | විදේශ දූත මණ්ඩල හරහා ගමන් බලපත් කටයුතු | තොටුපල කටයුතු | වීසා නිකුත් කිරීම් / දීර්ඝ කිරීම් | විද්‍යුත් සංචරණ අනුමැතිය (ETA) | පුරවැසි අංශය | මුළු ආදායම |
|---|---|---|---|---|---|---|---|
| 2014 | 2,133,548,087 | 1,064,296,091 | 72,488,000 | 800,098,823 | 4,034,041,937 | 46,423,010 | **8,150,895,948** |
| 2015 | 2,104,719,692 | 1,027,633,544 | 74,065,000 | 917,471,394 | 5,133,896,060 | 850,008,800 | **10,107,794,490** |
| 2016 | 2,599,994,181 | 1,235,650,754 | 65,763,000 | 1,041,235,094 | 7,810,353,777 | 2,873,651,440 | **15,626,648,246** |
| 2017 | 2,639,465,409 | 1,325,155,681 | 68,060,000 | 1,145,079,267 | 8,465,413,734 | 1,650,184,560 | **15,293,358,651** |
| 2018 | 2,827,558,600 | 1,374,155,955 | 64,371,000 | 1,240,281,160 | 10,142,914,555 | 1,610,608,260 | **17,259,889,530** |
| මුළු ආදායම | **12,305,285,969** | **6,026,892,025** | **344,747,000** | **5,144,165,738** | **35,586,620,063** | **7,030,876,070** | **66,438,586,865** |




## 2018 වර්ෂයේ ඇස්තමේන්තුගත වියදම (සංශෝධිත) සහ තත්‍ය වියදම

2018 වර්ෂයේ දෙපාර්තමේන්තු වියදම් සඳහා ඇස්තමේන්තුගත (සංශෝධිත) ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 2,786.93ක් විය. එයින් රුපියල් මිලියන 1,713.93 ක් පුනරාවර්තන වියදම් වෙනුවෙන් ද රුපියල් මිලියන 1,073 ක් මූලධන වියදම් වෙනුවෙන් ද වෙන්කරන ලදී. 2018 වර්ෂයේ සමස්ථ තත්‍ය වියදම රුපියල් මිලියන 2,727.25ක් වූ අතර එයින් රු.මිලියන 1,675.48ක් පුනරාවර්තන වියදම් වෙනුවෙන් ද, රු.මිලියන1,051.77 මූලධන වියදම් වෙනුවෙන් ද වැය කර ඇත.

# වියදම් සංයුතිය - 2018







## මූල්‍ය ප්‍රගතිය (වියදම්) -2018 වර්ෂය

| වියදම් වර්ගීකරණය | 2018 සංශෝධිත ඇස්තමේන්තුව (රු.) | සත්‍ය වියදම 2018.12.31 දිනට (රු.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 1,713,928,000 | 1,675,480,879.68 | 98 |
| පුද්ගල පඩිනඩි | 646,100,000 | 645,262,684.87 | 99 |
| ගමන් වියදම් | 42,300,000 | 41,659,227.69 | 98 |
| සැපයීම් | 52,300,000 | 49,503,519.51 | 95 |
| නඩත්තු වියදම් | 171,900,000 | 152,537,309.89 | 89 |
| ගිවිසුම්ගත සේවා | 789,398,000 | 774,593,061.99 | 98 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 11,930,000 | 11,925,075.73 | 99 |
| මූලධන වියදම් | 1,073,000,000 | 1,051,768,007.57 | 98 |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 17,500,000 | 17,464,819.64 | 99 |
| ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම | 196,100,000 | 195,423,368.97 | 99 |
| පුහුණු කිරීම් සහ හැකියා වර්ධනය | 8,400,000 | 6,355,914.32 | 76 |
| වෙනත් ආයෝජන | 851,000,000 | 832,523,904.64 | 98 |
| මුළු එකතුව | 2,786,928,000 | 2,727,248,887.25 | 98 |

## 8. අභ්‍යන්තර විගණන අංශය

ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ අධීක්ෂණය යටතේ මෙම අංශය ක්‍රියාත්මක වේ.

**කාර්ය මණ්ඩලය - 2018**

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 03 |
| කාර්යාල කාර්ය සහයක | 01 |

### අරමුණු

- දෙපාර්තමේන්තුවේ මුදල් කටයුතු පිළිබඳව පවත්වන අභ්‍යන්තර පාලන ක්‍රමයට සහභාගී වී එම කටයුතුවල වැරදි හා වංචා වැළැක්වීමට සහ අනාවරණය කර ගැනීමට භාවිත කරනු ලබන අභ්‍යන්තර සෝදිසියෙහි විධිමත්බව හා ප්‍රමාණවත් බව පිළිබඳව අඛණ්ඩ සමීක්ෂණයක් හා ස්වාධීන ඇගයීමක් පවත්වාගෙන යාම.
- දෙපාර්තමේන්තුවට නියම කෙරුණු හෝ දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද සංවර්ධන ව්‍යාපෘති සහ යෝජනාක්‍රම ක්‍රියාත්මක කිරීමෙහි හා සැලසුම් සහ වැඩ සටහන් සපුරාලීමෙහිලා ලබා ඇති ප්‍රගතිය නිශ්චය කිරීමට ගණන් දීමේ නිලධාරියාට සහ ප්‍රගති අන්වේෂණ කමිටුවට සහාය වීම.
- උචිත අවස්ථාවල දී මෙම කර්තව්‍යයන්හි නිරත අයවලුන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ ප්‍රගති/ අන්වේෂණ කමිටුව අතර සම්බන්ධකාරකය ද වශයෙන් ක්‍රියා කිරීම.

### කාර්ය භාරය

- වැරදි හා වංචා වැළැක්වීම සඳහා දෙපාර්තමේන්තුව තුළ ක්‍රියාත්මක වන අභ්‍යන්තර සෝදිසි හා පාලන ක්‍රමය සැලැස්ම අතින් මෙන්ම තත්‍ය ක්‍රියාකාරිත්වය අතින් සාර්ථක දැයි සොයා බැලීම.
- ගිණුම් සහ වෙනත් වාර්තාවල විශ්වාසනීයභාවය නිශ්චය කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයේ දැයි සොයා බැලීම.
- කාර්ය මණ්ඩලයට පවරා ඇති වගකීම් ඉටුකිරීමෙහිලා ඔවුන්ගේ කාර්ය සාධනයෙහි ගුණාත්මකතාව ඇගයීම.
- දෙපාර්තමේන්තුවේ වත්කම්, සියළුම ආකාරයේ අලාභ හානිවලින් කොතරම් දුරට ආරක්ෂා කර ඇත්දැයි සොයා බැලීම.
- රජයේ ආයතන සංග්‍රහය, රජයේ මුදල් රෙගුලාසි සහ රාජ්‍ය පරිපාලන විෂයභාර අමාත්‍යාංශය විසින් සහ භාණ්ඩාගාරය විසින් වරින්වර නිකුත් කර ඇති පරිපූරක උපදෙස් ද පිළිපදිනු ලැබේදැයි සොයා බැලීම.
- නාස්තිය, නිස්කාර්ය ධාරිතාව සහ පමණ ඉක්මවා කෙරෙන වියදම් වැළැක්වීමට මෙන්ම අනාවරණය කර ගැනීමට තෝරාගනු ලබන අභ්‍යන්තර පාලන ක්‍රමයේ සාර්ථකත්වය සොයා බැලීම.

- දෙපාර්තමේන්තුවේ ගිණුම් පරිපාටිය සහ කිසියම් මුදල් වැයවීමකට තුඩුදෙන එකී මෙහෙයුම් පරීක්ෂා කිරීම සහ දෙපාර්තමේන්තුවේ දේපළ හා වත්කම් ආරක්ෂාකාරී ලෙස අරපිරිමැස්මෙන් යුතුව විධිමත් ලෙස පරිහරණය කරන්නේදැයි සොයා බැලීම හා අවශ්‍ය අවස්ථාවලදී විශේෂ විමර්ෂණ පැවැත්වීම.
- ශිල්පීය හෝ ගිණුම්කරණ දෘෂ්ටිකෝණයෙන් බාහිරව කළමනාකරණ දෘෂ්ටිකෝණයකින් දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කාර්යයන් පිරික්සා බැලීම සහ ඒ පිළිබඳ වාර්තා කිරීම.
- වැඩ, යෝජනා ක්‍රම සහ ව්‍යාපෘතිවල ප්‍රගතිය සහ ඒ පිළිබඳ වැඩ සටහන් සහ කාල සටහන් කොතෙක් දුරට ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම කෙරෙහි යොමු වී ඇත්දැයි ඇගයීමක් කිරීම.
- වැඩ ක්‍රියාත්මකවීම ප්‍රමාද වීමට තුඩුදෙන ගැටළු ක්ෂේත්‍රයන් පිළිබඳ යාවත්කාලීන ස්ථානික විමර්ෂණ පැවැත්වීම.
- එවැනි මෙහෙයුම් කාර්යයන් අධීක්ෂණය කිරීමෙහිලා භාවිතා කරනු ලබන පාලනයන් ඇගයීම හා සමාලෝචනය කිරීම.

## 2018 වර්ෂය තුළ ඉටු කරන ලද විශේෂිත කාර්යයන්

- ගාල්ල වරාය හා මහනුවර ප්‍රාදේශීය කාර්යාලය අභ්‍යන්තර විගණන පරීක්ෂාව.
- අභ්‍යන්තර විගණන වාර්තා 09ක් ඉදිරිපත් කිරීම.
- 2018 තුන්වන කාර්තුවට අදාල විගණනය ඉදිරිපත් කිරීම.
- 2018 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 06 ක් පැවැත්වීම.
- 2018 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු අතුරු සාකච්ඡා 03 ක් පැවැත්වීම.
- බඩු වට්ටෝරු ලේඛන යාවත්කාලීන කර පවත්වාගෙන යාම, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය හා භාණ්ඩ අපහරණය කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2017(i) නිකුත් කිරීම.

## 2018 වර්ෂයේ ඉලක්ක හා ප්‍රගතිය.

- 2018 වර්ෂයේ අපේක්ෂිත කාර්යයන්ගෙන් 75% ක පමණ කාර්යයක් අවසන් කිරීමට හැකි විය.

## 2019 වර්ෂයේ සිදු කිරීමට අපේක්ෂිත කාර්යයන්

- විගණන සැලැස්මට අනුව කටයුතු කිරීම.
- රජයේ වාහන පාලනය හා කළමනාකරණය සම්බන්ධයෙන් චක්‍රලේඛයක් නිකුත් කිරීමට කටයුතු කිරීම

# 09. සුභසාධන කටයුතු

ආගමන හා විගමන දෙපාර්තමේන්තු සුභසාධක සංගමය, සාමාජිකයින්ගේ  මෙන්ම ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ ද, දෙපාර්තමේන්තුවෙන් සේවා ලබා ගැනීමට පැමිණෙන මහජනතාවගේ හා බාහිර සමාජයේ ද සුබසිද්ධිය උදෙසා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. මේ තුළින් කායික හා මානසික නිරෝගිමත් මෙන්ම තෘප්තිමත් සේවක පිරිසක් බිහි කිරීම මගින් මහජනතාවට ගුණාත්මක සේවාවක් ලබා දීම සුභසාධක සංගමයේ අරමුණයි.

## සුභසාධක සංගමය විසින් 2018 වර්ෂයේදී සිදුකරන ලද කාර්යයන්

01. නව අවුරුදු උදාව සමඟ ඵලදායී හා කාර්යක්ෂම සේවයක් ඉටුකළ නිලධාරීන් ඇගයීමට සම්මාන ප්‍රදානය කිරීමේ උත්සවය වාර්ෂිකව පැවැත්වෙන අතර, මෙවර ද එම උත්සවය අති උත්කර්ෂවත් ලෙස පැවැත්විනි.

02. සාමාජික සාමාජිකාවන්ගේ උපන්දිනය නිමිති කර ලබාදෙන විශේෂ තිළිණය මෙම වසරේ ද ලබාදීමට කටයුතු කරන ලදී. රු 1500ක් පමණ වටිනා තිළිණයක් ඒ වෙනුවෙන් ලබා දුනි.

03. පාසල් යන දූවා දරුවන් වෙනුවෙන් අභ්‍යාස පොත් කට්ටල ලබා දීම.

04. “සූර්ය මංගල්‍යය” සිංහල අලුත් අවුරුදු උත්සවය කාර්යය මණ්ඩලය හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ ද සහභාගීත්වයෙන් බත්තරමුල්ල බුද්ධදාස ක්‍රීඩාංගනයේ දී ඉතා උත්කර්ශවත් අන්දමින් පවත්වන ලදී. මෙවර ආගමන හා විගමන කුමරා හා කුමරිය තේරීම සිංහල අලුත් අවුරුදු උත්සවයේ විශේෂ අංගයක් විය.



05. සාමාජිකයින් හට සංගමය මගින් ලබාදෙන සහන ණය මුදල රු. 30,000.00 සිට 50,000.00 දක්වා වැඩි කිරීම.

| සාමාජික ණය ලබා දීමේ සාරාංශය | | | |
|---|---|---|---|
| මාසය | වර්ෂය | | |
| | 2018 | 2017 | 2016 |
| ජනවාරි | 930,000.00 | 1,100,000.00 | 570,000.00 |
| පෙබරවාරි | 660,000.00 | 890,000.00 | 660,000.00 |
| මාර්තු | 2,650,000.00 | 1,300,000.00 | 1,020,000.00 |
| අප්‍රේල් | 1,840,000.00 | 920,000.00 | 960,000.00 |
| මැයි | 1,160,000.00 | 1,060,000.00 | 840,000.00 |
| ජූනි | 1,040,000.00 | 630,000.00 | 860,000.00 |
| ජූලි | 760,000.00 | 900,000.00 | 860,000.00 |
| අගෝස්තු | 730,000.00 | 710,000.00 | 300,000.00 |
| සැප්තැම්බර් | 1,355,000.00 | 520,000.00 | 790,000.00 |
| ඔක්තෝබර් | 990,000.00 | 710,000.00 | 450,000.00 |
| නොවැම්බර් | 1,830,000.00 | 380,000.00 | 750,000.00 |
| දෙසැම්බර් | 760,000.00 | 805,000.00 | 1,140,000.00 |
| **එකතුව** | **14,705,000.00** | **9,925,000.00** | **9,200,000.00** |



06. වෙසක් උත්සවය වෙනුවෙන් සුහුරුපාය ගොඩනැගිල්ල ආලෝකමත් කිරීම සහ සැරසිලි කටයුතු සඳහා දායකත්වය සැපයීම. දර්ශනීය පහන් කූඩුවක් "සුහුරුපාය" ඉදිරිපස නිර්මාණය කිරීම. බත්තරමුල්ල එක්සත් නාගරික ප්‍රජා සංවර්ධන සංසදය මගින් සංවිධානය කරන ලද ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ පැවැති වෙසක් කලාපය සඳහා ද දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් දර්ශනීය වෙසක් කූඩුවක් ප්‍රදර්ශනය කරන ලදී.



07. දෙපාර්තමේන්තු කාර්යය මණ්ඩලයේ විනෝදාස්වාදය වැඩි දියුණු කිරීම උදෙසා චීන ගුවන් විදුලිය හා සම්බන්ධව ගීත ගායනා තරගයක් පැවැත්වීම හා එම වැඩසටහන සති කිහිපයක් විකාශය කිරීමට කටයුතු කිරීම

08. සුබසාධක සංගමයේ පුස්තකාලය සඳහා 2018 වර්ෂය සඳහා රු. 359,657.00 මුදලක් වැය කර පොත්පත් මිලට ගැනීම.

09. සෞඛ්‍ය අමාත්‍යාංශයේ බෝනොවන රෝග අංශයේ සහයෝගයෙන් බෝ නොවන රෝග හඳුනාගැනීමේ සෞඛ්‍ය කඳවුරක් පවත්වන ලදී. මෙහිදී දියවැඩියාව, අධි රුධිර පීඩනය, වකුගඩු රෝග, අක්මා රෝග, පිළිකා හඳුනාගැනීමේ පරීක්ෂණ හා දන්ත සායනයක් ද විශේෂඥ වෛද්‍යවරුන්ගේ සහභාගීත්වයෙන් පැවැත්වීම.

10. දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය සඳහා සය සාමාජික ක්‍රිකට් තරගාවලියක් කටුනායක ඇවරිවත්ත ක්‍රීඩාංගණයේදී උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදී. එහිදී සෑම කණ්ඩායමක් සඳහාම ටී ෂර්ට් නොමිලේ ලබාදුන් අතර, ශූරතා කුසලානය සමඟ ජයග්‍රාහී කණ්ඩායම්වලට මුදල් ත්‍යාග පිරිනැමීම සිදුකරන ලදී.

11. මහනුවර උඩුදුම්බර නිසල ජාත්‍යන්තර භාවනා මධ්‍යස්ථානයේ කම්මට්ඨානාචාර්ය පී. විජේනායක මහතාගේ සහභාගීත්වයෙන් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ මානසික සුවය පිණිස භාවනා වැඩසටහනක් දෙපාර්තමේන්තුවේදී මාසිකව සංවිධානය කිරීම



12. රාජ්‍ය සේවා ක්‍රිකට් සංගමය මගින් සංවිධානය කරන ලද ක්‍රිකට් තරගාවලිය සඳහා දෙපාර්තමේන්තු ක්‍රිකට් කණ්ඩායම සහභාගී කරවීම.

13. දෙපාර්තමේන්තු කාර්යය මණ්ඩලයේ බැඩ්මින්ටන් පුහුණුවීම් වෙනුවෙන් සිමන්ත්‍රා ගෘහස්ථ ක්‍රීඩාංගණය සෑම සඳුදා දිනකම සවස් වරුව වෙන් කිරීමට කටයුතු කිරීම.

14. දෙපාර්තමේන්තු කාර්යය මණ්ඩලය සඳහා බැඩ්මින්ටන් තරගාවලියක් සංවිධානය කිරීම හා රාජ්‍ය සේවා බැඩ්මින්ටන් තරඟාවලිය සඳහා ද එම කණ්ඩායම සහභාගී කරවීම.

15. කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් හට සෞඛ්‍ය ආරක්ෂිතව ජලය සැපයීම සඳහා ඉතා උසස් තත්වයේ ජල පෙරණ 06ක් සැපයීම. සියලු සාමාජිකයින්ගේ ප්‍රයෝජනය සඳහා කෝප්ප ලබාදීම.

16. විශ්‍රාම ලැබූ සාමාජික සාමාජිකාවන්ට සමරු ඵලකයට අමතරව රු. 10,000/- ක් හා රු. 25,000/- ක් බැගින් වූ මූල්‍ය ඇගයීම් ලබාදීම.

17. සේවාලාභී ජනතාවගේ ප්‍රයෝජනයට රූපවාහිනී යන්ත්‍ර සවි කිරීම.

18. ඵලදායීතා වැඩසටහනට සමගාමීව දෙපාර්තමේන්තුවේ සියලුම මහල් සඳහා මල් පෝච්චි හා මල් පැල ස්ථානගත කර, එය මනාව පවත්වාගැනීම සඳහා සෑම මසකම සේවකයින් දෙදෙනෙකුගේ සේවය ලබා ගැනීම.



19. ප්‍රාදේශීය කාර්යාල, තොටුපල කාර්යාල හා විවේකාගාරවල සේවය කරන නිලධාරීන්ගේ පහසුව සඳහා රූපවාහිනී යන්ත්‍ර, අයන් ටේබල්, ගෘහ විදුලි උපකරණ හා ගෑස් මාසිකව ලබාදීම.

20. සේවාලාභී මහජනතාව රැඳී සිටින පියස පරිශ්‍රය මහජන අවශ්‍යතාවයන් සපිරෙන පරිදි පෞද්ගලික අංශයේ ආධාර ඇතිව නවීකරණ කටයුතු සිදු කිරීම.



21. සාමාජිකයන්ගේ විවාහයකදී හා සෑම සජීවී දරු උපතකදීම තිළිණයක් ලබාදීමට කටයුතු ආරම්භ කිරීම

22. ශරීර සුවතා මධ්‍යස්ථානය භාවිතා කරන සාමාජිකයින්ගේ පහසුව සඳහා නවීන යන්ත්‍ර සූත්‍ර පහසුකම් ලබාදීම.

23. අවමංගලයාධාර ගෙවීම් හා අවමංගල උත්සව සඳහා ප්‍රවාහන වියදම් දැරීම.

| **අවමංගලයාධාර ගෙවීම් සාරාංශය** | | | | | |
|---|---|---|---|---|---|
| **මාසය** | **වර්ෂය** | | | | |
| | **2018** | **2017** | **2016** | **2015** | **2014** |
| ජනවාරි | 460,000.00 | 300,000.00 | 320,000.00 | 200,000.00 | 380,000.00 |
| පෙබරවාරි | 320,000.00 | 240,000.00 | 300,000.00 | 200,000.00 | 140,000.00 |
| මාර්තු | 300,000.00 | 580,000.00 | 300,000.00 | 400,000.00 | 140,000.00 |
| අප්‍රේල් | 280,000.00 | 260,000.00 | 240,000.00 | 260,000.00 | 160,000.00 |
| මැයි | 160,000.00 | 300,000.00 | 280,000.00 | 340,000.00 | 240,000.00 |
| ජූනි | 300,000.00 | 160,000.00 | 480,000.00 | 320,000.00 | 260,000.00 |
| ජූලි | 120,000.00 | 200,000.00 | 200,000.00 | 460,000.00 | 240,000.00 |
| අගෝස්තු | 200,000.00 | 240,000.00 | 160,000.00 | 160,000.00 | 120,000.00 |
| සැප්තැම්බර් | 440,000.00 | 400,000.00 | 220,000.00 | 320,000.00 | 380,000.00 |
| ඔක්තෝබර් | 320,000.00 | 120,000.00 | 340,000.00 | 80,000.00 | 200,000.00 |
| නොවැම්බර් | 160,000.00 | 380,000.00 | 120,000.00 | 120,000.00 | 240,000.00 |
| දෙසැම්බර් | 280,000.00 | 420,000.00 | 160,000.00 | 300,000.00 | 320,000.00 |
| වර්ෂය තුළ අවමංගල උත්සව සඳහා දරන ලද මුළු ප්‍රවාහන වියදම | 115,180.00 | 226,662.00 | 317,390.00 | 301,818.00 | 451,593.00 |
| **අවමංගලයයන් සඳහා දරන ලද මුළු වියදම** | **3,455,180.00** | **3,826,662.00** | **3,437,390.00** | **3,461,818.00** | **3,271,593.00** |

24. සාමාජික සැමගේ යහපත උදෙසා ගුණාත්මක බවෙන් යුක්ත මෙන්ම ආර්ථික වශයෙන් සහනදායී මිලට ආහාර ආපනශාලා සේවය තුළින් අඛණ්ඩව ලබාදීම.

25. සාමාජික, සාමාජිකාවන්ගේ පහසුව උදෙසා අවමංගල්‍ය හා මංගල්‍ය කටයුතුවල දී ප්‍රවාහන පහසුකම් හැකි උපරිම ආකාරයෙන් ලබාදීමට කටයුතු කිරීම.

26. සාමාජික සාමාජිකාවන්ට සහන මිලට ආහාර පාන, විදුලි භාණ්ඩ, ඇඳුම් පැළඳුම් මිලට ගැනීම සඳහා විශේෂ අලෙවි සල් සංවිධානය කිරීම.

27. හදිසි උවදුරුවලට ලක්වන සාමාජික සාමාජිකාවන්ගේ ජීවන තත්වය නඟා සිටුවීමට උපරිම වශයෙන් මැදිහත්ව සහන සැපයීම. (ගංවතුර, නායයෑම් ආදී)

28. නත්තල් උත්සවය වෙනුවෙන් වාර්ෂිකව සංවිධානය කරන "බිළිඳු හදට නත්තලක්" වැඩසටහන මෙවරද පවත්වන ලද අතර, එහිදී එක් එක් මීසම්වලින් කැඳවන ලද ළමුන් 50 දෙනෙකු සඳහා ද්‍රව්‍යමය ආහාර, පාසල් උපකරණ හා පාවහන් ආදිය ලබා දීම සිදුකරනු ලැබීය. මෙම වර්ෂයේදී නලින් පෙරේරා ප්‍රමුඛ මේරියන්ස් සංගීත කණ්ඩායම කැරොල් ගී ගායනයෙන් දායකත්වය ලබාදෙන ලදී. මෙම උත්සවය සඳහා දෙපාර්තමේන්තුවේ සාමාජිකයින්ගේ දූවා දරුවන් විශාල ප්‍රමාණයක් සහභාගී වූ අතර, ඔවුන්ටද විවිධ ත්‍යාග ලබාදෙන ලදී.




29. නිලධාරීන්ගේ පාසල් යන දූවාදරුවන් වෙනුවෙන් වාර්ෂිකව ලබාදෙන අභ්‍යාස පොත් කට්ටල ලබාදීම සිදුකරන ලදී.




30. කාර්ය මණ්ඩලයේ හා සේවාලාභී ජනතාවගේ සංස්කෘතිමය, පාරිසරික දැනුම වර්ධනයට අදාළ දේශන මහජන ඇමතුම් පද්ධතිය මගින්, සෑම බ්‍රහස්පතින්දාම උදෑසන ප්‍රචාරය කිරීමට කටයුතු කිරීම. මේ සඳහා සම්පත් දායකත්වය කොළඹ විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය පද්මපෙරුම මහතා ලබා දෙයි.

31. 2018 වර්ෂ අවසානය වෙනුවෙන් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා දිවා ආහාරය සපයන ලදී. ඒ අනුව ප්‍රධාන කාර්යාලය ප්‍රමුඛව සියලුම ප්‍රාදේශීය කාර්යාල, ගුවන් තොටුපල, වරායන්හි කාර්ය මණ්ඩලය සඳහා වර්ෂ අවසානයේ දිවා භෝජනය සැපයීම.

32. ජාතික ඵලදායීතා වැඩසටහනට සමගාමීව දෙපාර්තමේන්තු අංශ අතර පැවැති ඵලදායීතා තරගාවලියෙන් ප්‍රථම ස්ථානය සුබසාධක සංගමය දිනාගැනීම.

# සේවා පියස

ගමන් බලපත් ලබා ගැනීම ඇතුළු දෙපාර්තමේන්තුව මගින් සැපයෙන විවිධ සේවාවන් ලබා ගැනීම සඳහා දිනකට 5000 කට ආසන්න සංඛ්‍යාවක් පැමිණෙන අතර සේවාලාභීන් සමඟ ඔවුන්ගේ සහයට පැමිණෙන අයට සේවාලාභියාගේ අවශ්‍යතාවයන් නිම වන තෙක් රැඳී සිටීමට සියළු පහසුකම් සහිතව “සේවා පියස” නමින් ප්‍රධාන කාර්යාලයට අනුබද්ධව පවතින ගොඩනැගිල්ලේ බිම් මහලේ ස්ථානයක් ප්‍රියමනාප අන්දමින් සකස් කර ඇත. මෙම ස්ථානයේදී  තම සේවා අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා අවශ්‍ය මගපෙන්වීම මෙන්ම අයදුම්පත් නිකුත් කිරීම හා පිරවීම, ඡායාරූප සේවා, ඡායා පිටපත් සේවා, කුරියර් සේවා,මෙන්ම අවශ්‍ය අනෙකුත් සේවා පහසුකම් (දුරකථන, බැංකු, කෙටි ආහාර ලබා ගැනීමට ) ද මහජනතාවට සපයා ඇත.

